වාර්ෂික කාර්යසාධන වාර්තාව



2022

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුත, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

කාර්යසාධන වාර්තාව-2022

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වන 130 ට අදාළ සමස්ථ මූල්‍ය වාර්තාව රාජ්‍ය පරිපාලන අංශයෙහි පිටු අංක **28-35** යටතේ ඇතුළත් කර ඇත.

	රාජ්‍ය පරිපාලන අංශය	ස්වදේශ කටයුතු අංශය	පළාත් සභා හා පළාත් පාලන අංශය
	නිදහස් චතුරස්‍රය කොළඹ 07 ශ්‍රී ලංකාව	“නිල මැදුර” ඇල්විටිගල මාවත නාරාහේන්පිට කොළඹ 05 ශ්‍රී ලංකාව	අංක 330 ආචාර්ය ද කොල්වින් ආර්.ද සිල්වා මාවත (යූනියන් පෙදෙස) කොළඹ 02 ශ්‍රී ලංකාව
	011-2696211/13, 011- 2166000	011 - 2050450	011 – 2 305326 / 327, 2303280
	011–2695279	011 - 2551071	011 - 2 699 720
	information@pubad.gov.lk	info@moha.gov.lk	info@pclg.gov.lk
	www.pubad.gov.lk	www.moha.gov.lk	www.mpclg.gov.lk

ගරු අමාත්‍යතුමාගේ සුභාශිංසනය



2022 වර්ෂය අභියෝග රාශියක් හමුවේ රටක් ලෙස ඉතිහාසයේ දැවැන්තම ආර්ථික අර්බුදයට මුහුණ දෙමින් රාජ්‍ය පාලනයේ වෙනස් වීම් හමුවේ පවා ජන ජීවිතය යථාවත් කෙරුම වෙනුවෙන් අනවරත උත්සාහයක නිරත වූ වසරක් ලෙස හඳුන්වා දිය හැකිය.ඒ අනුව දැවැන්ත සමාජ ප්‍රශ්න රාශියකට පිළිතුරු සොයන්නට රජයක් ලෙස අමිහිරි වුවද ගත යුතු නිවැරදි තීන්දු ගනිමින් කටයුතු කල වසරක් ලෙස ගෙවුණු වසර හඳුන්වා දීම යුක්තිසහගතය.එකී තීරණයන්හී යහපත් ප්‍රතිඵල අද වන විට රටක් ලෙස අප සැම අත් විඳිමින් සිටියි.

මෙම අභියෝගාත්මක ඉලක්කය සඵල කරගනු වස් අප ද ග්‍රාමීය පුනර්ජීවන හා ආහාර සුරක්ෂිතාවය සඳහා වන ඒකාබද්ධ බහු ආංශික වැඩසටහන සාර්ථක ව ක්‍රියාත්මක කරමින් මේ අභියෝගාත්මක මොහොතේ ස්වකීය වගකීම් රාමුවෙන් එහා ගොස් මහා ජාතික මෙහෙවරක් ඉටුකල බව විෂය භාර අමාත්‍යවරයා ලෙස සතුටින් සඳහන් කරනු ලැබේ. මෙහි එක් ප්‍රතිඵලයක් වශයෙන් මෙවර මහ කන්නයේ වී අස්වැන්න සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගිය බව සිහිපත් කරනු කැමැත්තෙමි.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ලෙස දැවැන්ත වපසරියකට විහිදී ගිය අමාත්‍යාංශයේ කාර්ය භාරය පහසු කරනු වස් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය ,පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය ලෙසින් රාජ්‍ය අමාත්‍යාංශ දෙකක් අපට හිමි වීමද මහජන මෙහෙවර පහසු කෙරුම උදෙසා ලද අවස්තාවක් ලෙස සැලකිය හැකි ය. අප අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය, රාජ්‍ය භාෂා කොමිෂම, භාෂා අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ ජාතික ආයතනය, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව, දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය සහ රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය යන ආයතන පසුගිය වසර පුරා සිය සේවා වගකීම් උපරිම මට්ටමෙන් ඉටුකිරීමෙහිලා දැක්වූ දායකත්වය මේ මොහොතේ කෘතවේදීව සිහිපත්කළ යුතුය.

කුමන අභියෝග පැවතියද අඛණ්ඩ හා ගුණාත්මක රාජ්‍ය සේවාවක් පවත්වාගෙන යාම වෙනුවෙන් වන උසස්වීම් ක්‍රම වේදය ගෙවුණු 2022 වසර තුලදී ද අප අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ අතර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් ක්‍රියාත්ම ධාරිතා සංවර්ධන වැඩසටහන් හි කැපී පෙනෙන වර්ධනයක්ද පෙන්නුම් කරන ලදී. රාජ්‍ය සේවයේ සේවකයන් සඳහා දේශීය මෙන්ම විදේශීය රැකියා අවස්ථා වලට යාමේ අවස්ථාව සලසා දීම ද විශේෂ ය. එසේම ප්‍රාදේශීය පාලනය ශක්තිමත් කිරීම සඳහා වන්නාවූ විවිධ වැඩසටහන් මෙන්ම පළාත් පාලන ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමද අඛණ්ඩව සිදුකරන ලද වසරක් ලෙස ගෙවුණු වසර හඳුන්වා දිය හැක.

එම කාර්යයෙහිලා කැපවී ක්‍රියා කරන මෙම අමාත්‍යාංශයේ ගරු රාජ්‍ය අමාත්‍යවරුන් දෙදෙනාටත් ලේකම්තුමා ප්‍රමුඛ නිලධාරී මණ්ඩලයටත්, අනෙකුත් සියලුම ආයතන ප්‍රධානීන්ට හා සමස්ථ කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය හා ප්‍රණාමය පුද කරමි.

දිනේෂ් ගුණවර්ධන,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය,
රාජ්‍ය පරිපාලන , ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය

ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය



මෙම අමාත්‍යාංශය 2021.02.16 දින සිට ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය ලෙස තනි ඒකකයක් වශයෙන් ක්‍රියාත්මක විය. 2022 මැයි 27 දින සිට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වශයෙන් වෙනස් වූ මෙම අමාත්‍යාංශය ඒ යටතේ වර්තමානයේ දී ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වශයෙන් සිය කාර්යභාරය ඉටුකරනු ලබයි.

රජයේ නව ව්‍යවස්ථා සංශෝධනය අනුව දිස්ත්‍රික් හා ප්‍රාදේශිය පාලනය වඩාත් කාර්යක්ෂම හා ඵලදායිව ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික සැලසුම් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අදාල ප්‍රධානතම වගකීම මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇත. ඒ අනුව මෙම අමාත්‍යාංශය ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා යටිතල පහසුකම් සංවර්ධනය, මානව සම්පත් ධාරිතාවය ශක්තිමත් කිරීම, තාක්ෂණික මෙවලම් ලබාදීම වැනි කාර්යයන් මනාව කළමනාකරණය කරමින් කාර්යක්ෂමව සහ ඵලදායීව මහජන සේවාවන් ලබාදීම සිදුකරනු ලබයි. කෙසේ වුවද, මේ ඔබට ඉදිරිපත් කරනු ලබන්නේ 2022 වර්ෂය සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ කාර්යසාධනය පිළිබඳ වාර්තාවයි.

වත්මන් ලෝකයෙහි පැතිර පවතින කොවිඩ් වසංගත තත්ත්වය හා ජාත්‍යන්තර වශයෙන් පවතින ආර්ථික අර්බුදයට මුහුණ දෙමින්, රටක් ලෙස එයට අනුගත වෙමින් එවකට පැවති රාජ්‍ය අමාත්‍යාංශය විසින් සාක්ෂාත් කරගත් සංවර්ධන ප්‍රගතිය සහ කාර්යසාධනය පිළිබඳව මෙම වාර්තාව තුළින් පෙන්වා දෙනු ලබයි.

අප රජය බලයට පැමිණීමට පෙර සිටම ජනතාවගේ ඉල්ලීම මෙන්ම අභිලාශය වූයේ ද මනා විනිවිදභාවයකින් යුතු රාජ්‍ය පාලනයකි. ඒ සඳහා රාජ්‍ය සේවකයාගේ වගකීම ඉතා වැදගත් වේ. ඒ අනුව, වගකීමෙන් හා වගවීමෙන් යුතුව සක්‍රීය පාලනයකින් යුත් රටක් නිර්මාණය කිරීමට මෙම අමාත්‍යාංශය මඟින් නියාමනය කරන ලද රාජ්‍ය සේවක යාන්ත්‍රණය තුළ ළඟාකරගත් කාර්යසාධනය ඉතාමත් වැදගත් තැනක් උසුලයි.

ජාතික හා දිස්ත්‍රික් මට්ටමේ ඒකාබද්ධ කාර්යභාරය ඉටුකිරීමට අදාල සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයක් ලෙස මෙම වාර්තාව ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි. එසේම මේ පිළිබඳව විශ්ලේෂණාත්මකව බැලීමේදී අදාල කාලය තුල ලබාගෙන ඇති කාර්යසාධනය ජනතා ජයග්‍රහණයක් ලෙස පෙන්වාදෙන්නේ සතුටිනි. පසුගිය වසර තුලදී මෙන්ම ඉදිරි වර්ෂවලදී ද විශිෂ්ට ප්‍රගතියක් ලබා ගනිමින් අනාගතය තුළ ශ්‍රී ලාංකික ජනතාවට තම ජීවිකාව සරිකර ගැනීමේදි මුහුණ දී තිබෙන අභියෝගයන් ජයගනිමින් සෞභාග්‍යමත් දේශයක් ගොඩනංවා ගැනීමට සැමගේ අවධානය යොමු කළයුතු බව ද මේ අවස්ථාවේ සිහිපත් කරන්නට කැමැත්තෙමි.

අශෝක ප්‍රියන්ත (පා.ම.)
ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය

පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාතුමාගේ පණිවුඩය



මහජනතාවට සිය ජීවිත කාලය තුළ පවත්නා අත්‍යවශ්‍ය සේවා සැපයීම මෙන්ම ජීවන තත්වය ඉහළ නැංවීමේ අරමුණින් සියළු පළාත් පාලන ආයතන වෙත සුවිශේෂී කාර්යභාර්යයක් පැවරෙන බව අප පිළිගත යුත්තකි.

එසේ මහජනතාවට සේවය සලසන අතරම පළාත් පාලන ආයතනවලටද ආදායමක් හා වත්කමක් යන තේමාව ක්‍රියාත්මක විය යුතුය යන්න මගේ අදහසයි.

කොටිඨාස ක්‍රමය යටතේ පළාත් පාලන ආයතනවලට තේරී පත්වී සිටින පළාත් පාලන නියෝජිත මහත්ම මහත්මීන් ජනතාවගේ ගැටලු හඳුනා ගැනීම සඳහා මඟ පෙන්වීම පිළිබඳව අපගේ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මඟින් අවශ්‍ය කටයුතු සිදුකරමින් තිබීම සතුටට කරුණකි.

සියලු පළාත් පාලන ආයතන සඳහා ඉදිරි වර්ෂයේදී කෙටි කාලීන හා මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මක් සකස් කිරීමටත් අනෙකුත් අමාත්‍යාංශ මඟින් සිදුකරන කාර්යයන්ද පළාත් පාලන ආයතන මඟින් සිදුකිරීම සඳහා පළාත් පාලන ආයතන බලගන්වා ප්‍රදේශ තුළ පවතින අවශ්‍යතා බොහෝදුරට සිදුකරගත හැකි වන පරිදි ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

අප අමාත්‍යාශය යටතේ විදේශ අරමුදල් ව්‍යාපෘති ගණනාවක් පාලනය වන බැවින් එයින් 100% ක ප්‍රතිලාභයක් ජනතාවට ලබාදීම මාගේ අභිප්‍රායයි. දැනට සකස් කර ඇති සැළසුම් තවදුරටත් සොයා බලමින් පුළුල් සමාලෝචනයක් මඟින් ජනතාවගේ අත්‍යවශ්‍ය සේවා සැපයීම හා ජීවන තත්වය ඉහළ නැංවීමට අවශ්‍ය වැඩපිළිවෙළක් ඉදිරි වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීම අපගේ වගකීමයි. පළාත් පාලන ආයතන මඟින් සිදුකෙරෙන කසළ ඉවත් කිරීමේ කටයුත්ත ක්‍රමවත් කරමින් කසළ වලින් තොර පරිසරයක් හා කසළ කළමණාකරණය සිදුකිරීම තවදුරටත් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතන සියල්ල තදබල ලෙස යොමු කිරීම මාගේ අභිප්‍රායයි. පළාත් පාලන ආයතන තුළ සිදුකෙරෙන ලිඛිත කටයුතු සියල්ල ඩිජිටල්කරණය තුළින් වඩාත් කාර්යක්ෂම සේවයක් සැපයීමට හැකිවන හෙයින් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය ඒකාබද්ධව අප අමාත්‍යාංශයේ පූර්ණ මැදිහත්වීම යටතේ පළාත් පාලන ආයතන 100 ක් පළමු අදියර සඳහා ඩිජිටල් කරණය කිරීමට කටයුතු කරනු ඇත.

පළාත් පාලන ආයතනවල ප්‍රබල අඩුපාඩුවක්ව පවතින ගිනි නිවීමේ ඒකක පිහිටුවීම අදියරෙන් අදියර ඉටුකිරීම සඳහා ඉදිරියේදී එම ඒකකයන් ඒකාබද්ධ කර ගිනි නිවීමේ සේවා දෙපාර්තමේන්තුවක් අප අමාත්‍යාංශය යටතේ පිහිටුවීමට යෝජිත බැවින් ඒ සඳහා ද මාගේ දැඩි අවධානය යොමු වී තිබේ. පළාත් පාලන පනතේ පවතින විධිවිධානවලට යටත්ව පෙරපාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන වර්තමානයට ගැලපෙන පරිදි සංවර්ධනය කිරීම පළාත් පාලන ආයතන මඟින් සිදුකිරීමටත්, පළාත් පාලන ආයතන සහ ආගමික ස්ථාන අතර සහජීවනය වැඩි දියුණු කිරීමටත් අවශ්‍ය කටයුතු සිදුකිරීමද දැඩි අවශ්‍යතාවයකි.

ජනතාවගේ ජීවනෝපාය මෙන්ම පළාත් පාලන ආයතනවල ආදායම වැඩිකිරීමට නිෂ්පාදන ගම්මාන වැඩසටහන, ක්‍රියාත්මක කිරීමටත්, පුද්ගලික,මහජන, රාජ්‍ය සම්බන්ධතාවය ගොඩනංවා අප අමාත්‍යාංශයේ සියළුම කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්තුමන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය මා වෙත ලබා දෙනු ලබන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ජානක වක්කුඹුර

පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍ය

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය



දීපව්‍යාප්ත සේවා සහ ඒකාබද්ධ සේවා ඇතුලු සමස්ත රාජ්‍ය සේවාවන් හී පූර්ණ ධාරිතා සංවර්ධනයක් ඇති කරමින් නවීන තාක්ෂණික ක්‍රමෝපායන් උපයෝගී කරගෙන පොදු ජනතාව වෙත ප්‍රශස්ත සේවාවක් ජාතික, පළාත්, ප්‍රාදේශීය සහ පළාත් පාලන ආයතන හරහා ලබා දීමට කටයුතු කිරීම මෙම අමාත්‍යාංශයේ ප්‍රමුඛතම කාර්යය වේ. නමුත් පසුගිය වර්ෂ කිහිපය තුළ පැවති කොවිඩ් 19 ගෝලීය වසංගතය හමුවේ ලෝකයේ සෑම රටක්ම මෙන්ම ශ්‍රී ලංකාවේ ද රාජ්‍ය හා පෞද්ගලික සෑම අංශයකම තදබල පසුබෑමක් සිදු වූ බව නොරහසකි. එහි දිගුවක් වශයෙන් අපනයනය දුර්වල වීම, ඩොලර් සංචිතය හිඟවීම, රුපියල අවප්‍රමාණය වීම, උද්ධමනයේ වැඩිවීම, ඉදිකිරීම් ක්ෂේත්‍රය කඩාවැටීම, රැකියා අහිමි වීම, බදවාගැනීම් සීමා කිරීම වැනි අභියෝගයන්ට මුහුණදීමට රජයට සිදු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රාග්ධන වියදම් හා රාජ්‍ය වියදම් කප්පාදුකොට දැඩි මූල්‍ය කළමනාකරණයකට යෑමට රජයට සිදුවිය. එවැනි ප්‍රතිපත්ති රාමුවක් තුළ මෙම අමාත්‍යාංශයේ මෙහෙවර රාජ්‍ය ප්‍රතිපත්තීන් අනුව ප්‍රමුඛතාවය මත පෙළගන්වා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් 2022 වර්ෂය තුළ දී සිදුකරන ලදී.

ඒ අනුව රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩසටහන් යටතේ පළාත් පාලන ආයතන වල සංවර්ධන ව්‍යාපෘති, ග්‍රාමීය භෞතික යටිතල පහසුකම් හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ විශ්‍රාම වැටුප් අඛණ්ඩව ගෙවීම, ඔවුන්ගේ ආර්ථික හා සුබසාධනය වැඩිදියුණු කිරීම, පාර්ලිමේන්තුව සම්බන්ධව හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතු වලට අදාළව රජය විසින් ඉටුකල යුතු කාර්යයන් ඉටුකිරීම, දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ජනතා සුබසාධනයට අදාළ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම, නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, කරන ලද ප්‍රමුඛතම කාර්යභාරයන්ගෙන් කොටසක් ලෙස සඳහන් කල හැකිය. එසේම 2022 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය විසින් වෙන් කරන ලද ප්‍රතිපාදන හා අරමුදල් ඵලදායීව හා කාර්යක්ෂම වර්ෂයේ අපේක්ෂිත ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම පිණිස යොදවා ඇති බවද මෙහිදී සඳහන් කිරීමට කැමැත්තෙමි.

මෙම අමාත්‍යාංශයේ ඉහත කාර්යයභාරය සාර්ථකව ඉටු කිරීමට උපදෙස් හා මඟපෙන්වීමක් කරන ලද ගරු අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාටත්, රාජ්‍ය අමාත්‍යතුමන්ලා දෙපළටත් මාගේ ස්තුතිය මෙහිදී පළකර සිටිමි. එසේම පැවරී ඇති කාර්යභාරය සාර්ථකව හා කාර්යක්ෂම ඉටුකිරීමට ඇපකැප වූ අතිරේක ලේකම්වරු, අධ්‍යක්ෂ ජනරාල්වරු, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරු, අධ්‍යක්ෂවරු, ප්‍රධාන මූල්‍ය නිලධාරීන් ඇතුලු සමස්ත කාර්යමණ්ඩලයටත්, මෙම අමාත්‍යාංශය යටතේ පවත්නා, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් ඇතුලු කාර්ය මණ්ඩලවලටත් මාගේ ස්තුතිය පුදකරන අතර ඉදිරි කටයුතු සාර්ථකව ඉටුකරගෙන යාමට ඔබගේ කැපවීම හා දායකත්වය තවදුරටත් අපේක්ෂා කරමින් 2022 වර්ෂයේ වාර්ෂික කාර්යය සාධන වාර්තාව හා ගිණුම් වාර්තාවට මාගේ සුභපැතුම් එක් කරමි.

කේ.ඩී.එන්. රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

රාජ්‍ය පරිපාලන අංශය

පටුන

01	**ආයතනික පැතිකඩ**	
1.1	හැදින්වීම	1
1.2	දැක්ම, මෙහෙවර, අරමුණු, උපායමාර්ග	2
1.3	ප්‍රධාන කාර්යයන්	4
1.4	සංවිධාන ව්‍යුහය	5
1.5	අමාත්‍යාංශය යටතේ ඇති ආයතන	6
02	**ප්‍රගතිය සහ ඉදිරි දැක්ම**	
2.1	2022 වසරේ වැදගත් සිදුවීම්	7-27
03	**වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්යසාධනය**	
3.1	මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය	28
3.2	අක්මුදල් ගැලපුම් ගිණුම	29
3.3	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	30
3.4	මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය	31
3.5	මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	32
3.6	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	33
3.7	ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	34
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	35
3.9	විගණකාධිපති වාර්තාව (කාර්යසාධන වාර්තාවේ අවසානයට අමුණා ඇත.)	
04	**කාර්ය සාධන දර්ශක**	
4.1	ක්‍රියාකාරී සැලැස්ම මූලික කරගත් ආයතනික කාර්ය සාධන දර්ශක	36
05	**මානව සම්පත් සැලැස්ම**	
5.1	අනුමත සේවක සංඛ්‍යාව 2022	37-41
5.2	කාර්ය මණ්ඩලයේ හැකියා සංවර්ධනය	42-46
07	**අනුකූලතා වාර්තාව**	47-52

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

හැඳින්වීම

වර්ෂ 2022ක් වූ ජූලි මස 22 වන දින සිට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වශයෙන් නම් කරනු ලදුව ආරම්භයේ පටන් වර්තමානය දක්වා සියළු රාජ්‍ය ආයතන හා රාජ්‍ය සේවකයන්ගේ අභිවෘද්ධිය උදෙසා සුපසන් සේවා සම්පාදනයක් උදෙසා ඉමහත් කැපවීමෙන් සහ වගවීමෙන් කටයුතු කරන මේ අමාත්‍යාංශයේ ඉතිහාසය වසර 84 ක තරම් දුරාතීතයකට විහිද පවතී. මුදල් අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තුවක් ලෙස වර්ෂ 1931 ට පෙර පැවති මෙම අමාත්‍යාංශය වර්ෂ 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වලින් පසු තේරීපත් වන ආණ්ඩු යටතේ විවිධ වෙනස්කම් වලට ලක්වෙමින් පැමිණ අද වන විට රාජ්‍ය පරිපාලනයේ විශිෂ්ඨ මෙහෙවරක නියැලෙමින් සිටී.

වර්ෂ 2022 ක් වූ ජූලි මස 22 වන දින සිට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය නමින් ගරු අග්‍රාමාත්‍ය හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමන්ගේ නායකත්වයෙන් නව අමාත්‍යාංශය ගොඩනැගිණ.

'රාජ්‍ය සේවක මහගෙදර' වන මේ අමාත්‍යාංශය සියළු රාජ්‍ය සේවකයන් සඳහා අවශ්‍ය මහපෙන්වීම මෙන්ම රාජ්‍ය සේවය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් ගොඩනගමින් ''සෞභාග්‍යයේ දැක්ම'' ප්‍රතිපත්ති ප්‍රකාශය මුදුන් පමුණුවා ගැනීමට මහත් කැපවීමෙන් කටයුතු කරන අතර ඒ සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය වෙත නායකත්වය ලබාදීමේ වගකීම අමාත්‍යාංශ ලේකම් නීල් බණ්ඩාර හපුහින්න මැතිඳුන් විසින් නොපිරිහෙලා ඉටු කරනු ලබයි.

මහජනතාවට තෘප්තිමත් රාජ්‍ය සේවාවක් සහතික කිරීම සඳහා සාධාරණත්වය, සමරූපිතාවය හා කාර්යක්ෂමතාවය කෙරෙහි විශේෂයෙන් සැලකිලිමත් වෙමින්, පරිපාලන විධිවිධාන හා රෙගුලාසි සකස් කිරීම මේ අමාත්‍යාංශය සතු මූලික වගකීමකි. ඒ අනුව ආයතන සංග්‍රහය හා අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සකස් කිරීම, අවශ්‍ය සංශෝධන සිදු කිරීම මෙන්ම අවශ්‍ය අවස්ථාවලදී ඒ සම්බන්ධ නිරීක්ෂණ ලබා දීම ද අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබයි. රාජ්‍ය පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදනය, අර්ථකථනය හා ඒ සම්බන්ධ මාර්ගෝපදේශ සැපයීම මේ අමාත්‍යාංශය වෙතින් ඉටුවන තවත් සුවිශේෂී කාර්යයකි. එමඟින් වඩා ඵලදායී සේවාවක් ලබා දීමට හැකිවන පරිදි සමස්ත රාජ්‍ය සේවයෙහි ම ක්‍රියාකාරීත්වය ගොඩනැගීම හා පාලනය සිදු කරනු ලබයි.

ජාතික සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා දීප ව්‍යාප්ත සේවාවන් හා සමස්ත ඒකාබද්ධ සේවාවන්හි පරිපාලන කටයුතු සිදු කරමින් රාජ්‍ය සේවය තුළ මානව සම්පත වඩාත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම ද මෙම අමාත්‍යාංශයේ මූලික කාර්යභාරයකි.

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 යටතේ සකස් කරන ලද රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ 2022 වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම් මෙමගින් ඉදිරිපත් කෙරේ.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දැක්ම

දැයට **විශිෂ්ඨ** රාජ්‍ය සේවයක්

මෙහෙවර

මානව සම්පත නිසි පරිපාලනය, කළමනාකරණය හා ප්‍රතිසංස්කරණය තුළින් විශිෂ්ඨ රාජ්‍ය සේවයක් තහවුරු කිරීම

විෂය පථය

සියළු රාජ්‍ය සේවාවන්හි පූර්ණ ධාරිතා සංවර්ධනයක් සිදු කරමින් නව තොරතුරු තාක්ෂණික ක්‍රමෝපායන් ඔස්සේ කාර්යයන් ද්විකරණය වළක්වාලමින් සේවා දායකයින් වෙත ප්‍රශස්ථ සේවාවන් ලබා දීම හා පළාත් හා ප්‍රාදේශීය මට්ටමින් පවතින අසමානතා අවම කරමින් ජනතාව වෙත උසස් සේවාවක් සහතික කිරීම

අරමුණු

- රාජ්‍ය සේවයේ මානව සම්පත් කළමනාකරණ පිළිවෙතට අනුගත වෙමින් බඳවා ගැනීම්, පාරිශ්‍රමික සහ අනෙකුත් සේවා කොන්දේසි පිළිබඳ ඵලදායී රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
- මහජන අවශ්‍යතා සඳහා ප්‍රතිචාර දැක්වීමේදී දැනට රාජ්‍ය සේවයේ සිටින සේවකයින්ගේ සිතුම් පැතුම් සහ ආකල්ප නව මානයක් කරා මෙහෙයවීම.
- රාජ්‍ය සේවයේ ඵලදායිතාව සහ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා නව කළමනාකරණ ව්‍යුහ පද්ධතියක් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- හර පද්ධතියක් ස්ථාපිතකොට බෙදාහදා ගැනීම (ප්‍රතිඵල දිශානත ආකල්ප, වගවීම, සම්පත් ප්‍රඥාවන්ත ලෙස යොදාගැනීම, අපක්ෂපාතිත්වය, පාරදෘශ්‍යබව, ආදී)
- රාජ්‍ය අංශයේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ පුහුණු වැඩසටහන් පැවත්වීමට ඇවැසි පහසුකම් සැපයීම.
- විශ්‍රාම වැටුප්වලට අදාළ ගැටළුවලට පිළියම් යෙදීම සඳහා විශ්‍රාම වැටුප් වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- රජයේ සංවර්ධන ඉලක්ක සහ ප්‍රමුඛතා සපුරාලීමේ හැකියාව සහිත රාජ්‍ය අංශයේ ආයතනික සංවර්ධනය සඳහා රාමුවක් සකස් කරගැනීම.
- සේවා සැපයුමේ ඵලදායිතාව සහ ගුණාත්මකබව ඉහළ නැංවීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යොදාගැනීම ප්‍රවර්ධනය කිරීම.
- රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩලයේ නිපුණතාව වැඩි දියුණු කිරීම.

- වෙනස්වෙමින් පවතින තත්ත්වයන්ට අනුව කටයුතු කිරීම පිණිස පද්ධති සරල කිරීම සහ ක්‍රියාදාම යළි සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ වැඩි දියුණු කිරීම, වර්ධනය කිරීම සහ ක්‍රියාවට නැංවීම.

<u>උපාය මාර්ග</u>

- රාජ්‍ය සේවයේ කාර්යක්ෂම මානව සම්පත් කළමනාකරණය සඳහා විචක්ෂණ ප්‍රතිපත්තියක් සහ නියාමන රාමුවක්

- රාජ්‍ය සේවා සැපයුමේදී ඵලදායිතාව ඉහළ නැංවීම පිණිස ක්‍රියාදාම යළි සකස් කිරීම සහ පද්ධති සංවර්ධනය සඳහා වන පරිපාලන ප්‍රතිසංස්කරණය

- රාජ්‍ය සේවය සඳහා තරහකාරී බඳවාගැනීමේ හා තෝරාගැනීමේ ක්‍රියාදාමයන්

- ඉල්ලුම් දිශානත ධාරිතා සංවර්ධනය සහ නිපුණතා ගැලපුම

- සේවා සැපයුම පුරවැසියන්ට සමීප කිරීම සඳහා විමධ්‍යගත කරනු ලැබූ ආයතනික ජාල
- රාජ්‍ය සේවයේ ගුණාත්මකබව ඉහළ නැංවීම සහ සේවා සැපයුමේ පාරදෘශ්‍යභාවය සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම

- පුරවැසියා කේන්ද්‍ර කරගත් රාජ්‍ය සේවයක් වෙත නැඹුරු වූ සේවා සැපයුමක් ප්‍රමිතිගත කිරීම සඳහා පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් නිර්මාණය කිරීම



ප්‍රධාන කාර්යයන්

1. රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "රට වෙනුවෙන් වැඩ සංස්කෘතියක් " ඇති කිරීම පිණිස අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම සිදු කිරීම සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ නටයුතු, පළාත් සභා හා පළාත් පාලන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

2. ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය, ශ්‍රී ලංකා තාක්ෂණ සේවය හා ඒකාබද්ධ සේවාවන්හි ආයතනික, පරිපාලන හා පිරිස් කළමනාකරණය.

3. පාර්ලිමේන්තුව සම්බන්ධ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතු වලට අදාළව රජය විසින් ඉටුකළ යුතු කාර්යයන්.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
සංවිධාන සැලැස්ම

ලේකම්
ශ්‍රී ල.ප.සේ (විශේෂ)

- **අතිරේක ලේකම් (භාෂාන්තර පරිපාලන)** — ශ්‍රී ල.ප.සේ (විශේෂ)
  - **අතිරේක ලේකම් (ප්‍රතිපත්ති සංවර්ධන)** — ශ්‍රී ල.ප.සේ (විශේෂ)
    - **අතිරේක ලේකම් (ආයතන සමීක්ෂණ සහ සංවිධාන)** — ශ්‍රී ල.ප.සේ (විශේෂ)
      - **අතිරේක ලේකම් (පාර්ලිමේන්තු ප්‍රතිපත්ති-ප්‍රකාශන)** — ශ්‍රී ල.ප.සේ (විශේෂ)
        - **අතිරේක ලේකම් (රාජ්‍ය භාෂා)** — ශ්‍රී ල.ප.සේ (විශේෂ)
          - ජනාධිපති ලේකම් කාර්යාලය — ශ්‍රී ල.ප.සේ (I)
          - අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය — ශ්‍රී ල.ප.සේ (I)
          - අමාත්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය — ශ්‍රී ල.ප.සේ (I)
          - ආරක්ෂක ලේකම් කාර්යාලය — ශ්‍රී ල.ප.සේ (I)
          - ප්‍රධාන අධිකරණ නිලධාරී කාර්යාලය — ශ්‍රී ල.ප.සේ (I)
          - ජාතික විගණන කාර්යාලය — ශ්‍රී ල.ප.සේ (I)
          - පොදුජන පෙරමුණ (පොපෙපෙ) — ශ්‍රී ල.ප.සේ (III/II)
          - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය — ශ්‍රී ල.ප.සේ (III/II)
          - ජාතික ජන බලවේගය — ශ්‍රී ල.ප.සේ (III/II)
          - ඉලංගෙ තමිල් අරසු කච්චි — ශ්‍රී ල.ප.සේ (III/II)
          - ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රස් — ශ්‍රී ල.ප.සේ (III/II)
          - ඒකීය ජනතා නිදහස් පෙරමුණ — ශ්‍රී ල.ප.සේ (III/II)
          - ජාතික සංවර්ධන පක්ෂය — ශ්‍රී ල.ප.සේ (III/II)
          - ජාතික ජනතා බලවේගය — ශ්‍රී ල.ප.සේ (III/II)
          - ජාතික ජනතා බලවේගය (ජාජබ)

අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතන

දෙපාර්තමේන්තු

- බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව
- රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ආයතන

- මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව
- රාජ්‍ය භාෂා කොමිසම
- දුරස්ථ අධ්‍යයන මධ්‍යස්ථානය
- ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

2022 වසරේ වැදගත්

සිදුවීම්

2022 වසරේ වැදගත් සිදුවීම්

වර්ෂ 2022 ක් වූ ජූලි මස 22 වන දින සිට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය නමින් ගරු අග්‍රාමාත්‍ය හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමන්ගේ නායකත්වයෙන් නව අමාත්‍යාංශය ගොඩනැගිණි.

1. බඳවාගැනීම්

දීප ව්‍යාප්ත සේවාවන්හි පැවති පුරප්පාඩු පිරවීම සඳහා 2022 වසරේදී නිලධාරීන් 97 දෙනෙක් රාජ්‍ය සේවයට බඳවාගන්නා ලදී.



ඒකාබද්ධ සේවාවන්හි පැවති පුරප්පාඩු පිරවීම සඳහා 2022 වසරේදී සංවර්ධන නිලධාරීන් 49053 දෙනෙක් රාජ්‍ය සේවයට බඳවාගන්නා ලදී.



2. 2022 දෙසැම්බර් 31 වන දිනට දීප ව්‍යාප්ත සේවයේ නිලධාරීන්

ශ්‍රී ලංකා පරිපාලන සේවය

ශ්‍රේණිය	අනුමත තනතුරු	තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්තය
විශේෂ	406	388	18	-
I	1010	621	389	-
III/II	1902	1565	337	-
එකතුව	3318	2574	744	-

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය

ශ්‍රේණිය	අනුමත තනතුරු	තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්තය
විශේෂ	93	68	25	-
I	502	614	-	112
II/III	1551	962	477	-
එකතුව	2146	1644	502	112

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය

ශ්‍රේණිය	අනුමත තනතුරු	තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්තය
විශේෂ	52	28	25	-
I	249	296	-	47
II	114	286	-	172
III	1150	662	488	-
එකතුව	1565	1272	513	219

ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය

ශ්‍රේණිය	අනුමත තනතුරු	තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්තය
විශේෂ	52	28	25	-
I	249	296	-	47
II/III	114	286	-	172
III(අධි සේවක)	1150	662	488	-
එකතුව	1565	1272	513	219

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය

ශ්‍රේණිය	අනුමත තනතුරු	තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්තය
විශේෂ	**01**	**01**	**-**	**-**
I	**06**	**04**	**02**	**-**
II/III	**69**	**38**	**31**	**-**
එකතුව	**76**	**43**	**33**	**-**

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය

ශ්‍රේණිය	අනුමත තනතුරු	තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්තය
විශේෂ	**21**	**13**	**08**	**-**
I	**56**	**27**	**29**	**-**
II	**17**	**12**	**05**	**-**
II/ III	**527**	**337**	**190**	
ශ්‍රේණි රහිත	**34**	**18**	**16**	**-**
එකතුව	**655**	**407**	**248**	**-**

- **<u>2022 දෙසැම්බර් 31 වන දිනට ඒකාබද්ධ සේවයේ නිලධාරීන්</u>**

සේවය	අනුමත	පවතින	පුරප්පාඩු
රාජ්‍ය කළමනාකරණ සේවය	**29785**	**24133**	**5652**
පරිවර්තක සේවය	**636**	**244**	**392**
පුස්තකාලයාධිපති සේවය	**625**	**113**	**512**
කාර්යාල සේවක සේවය	**17218**	**17330**	**2092**
රියදුරු සේවය	**7002**	**8381**	**-**
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය	**3288**	**1762**	**1531**
සංවර්ධන නිලධාරී සේවය	**85585**	**82000**	**3585**
එකතුව	**144139**	**133963**	**13764**

2022 වසරේදී නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

	චක්‍රලේඛ අංකය	නිකුත් කළ දිනය	කාරණය	යොමුව
01	01/2022	2022.01.24	ආයතන සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කරමින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2021	-
02	02/2022	2022.01.06	රාජ්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීම	2022 අයවැය කතාවේ 5.4.11 අයවැය යෝජනාව සහ අංක 21/2270/315/040 හා 2021.12.30 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව
03	03/2022	2022.01.13	රාජ්‍ය නිලධරයන්ට සහ විශ්‍රාමිකයින්ට රු.5000/-ක මාසික දීමනාවක් ලබා දීම	2022.01.03 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම
04	04/2022	2022.03.08	විදුලිය හා ඉන්ධන අරපිරිමැස්මෙන් භාවිත කිරීම	2022.03.07 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම
05	05/2022	2022.03.28	2022 රාමලාන් (රාමසාන්) සමයේ දී විශේෂ නිවාඩු ලබා දීම	-
06	06/2022	2022.04.08	අන්තර්ජාතික තරගාවලියක විනිසුරුවරයෙකු වශයෙන් සහභාගී වීමට නිවාඩු ලබා දීම	ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 12:5 වන උපවගන්තිය
07	07/2022	2022.04.07	රජයේ කාර්යාල සඳහා විශේෂ නිවාඩු දින 02 ක් ප්‍රකාශයට පත් කිරීම	-
08	08/2022	2022.04.29	රජයේ කාර්යාල සඳහා විශේෂ නිවාඩු දිනයක් ප්‍රකාශයට පත් කිරීම	-
09	09/2022	2022.05.19	2022.05.20 දින රජයේ නිලධරයන්ගේ පැමිණීම	-
10	10/2022	2022.05.25	පවතින සම්පත් හිඟය මත රාජ්‍ය වියදම් අවම කර ගැනීම සඳහා රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩල කැඳවීම සීමා කිරීම	2022.03.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2022

11	11/2022	2022.06.01	රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී "20.02.01.01" සඳහා ආදායම් ඇස්තමේන්තු - 2023	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2015.07.20 දිනැති 01/2015 චක්‍රලේඛය සහ එහි සංශෝධන
12	12/2022	2022.06.01	රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී "20.02.01.01." සඳහා හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම 2022.06.30	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2015.07.20 දිනැති 01/2015 චක්‍රලේඛය සහ එහි සංශෝධන
13	13/2022	2022.06.10	රජයේ කාර්යාල සඳහා විශේෂ නිවාඩු දිනයක් ප්‍රකාශයට පත් කිරීම	-
14	14/2022	2022.06.22	ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබාදීම	2022.06.13 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණය
15	15/2022	2022.06.15	රජයේ නිලධරයන්ට එක් දිනක් නිවසේ රැඳී සිට කෘෂිකාර්මික හා වගා කටයුතුවල යෙදීමට අවස්ථාව සලසා දීම	2022.06.13 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණය
16	16/2022	2022.06.17	රජයේ කාර්යාල වෙත නිලධරයන් කැඳවීම සීමා කිරීම	2022.06.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2022
17	17/2022	2022.09.08	කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණියේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් - 2023	රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පරිපාටික රීති (කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ විධිවිධාන
18	18/2022	2022.09.09	ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ XII වැනි පරිච්ඡේදයේ වගන්ති සංශෝධනය කිරීම	ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 1, 6, 8, 10, හා 21 වගන්ති

19	19/2022	2022.09.14	රාජ්‍ය නිලධරයන්ගේ අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා අඩු කිරීම	2022.08.30 දිනැති අතුරු අයවැය කථාව, 2022 හි රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ යටතේ වූ 11:2 යෝජනාව, 2022.09.12 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණය, 2010.09.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 19/2010 හි 03 වන ඡේදය සහ 2018.02.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018
20	20/2022	2022.09.15	රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ රජයේ පොදු සේවා නිල නිවාස ලබා දීමට සුදුසු මාණ්ඩලික නිලධාරීන් තෝරාගැනීම පිළිබඳ මාර්ගෝපදේශ	2017.12.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 32/2017
21	21/2022	2022.09.23	ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා රාජ්‍ය සේවයේ නියුතු නිලධරයන් තාවකාලිකව අනුයුක්ත කිරීම	-
22	22/2022	2022.11.25	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2023 (I, II හා III ශ්‍රේණි)	අංක අමප 11/1090/523/087 හා 2011.05.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ අංක අමප/14/0286/523/007 හා 2014.04.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය
23	23/2022	2022.12.28	1620/22 අංක දරණ 2009.09.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව පුසුතකාලයාධිපති සේවයේ විශේෂ පන්තියට උසස් කිරීම	1620/22 අංක දරණ 2009.09.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 6:3:4
24	24/2022	2022.11.25	ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2023	-

25	25/2022	2022.11.25	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2023 (I, II හා III ශ්‍රේණි)	-
26	26/2022	2022.11.30	රජයේ නිලධරයන්ගේ ඇඳුම	1989.02.01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/89 සහ 2022.11.28 දි පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණය
27	27/2022	2022.12.08	රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී "20.02.01.01" සඳහා හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම - 2022.12.31	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2015.07.20 දිනැති 01/2015 චක්‍රලේඛය සහ එහි සංශෝධන
28	28/2022	2022.12.17	ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා වැටුප් රහිත නිවාඩු ලබා දීම	ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 15:1:1 උප වගන්තිය
29	29/2022	2022.12.17	ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 30 වගන්තිය සංශෝධනය කිරීම	ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ XIV වැනි පරිච්ඡේදයේ 30 වගන්තිය
30	30/2022	2022.12.16	2023 වසර රාජකාරි කටයුතු ඇරඹීම	-
31	31/2022	2022.12.30	රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2023 වසර	2015.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2015

<u>සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ</u>

	චක්‍රලේඛ අංකය	නිකුත් කළ දිනය	කාරණය	යොමුව
01	35/92(VI)	2022.12.02	රජයේ නිලධරයන් පිළිබඳව විනය පරීක්ෂණ ඉක්මන් කරවීම ආයතන සංග්‍රහය සංශෝධනය කිරීම XLVIII පරිච්ඡේදය	1995.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 35/92(II) සහ 1997.11.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 35/92(IV)
02	10/2015(IV)	2022.01.19	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම සමත් වීම	2016.06.14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2015(III) මඟින් සංශෝධිත 2015.04.27 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2015
03	03/2016(IV)	2022.01.05	රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය - 2016	2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 සහ එහි සංශෝධන වශයෙන් නිකුත් කරන ලද 2016.07.01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016(I) හා 2018.06.14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016(III)
04	22/2016(I)	2022.01.10	2006.03.01 දින සිට 2007.07.01 දින දක්වා බඳවා ගත් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීම සඳහා සහන සැලසීම	2016.09.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/2016
05	03/2019(III)	2022.02.08	ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:5 උප වගන්තිය යටතේ වූ විනය පරීක්ෂණ නිලධර නාම ලේඛනය	ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:5 උප වගන්තිය, 2019.02.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2019, 2019.12.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2019(I) සහ 2021.02.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2019(II)

06	03/2019(IV)	2022.12.02	ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19.5 උප වගන්තිය යටතේ වූ විනය පරීක්ෂණ නිලධර නාම ලේඛනය	2019.02.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2019, 2019.12.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2019(I), 2021.02.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2019(II) සහ 2022.02.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2019(III)
07	31/2019(I)	2022.11.03	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2137/5 හා 2019.08.19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ඇතුළත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම	2019.10.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 31/2019 හි 2.3 (අ) ඡේදය
08	33/2019(I)	2022.11.21	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2137/66 හා 2019.08.22 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ඇතුළත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම	2019.11.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 33/2019 හි 2.3 (අ) ඡේදය
09	34/2019(I)	2022.11.09	ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2137/26 හා 2019.08.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ඇතුළත් කරනු ලැබූ සංශෝධන ක්‍රියාත්මක කිරීම	2019.11.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 34/2019 හි 2.3 (අ) ඡේදය
10	01/2020 (I)	2022.11.14	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2137/89 හා 2019 අගොස්තු මස 23 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ඇතුළත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම	-

11	05/2020(I)	2022.11.14	ශ්‍රී ලංකා විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2137/88 හා 2019 අගොස්තු මස 23 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ඇතුළත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම	-
12	18/2020(I)	2022.10.28	රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම	2020.10.16 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020
13	02/2021(VII)	2022.08.29	COVID – 19 වෛරසය මර්දනය කිරීම සඳහා රජය අනුගමනය කළ ක්‍රමවේදයන් හා සමගාමීව 2020 මාර්තු 13 දිනෙන් පසු රාජ්‍ය නිලධරයන්ගේ නිවාඩු හා දීමනා සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග	-
14	14/2022(I)	2022.09.06	ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය/විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම	2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022
15	14/2022(II)	2022.09.15	ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන් සඳහා දේශීය වශයෙන් වැටුප් රහිත නිවාඩු ලබා දීම	2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022
16	15/2022(I)	2022.08.03	රජයේ නිලධරයන්ට එක් දිනක් නිවසේ රැඳී සිට කෘෂිකාර්මික හා වගා කටයුතුවල යෙදීමට අවස්ථාව සලසා දීම	2022.06.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2022
17	16/2022(I)	2022.06.26	රජයේ කාර්යාල වෙත නිලධරයන් කැඳවීම සීමා කිරීම	2022.06.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2022
18	16/2022(II)	2022.07.24	රජයේ කාර්යාල වෙත නිලධරයන් කැඳවීම සීමා කිරීම	2022.06.15 දිනැති චක්‍රලේඛ 15/2022, 2022.06.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2022 සහ 2022.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2022(I)

<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි</u>

	චක්‍රලේඛ ලිපි අංකය	නිකුත් කළ දිනය	කාරණය	යොමුව
01	01/2022	2022.08.12	ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13:2, 21:2, 22:1:1 හා 14:12 උප වගන්ති සංශෝධනය කිරීම	2019.09.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2019
	චක්‍රලේඛ ලිපි අංකය	**නිකුත් කළ දිනය**	**කාරණය**	**යොමුව**
02	02/2022	2022.08.29	රාජ්‍ය ආයතනවලට මහජනතාවගෙන් ලැබෙන ලිපි, විද්‍යුත් ලිපි (E-mail) සහ දුරකථන ඇමතුම් සඳහා පිළිතුරු සැපයීම	1997.11.27 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 23/97, 2015.05.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/2015 සහ 2016.12.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2016
03	03/2022	2022.09.23	රාජ්‍ය අදායම් ඇස්තමේන්තු කිරීම, එකතු කිරීම, අධීක්ෂණය සහ වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ (රජයේ ගොඩනැඟිලි හා නිවාස කුලී - 20.02.01.01)	2021.10.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2021
04	04/2022	2022.09.27	රජයේ නිලධරයන් විසින් සමාජ මාධ්‍ය ජාලා වෙත අදහස් ප්‍රකාශ කිරීම	2015.01.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2015, 2019.02.27 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2019, ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ XXXI වැනි පරිච්ඡේදයේ 3:2 උපවගන්තිය සහ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 6 හා 7 වගන්ති
05	05/2022	2022.09.27	රජයේ නිලධරයන්ගේ ඇඳුම	2019.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2019(I)
06	06/2022	2022.12.28	රාජ්‍ය සේවා ආයතනවල ඉවතලන කඩදාසි එකතු කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය	2022.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020

<u>ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා අංශය</u>

<u>විවෘත බඳවා ගැනීම</u>

- ඉංජිනේරු විද්‍යාවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට විවෘත පදනම මත බඳවා ගැනීමට අදාළ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය 2021.12.10 වන දින පැවැත් වූ අතර, පැවති පුරප්පාඩු සංඛ්‍යාව අනුව නවක නිලධාරීන් 71 දෙනෙකු හට 2022.04.04 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට පත්වීම් ලබා දෙන ලදී.





<u>විශේෂ ශ්‍රේණියට උසස් කිරීම</u>

- ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම් ලත් නිලධාරීන්, එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ විධිමත් සම්මුඛ පරීක්ෂණය 2022.11.01 දින පැවැත් වූ අතර, පැවති පුරප්පාඩු සංඛ්‍යාව අනුව නිලධාරීන් 03 දෙනෙකු 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කරන ලදී.

- ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 2021.07.01 දිනට පැවති විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු 04 ක් පිරවීම සඳහා වූ අයදුම්පත් කැඳවීමේ නිවේදනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අනුමැතියට ඉදිරිපත් කර ඇත.





ආයතන අංශය

2022 වර්ෂය තුළ ආයතන අංශය විසින් ඉටු කරන ලද කාර්යයන් හා එහි ප්‍රගතිය (2022.12.31 දිනට)

රාජ්‍ය සේවකයන් සම්බන්ධයෙන් සහ රාජ්‍ය සේවයේ යහපැවැත්ම සහතික වන අයුරින් ඊට අදාළ වන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා රජයට සහය වීම ආයතන අංශයේ ප්‍රධාන කාර්යය වන බැවින්, ඊට අදාළ කටයුතු ඉටු කිරීමේදී හා බලතල ක්‍රියාත්මක කිරීමේදී ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි ප්‍රධාන වශයෙන්ම උපයෝගී කර ගනී.

ආයතන සංග්‍රහය

ආයතන සංග්‍රහය සඳහා සංශෝධන කටයුතු

2013 වර්ෂයේ දී සංශෝධිතව නිකුත් කරන ලද ආයතන සංග්‍රහයේ 1 වැනි කාණ්ඩය සඳහා 2012 වසරෙන් පසුව සිදුකර ඇති සංශෝධන ද ඇතුළත් කරමින් පරිච්ඡේද 29 කින් සමන්විත වන පරිදි ආයතන සංග්‍රහයේ 1 වැනි කාණ්ඩය නැවත සංශෝධන කිරීමට කටයුතු කරමින් පවතින අතර, මේ වන විට ආයතන සංග්‍රහයේ සියලු පරිච්ඡේද (පරිච්ඡේද I සිට V දක්වා හැර) පරීක්ෂා කර බලා සංශෝධනය විය යුතු වගන්ති/ උප වගන්ති හඳුනාගෙන ඇති අතර, ඇතැම් වගන්ති/ උප වගන්ති මේ වන විටත් සංශෝධනය කර ඇත. වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නිරීක්ෂණ හා නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව සංශෝධනය විය යුතු පරිච්ඡේද/ වගන්ති/ උප වගන්ති සංශෝධනය කිරීම සඳහා අදාළ ආයතන සම්බන්ධීකරණය කර ගැනීම සඳහා මේ වන විට ක්‍රියා කරමින් පවතී. එම අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වෙතින් ද නිරීක්ෂණ හා නිර්දේශ ලද පසුව ආයතන සංග්‍රහයේ සංශෝධන කටයුතු පූර්ණ වශයෙන් අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

ආයතන සංග්‍රහයේ 1 වැනි කාණ්ඩයේ I වැනි පරිච්ඡේදයේ සිට V වැනි පර්ච්ඡේදය දක්වා වන කරුණුවලට අදාළ විෂය පථය 2009.04.02 දින සිට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරී ඇති බැවින් එම කරුණු දැනට ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව සලකා බලමින් අවශ්‍ය සංශෝධන කටයුතු සිදු කිරීම සඳහා මේ වන විට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.

ආයතන සංග්‍රහය දමිළ හා ඉංග්‍රීසි මාධ්‍ය භාෂා පරිවර්තනය සිදු කිරීම

- 2013 ආයතන සංග්‍රහයේ දෙමළ භාෂා පරිවර්තන කටයුතු සිදු කොට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වෙතින් ලැබුණු මෘදු පිටපත රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙතින් මුද්‍රණය කර නැවත එහි සෝදුපත් පරීක්ෂාව සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

- 2013 ආයතන සංග්‍රහයේ ඉංග්‍රීසි භාෂා පරිවර්තන කටයුතු සිදු කිරීම සඳහා මෙම අමාත්‍යාංශයේ භාෂා පරිවර්තන අංශය වෙත යොමු කර ඇත. එමඟින් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරන ලද

පරිච්ඡේද මේ වන විට ලැබී ඇති අතර, එම පරිච්ඡේදවල නැවත සෝදුපත් පරික්ෂා කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ආයතන කටයුතුවලට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කර අනුමතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන අතර, අදාළ අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.

ඒ අනුව, 2022 වසර තුළ ආයතන අංශය මඟින් අමාත්‍ය මණ්ඩල සංදේශ 09 ක් යොමු කිරීමට කටයුතු කර ඇත.

වන්දි කමිටු මඟින් වන්දි මුදල් අනුමත කිරීම

රාජකාරියේ යෙදී සිටිය දී, රාජකාරි නිම වී නිවස වෙත යමින් සිටිය දී, රාජකාරි ස්ථානය සඳහා පැමිණෙමින් සිටිය දී හා රාජකාරි කටයුක්තක් උදෙසා යමින් සිටිය දී රාජ්‍ය නිලධරයෙකු හට සිදුවන අනතුරක දී වන්දි මුදල් ලබා දීමේ හැකියාවක් පවතින අතර, ඒ පිළිබඳව වන තීරණ ගනු ලබන්නේ සාමාජිකයන් සිව්දෙනෙකුගෙන් සමන්විත පහත වන්දි කමිටුවක් මගිනි.

කමිටුවේ නියෝජනය	නිත්‍ය තනතුර	නම
සභාපති	ආයතන අධ්‍යක්ෂ ජනරාල්	වන්දන කුමාරසිංහ මහතා
සාමාජික	විශ්‍රාම වැටුප් නියෝජ්‍ය අධ්‍යක්ෂ	ඕෂධ ගුණතිලක මහතා
සාමාජික	නියෝජ්‍ය අධ්‍යක්ෂ, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව	සී.ඩී.ලියනගේ මහත්මිය
සාමාජික	සහකාර ආයතන අධ්‍යක්ෂ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	එස්.ඩී.ජයවීර මහත්මිය

2022.12.31 දින දක්වා අනුමත කරන ලද වන්දි ලිපි ගොනු සංඛ්‍යාව සහ වන්දි මුදල් ප්‍රදානය සම්බන්ධ තොරතුරු පහත දැක්වේ. (ගනු ලබන කමිටු තීරණ අනුව ගෙවනු ලබන වන්දි මුදල් ප්‍රධානය සුවිශේෂී හේතූන් මත සංශෝධනය විය හැකිය)



වන්දි දත්ත පද්ධතිය

රාජ්‍ය ආයතන ප්‍රධානීන් මෙන්ම රාජ්‍ය නිලධරයන් විසින් වන්දි මුදල් ලබා ගැනීමට ඇති හැකියාවන් විමසමින් හා වන්දි මුදල් ඉල්ලුම් කරමින් නිරතුරුව ආයතන අංශය වෙත ලිපි ඉදිරිපත් කෙරේ. ඒ ආකාරයට නිරතුරුව ලැබෙන වන්දි ඉල්ලීම් සම්බන්ධ සියලු ම විස්තර හා ඊට අදාළව ගනු ලබන පොදු තීරණ ඇතුළත් කරමින් දත්ත පද්ධතියක් සකස් කර ඇත. එම දත්ත පද්ධතිය, ලැබෙන තොරතුරු මත අඛණ්ඩව යාවත්කාලීන කරමින් පවතී.

ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳව රාජ්‍ය නිලධරයන් දැනුම්වත් කිරීම සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන

ආයතන සංග්‍රයේ විධිවිධාන පිළිබඳව රාජ්‍ය නිලධරයන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන, Google පෝරමයක් මඟින් අන්තර්ජාලය ඔස්සේ 2021 වසරේ ලියාපදිංචි වූ රාජ්‍ය නිලධරයන් අතරින් නිලධරයන් 90 දෙනෙකු සඳහා 2022.03.23 සහ 2022.03.24 දින පවත්වන ලදී. 2022 වර්ෂයේදී පුහුණු වැඩසහන් 03 ක් පැවැත්වීමට අපේක්ෂිත වුව ද එවකට පැවති සමාජ වාතාවරණය හේතුවෙන් පැවැත්වීමට හැකි වූයේ 2022.03.23 සහ 24 දිනයන්හිදී නිලධරයන් 90 ක් සඳහා පුහුණු වැඩසටහන් 01 ක් පමණි. ඉන් අනතුරුව, 2022.05.25 වන දින සිට පුහුණු වැඩසටහන් සම්බන්ධ ඉදිරි කටයුතු මානව සම්පත් සංවර්ධන අංශය වෙතින් සිදු කිරීමට කටයුතු කරන බව දැනුම් දුන් බැවින්, ඒ පිළිබඳ කටයුතු එම අංශය වෙත භාර දෙන ලද අතර, අවශ්‍ය අවස්ථාවන්හි දී සම්පත් දායකත්වය දැක්වීම ආයතන අංශයේ මාණ්ඩලික නිලධරයන් විසින් සිදු කරන ලදී.

2022.03.23 සහ 2022.03.24 දිනයන්හි මෙම වැඩසටහන සඳහා සහභාගී වූ නිලධරයන් 90දෙනා අතරින් අපේක්ෂිත මට්ටමින් දේශන සඳහා සහභාගී වූ නිලධරයන් 68 දෙනෙකු සඳහා සහතික පත්‍ර ද තැපැල් මඟින් යොමු කරන ලදී.



නිරීක්ෂණ හා නිර්දේශ ලබා දීම

ආයතන අංශය වෙතින් ප්‍රධාන වශයෙන්ම නිරීක්ෂණ හා නිර්දේශ ලබා දෙනු ලබන්නේ අමාත්‍ය මණ්ඩල සංදේශ, සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටි සම්බන්ධයෙනි.

ආයතන අංශයේ විෂයන්ට අදාළව ලැබෙන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා සකසනු ලබන නිරීක්ෂණ ගරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සලකා බැලීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

එලෙස ම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් යොමු කරනු ලබන සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටිවලට අදාළව ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම ද සිදු කරනු ලබයි. එලෙස 2022 වර්ෂය තුළ ආයතන අංශය වෙතින් ලබා දුන් නිරීක්ෂණ සංඛ්‍යාව පහත පරිදි වේ.

නිරීක්ෂණ හා නිර්දේශ ලබා දී ඇති කරුණ	නිරීක්ෂණ හා නිර්දේශ සංඛ්‍යාව
අමාත්‍ය මණ්ඩල සංදේශ	177
සේවා ව්‍යවස්ථා	01
බඳවා ගැනීමේ පරිපාටි	24

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළව ක්‍රියා කිරීම

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ ආයතන අංශය වෙත ඉදිරිපත් වන තොරතුරු ඉල්ලීම් සඳහා මහජනයා වෙත කඩිනමින් තොරතුරු ලබා දීමට කටයුතු කෙරේ. 2022 වසර තුළ තොරතුරු පනත යටතේ ඉදිරිපත්ව ඇති තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව 87 ක් වන අතර, ඉන් තොරතුරු ඉල්ලීම් 77ක් සඳහා අදාළ පිළිතුරු 2022 වසර තුළ යොමු කර ඇත.

මාසය	තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව	තොරතුරු ලබා දීමේ ප්‍රගතිය
ජනවාරි	11	02
පෙබරවාරි	04	07
මාර්තු	08	05
අප්‍රේල්	06	11
මැයි	03	04
ජුනි	05	09
ජූලි	02	02
අගෝස්තු	05	05
සැප්තැම්බර්	06	07
ඔක්තෝබර්	08	03
නොවැම්බර්	12	13

දෙසැම්බර්	17	9
එකතුව	87	77

වෙනත් ආයතන හා අමාත්‍යාංශ වෙත ලබා දෙන ලද උපදේශන හා පැහැදිලි කිරීම්

ලැබෙන විමසීම් අනුව ප්‍රතිචාර දක්වන අතර, මෙලෙස වැඩි වශයෙන් විමසීම් කරනු ලබන්නේ ආයතන සංග්‍රහයේ වගන්ති, වරින් වර නිකුත් කරනු ලබන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වල කරුණු සම්බන්ධයෙනි. මෙහි දී ලිඛිත මෙන්ම වාචික විමසීම් ද අනුව කටයුතු කරනු ලබයි.

අභ්‍යන්තර විගණන අංශය

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ, රාජ්‍ය පරිපාලන අංශයට අයත් අභ්‍යන්තර විගණන අංශය, මු.රෙ. 133 ප්‍රකාර, අමාත්‍යාංශ ලේකම්වරයාට සෘජුවම වගකීමට බැඳී සිටින ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයකු යටතේ ක්‍රියාත්මක වේ. එය ශාඛා ප්‍රධානී ඇතුළු අභ්‍යන්තර විගණන නිලධාරීන් 12 දෙනකු, කාර්යාල කාර්ය සහායකය නිලධාරියෙකු සහ රියදුරකුගෙන් යුත් අනුමත කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ, රාජ්‍ය පරිපාලන අංශය හා ඒ යටතේ පවතින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය (DLC), රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, රාජ්‍ය භාෂා කොමිෂන් සභාව, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව, භාෂා අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ ජාතික ආයතනය, පාර්ලිමේන්තු කටයුතු අංශය, ජාතික භාෂා අංශය හා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවලට අදාළව අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීමේ වගකීම ද මීට අමතරව අවශ්‍යතාවය අනුව විශේෂ විගණන පරීක්ෂණ සිදුකිරීම ද අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථයට අදාළ වේ.

2022 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශය විසින් සිදුකරන ලද කාර්යයන්

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.

- පළමු කාර්තුව - 2022.03.24
- දෙවන කාර්තුව - 2022.06.29
- තෙවන කාර්තුව - 2022.09.29
- සිව්වන කාර්තුව - 2022.12.28

<u>විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම</u>



- **<u>2022.12.31 දිනට නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන විමසුම්වල විස්තර</u>**

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	විෂයය (සංක්ෂිප්තව)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - රාජ්‍ය පරිපාලන අංශය	01)රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය - 2022
	02)රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ දුරකථන බිල්පත් පියවීම සම්බන්ධ අභ්‍යන්තර විගණන පරීක්ෂණය
	03)රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ වාහන හා ඉන්ධන වියදම් කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය - 2021
	04)රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ වැටුප් ගෙවීම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය - 2021 දෙසැම්බර්
	05)රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ගෙවීම් වවුචර්පත් පරීක්ෂාව - 2021 (ජනවාරි සිට ජුනී දක්වා)
	06)රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සංචිත හා වෙන්කළ වාහනවල දෛනික ධාවන සටහන් පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය - 2021
	07)රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ගෙවීම් වවුචර්පත් පරීක්ෂාව - 2021 (ජුලි සිට දෙසැම්බර් දක්වා)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - රාජ්‍ය පරිපාලන අංශය	08)රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය - 2022
	09)රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ 2022.09.30 දිනට ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය පරීක්ෂාව
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	10)වාහන හා ඉන්ධන වියදම් කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය - 2021
ජාතික භාෂා අංශය	11)ජාතික භාෂා අංශයේ වාහන හා ඉන්ධන වියදම් කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය - 2021
පාර්ලිමේන්තු කටයුතු අංශය	12)පාර්ලිමේන්තු කටයුතු අංශයේ වාහන හා ඉන්ධන වියදම් කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය - 2021
	13)පාර්ලිමේන්තු කටයුතු අංශයේ ස්ථාවර වත්කම් යටතේ ඇති වාහන හා වාහන අනතුරු පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය
	14)පාර්ලිමේන්තු කටයුතු අංශයේ සංචිත වාහනවල දෛනික ධාවන සටහන් පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය - 2021
රාජ්‍ය භාෂා	15)රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ වාහන අනතුරු පිළිබඳ අභ්‍යන්තර විගණන

දෙපාර්තමේන්තුව	පරීක්ෂණය
	16)රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ වාහන හා ඉන්ධන වියදම් කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය - 2021
රාජ්‍ය භාෂා කොමිෂන් සභාව	17)රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වාහන අනතුරු පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය
	18)රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වාහන හා ඉන්ධන වියදම් කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය - 2021
	19) රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ කාර්යයසාධනය විගණනය
මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව	20)මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවේ වාහන හා ඉන්ධන වියදම් කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය - 2021
ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය	21) වාහන හා ඉන්ධන වියදම් කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය - 2021
	22)සංචිත වාහනවල දෛනික ධාවන සටහන් පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය - 2021
අමාත්‍යාංශය සහ අමාත්‍යාශය යටතේ පවතින සියළුම ආයතන සඳහා	23)බැංකු සැසඳුම් ප්‍රකාශය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය - 2021 සැප්තැම්බර්
	24)බැංකු සැසඳුම් ප්‍රකාශය පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය - 2022 මාර්තු
	25)රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂණය - 2021/ 2022 (රාජ්‍ය පරිපාලන අංශය, පාර්ලිමේන්තු කටයුතු අංශය, ජාතික භාෂා අංශය)
	26)මූලික වාර්තාව සකස් කිරීම
	27)අමාත්‍යාංශ / රාජ්‍ය අමාත්‍යාංශ වලට අදාල ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථාවල වාර්ෂික වාර්තාව සකස් කිරීම පිළිබඳ තොරතුරු වාර්තාව - රාජ්‍ය පරිපාලන අංශය
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	28)OTA 6000 ලබාගන්නා විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ගොනු තාවකාලික ගොනුදැයි තහවුරු කර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත පද්ධතිය විගණනය කිරීම - 2022 ජූලි ➢ මෙම විගණන පරීක්ෂණයට අදාළ විගණන වාර්තා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 වෙත යොමු කරන ලදී.
	29)විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත පද්ධතිය තුළ ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවීම් පරීක්ෂාව - මෙම විගණන පරීක්ෂණයට අදාළ විගණන වාර්තා අනුරාධපුරය, කළුතර, කෑගල්ල, කුරුණෑගල, කොළඹ, ගම්පහ, ගාල්ල, බදුල්ල, මහනුවර, මාතර, මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යොමු කරන ලදී.

<u>2022.12.31 දිනට නිකුත් කරන ලද විශේෂ විගණන පරීක්ෂණ වාර්තාවල විස්තර</u>

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	**විෂයය (සංක්ෂිප්තව)**
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	30)අමාත්‍යාංශයේ මූල්‍ය අංශයේ කටයුතු සම්බන්ධ අභ්‍යන්තර විගණන පරීක්ෂණය
ජාතික භාෂා අංශය	31)ජාතික භාෂා අංශයේ කළමනාකරණ සේවා නිලධාරී III ශ්‍රේණියේ නිලධාරිණියක් පිළිබඳ ඉදිරිපත් කල පෙත්සම පිළිබඳ සිදුකළ විගණන පරීක්ෂණය
ජාතික භාෂා	32) ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ සභාපතිතුමා සම්බන්ධව ඉදිරිපත්

අධ්‍යාපන හා පුහුණු ආයතනය	කල පෙත්සම පිළිබඳ සිදුකළ විගණන පරීක්ෂණය

<u>ශ්‍රී ලංකා විද්‍යාත්මක, වාස්තු විද්‍යාඥ හා තාක්ෂණ සේවා අංශය</u>

2022 වර්ෂයේ අත්පත් කරගන්නා ලද සුවිශේෂී ඉලක්ක සහ ජයග්‍රහණ මෙන්ම ඉදිරි මාසවල ඉටුකිරීමට අපේක්ෂිත කාර්යයන්

ඉලක්ක හා ජයග්‍රහණ

2019 වර්ෂයේ දී ආරම්භ කරන ලද කළමනාකරණ නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන කොවිඩ් වසංගත තත්ත්වය හා රටේ පැවති වාතාවරණය හමුවේ ප්‍රමාද කිරීමට සිදු වූ අතර එය මෙම වර්ෂයේදී සාර්ථකව නිම කර නිලධාරීන් සඳහා සහතිකපත් ප්‍රදානය කිරීම.

<u>අංශය විසින් සංවිධානය කරන ලද විශේෂ වැඩසටහන් සහ අවස්ථා සම්බන්ධ තොරතුරු සහ ඡායාරූප</u> -

ශ්‍රී ලකා විද්‍යාත්මක සේවයේ නවක නිලධරයින් සඳහා පවත්වන ලද සේවාරම්භක පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කරන ලද නිලධාරීන්ගේ කලා කුසලතා ඔප් නංවීමේ විවිධ ප්‍රසංගයක් සමඟ සහතිකපත් ප්‍රදානය කිරීම.





ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නවක නිලධාරීන් විසින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත ඔසු උයනක් පිරිනැමීම.





ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය සඳහා සීමිත පදනමින් බඳවා ගන්නා ලද නිලධරයින් 10ක් සඳහා පත්වීම් ලිපි ප්‍රදානය කිරීම





ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ තනතුරු 12කට නිලධරයින් පත් කිරීම සඳහා 2022.11.27 දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වන ලදි.

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයින් සේවය කරනු ලබන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයින්ගේ බඳවා ගැනීමේ නිවේදන 2022.10.11 හා 2022.11.28 යන දෙදින යාවත්කාලීන කිරීමේ වැඩමුළු පැවැත්වීම ද සිදු විය.

මෙම කෙටුම්පත් වාර්තාවේ සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.



කේ.ඩී.එන්. රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්යය සාධනය

2022

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

					එෆ්සිඒ-එෆ්
	2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා				
	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය				
අයවැය 2022 රු.		සටහන	තක්‍ය 2022 රු.	 2021 රු.	
	ආදායම් ලැබීම්				
-	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	එෆ්සිඒ -1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
1,450,700,000	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	1,650,494,125	1,288,512,491	
1,450,700,000	**මුළු ආදායම් ලැබීම් (අ)**		**1,650,494,125**	**1,288,512,491**	
	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අග්‍රිම		86,765,544,160	1,789,170,000	එෆ්සිඒ -3
-	තැන්පතු		125,683,366	43,153,157	එෆ්සිඒ -4
-	අත්තිකාරම් ගිණුම්		725,454,832	53,491,275	එෆ්සිඒ -5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**87,616,682,358**	**1,885,814,432**	
1,450,700,000	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**89,267,176,483**	**3,174,326,923**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)				
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**89,267,176,483**	**3,174,326,923**	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
41,329,371,050	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	38,727,738,262	14,429,948,059	
863,374,950	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	693,069,036	203,401,934	එෆ්සිඒ -2(ii)
497,640,580	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	470,603,513	236,731,744	
	පොළී ගෙවීම්	**8**		-	
1,237,700	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	562,609	429,370	
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්තු වාර්තා පදනම්ව කාර්තුගතව අමාත්‍යාංශ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ වාර්තාව සකස්කර මහා භාණ්ඩාගාරය වෙත යොමු කිරීම.

1.3.7. ඉංජිනේරු අංශය

- ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘති අධීක්ෂණය හා උපදේශනය ලබා දීමට අදාළ උපදේශන ආයතනයන් සම්බන්ධීකරණය කිරීම.
- ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන වෙන් කරනු ලබන මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 200 ඉක්මවන ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාළ සැලසුම් ඇස්තමේන්තු හා මිල විචල්‍යතා වාර්තා පිළිබඳ නිර්දේශ ලබා දීම.
- සියලුම ඉදිකිරීම් ව්‍යාපෘති සම්බන්ධ අවශ්‍ය කටයුතු ඉටු කිරීම.
- ප්‍රාදේශීය මට්ටමේ ඉදි කිරීම් අලුත්වැඩියාවන් සිදු කිරීම හා උපදේශනය.
- සියලුම ඉදිකිරීම් සම්බන්ධ ව්‍යාපෘතිවල ප්‍රගතිය විමසීම.
- කවර හෝ ප්‍රතිපාදන ප්‍රභවයක් යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ක්‍රියාත්මක කරනු ලබන යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සම්බන්ධව ඉංජිනේරුමය හා වාස්තු විද්‍යා උපදේශන කටයුතු සිදු කිරීම.
- දිස්ත්‍රික් ඉංජිනේරු, තාක්ෂණික නිලධාරී, සහ තාක්ෂණ සහායක නිලධාරීන්ගේ වෘත්තීමය කාර්යභාරය අධීක්ෂණය.
- ඉංජිනේරු හා නඩත්තු අංශයේ නිලධාරීන්ගේ රාජකාරී කටයුතු අධීක්ෂණය හා පරිපාලනය.
- අමාත්‍යාංශ/ දිස්ත්‍රික් ඉංජිනේරුවරුන් හා වාස්තු විද්‍යාඥයින්ගේ උසස්වීම් හා වරලත් සුදුසුකම් තත්ත්ව ලබා ගැනීමේ කටයුතු සඳහා පහසුකම් සැපයීම සහ තාක්ෂණික කාර්ය මණ්ඩලවල පුහුණු අවශ්‍යතා සපුරාලීමට කටයුතු කිරීම.
- ඉදිකිරීම් කොන්ත්‍රාත් වලදී ඇතිවන ගැටළු වලදී බේරුම්කරණ ක්‍රියාවලිය සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාට අවශ්‍ය ඉංජිනේරුමය උපදෙස් ලබා දීම.
- අවස්ථානුකූලව විමධ්‍යගත අයවැය සම්බන්ධ ව්‍යාපෘති, වෙනත් අමාත්‍යාංශ සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධ තාක්ෂණික සහ ඉංජිනේරු වෘත්තීමය උපදේශන කටයුතු සිදු කිරීම.
- ස්වදේශ කටයුතු අංශයට අයත් සියලුම සංචාරක බංගලාවල ඉදිකිරීම් ව්‍යාපෘති හා නඩත්තු කටයුතු ක්‍රියාත්මක කිරීමට අදාළ තාක්ෂණික උපදේශනය ලබා දීම.
- "නිල මැදුර" පරිපාලන සංකීර්ණයේ නඩත්තු කටයුතු පරිපාලනය හා තාක්ෂණික උපදේශනය හා ක්‍රියාත්මක කිරීම.

1.3.8. ක්‍රමසම්පාදන අංශය

- අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ප්‍රගති පාලනය.
- වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කර විගණකාධිපති වෙත හා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- දිස්ත්‍රික් කාර්යසාධන වාර්තා විගණකාධිපති වෙත හා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු.
- දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන්වල සහ අමාත්‍යාංශ සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය හා වාර්තාකරණය.
- පාර්ලිමේන්තු අයවැය සඳහා ප්‍රගතිය ඉදිරිපත් කිරීම.
- ජාතික මට්ටමේ දත්ත මෙහෙයුම් පද්ධතියක් සහ සම්පත් පැතිකඩ නිර්මාණය කිරීම.
- විශේෂ සහ අත්‍යවශ්‍ය ගැටලු සහ ප්‍රශ්න සඳහා ව්‍යාපෘති සංකල්ප පත්‍රිකා පිළියෙල කිරීම.
- තිරසාර සංවර්ධන අභිමතාර්ථ වලට අදාළ වැඩසටහන් සහ ව්‍යාපෘති සම්බන්ධීකරණය.

1.3.9. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය

- ඉ-ග්‍රාම නිලධාරි ව්‍යාපෘතිය, යාපනය ප්‍රදේශය තුළ ඉන්කියුබේටර්/ ඇක්සලරේටර් සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය හා ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ සහාය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- මූලික තොරතුරු, ක්‍රියාවලීන් හා සම්පත් සළුදායී ලෙස ඒකාබද්ධ කිරීමේ කටයුතුවලට ප්‍රමුඛත්වය ලබා දෙමින් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් පරිපාලනයට අදාළ කාර්යයන් සමාලෝචනය කිරීම.
- මහජන හිතකාමී අයුරින් වැඩ පියවර සරල කිරීමේ කටයුතු හා පුරවැසි ප්‍රඥප්ති සමාලෝචනය.
- දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටම්වල ධාරිතා සංවර්ධන හා ආකල්ප ප්‍රවර්ධන කටයුතු සඳහා සහාය ලබා දීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා අංශයන්හි ප්‍රගමණයට අදාළ වඩාත් ප්‍රශස්ත සේවා සැපයීමේ හා අභ්‍යන්තර සම්පත් කළමනාකරණ කාර්යයන්ට සහය වීම පිණිස රාජ්‍ය හා රාජ්‍ය නොවන පාර්ශවකරුවන් සමඟ සළුදායී සහයෝගීතා ගොඩනැංවීම.

ഒരേ രൂപഭാവങ്ങളുള്ള 20ൽ
ഒരുപാടുപേർ
ഒരുമിച്ച്
ഒരുമിച്ചു താമസിക്കുന്നു
ഒരുമിച്ചു പഠിക്കുന്നു
ഒരുമിച്ചു പോകുന്നു
ഒരുമിച്ചു വരുന്നു
ഒരുമിച്ചുകൂടുന്നു
ഒരുമിച്ചുചേരുന്നു
ഒരുമിച്ചുണ്ടാകുന്നു
ഒരുമിച്ചുണ്ടാകുന്നു
ഒരുമിച്ചുണ്ടാക

1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / ආයතන

ස්වදේශ කටයුතු අංශය

- සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල
- සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල
- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අ) **ව්‍යාපෘතියේ නම** : යාපනය ප්‍රදේශය තුළ ඉන්කියුබේටර්/ ඇක්සලරේටර් සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම

ආ) **දායක නියෝජිතායතනය** : ඉන්දියානු රජය (රු. මිලියන 250)

ඇ) **ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම**: රු. මි. 307

ඈ) **ව්‍යාපෘති කාල සීමාව**: 2021- 2023

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

2.1. විශේෂ ළඟා කර ගැනීම්

2.1.1. මූල්‍ය අංශය

- මෙහෙයුම් පිරිවැය අවම කිරීම සහ අනාගත වර්ධනය උපරිම කිරීම සඳහා කාර්යක්ෂමව මූල්‍ය වාර්තාකරණය.
- ස්වදේශ කටයුතු අංශයෙහි යෝජිත මූල්‍ය පාලනයේ නීති රීති අනුව කටයුතු කිරීම.
- ස්වදේශ කටයුතු අංශයෙහි නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි පවත්වාගෙන යාම.
- ග්‍රාමීය හා ප්‍රාදේශීය පරිපාලන කටයුතු සඳහා ප්‍රතිපාදන සැපයීම.

2.1.2. විමර්ශන අංශය

- විමර්ශන රාජකාරී කටයුතු සඳහා පුහුණුවලත් නවක නිලධාරීන් 12 දෙනෙකු විමර්ශන අංශය සඳහා බඳවා ගැනීම.
- විමර්ශන රාජකාරී සඳහා සිංහල සහ දෙමළ භාෂා දෙකෙන්ම රාජකාරී සිදු කිරීමට හැකි නිලධාරීන් 9 දෙනෙකු පුහුණු කර දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කිරීම.
- අංශය තුළ විමර්ශන තොරතුරු එක්රැස් කිරීම සඳහා විධිමත් පරිගණක දත්ත පද්ධතියක් (Google Drive හරහා) නඩත්තුකර පවත්වාගෙන යාම.
- අංශය තුළ සුබ සාධක සංගමයක් පිහිටුවා ගැනීම තුළින් නිලධාරීන්ගේ උපන්දින, අවමංගල කටයුතු, විනෝද චාරිකා ආදි වැඩකටයුතුවලට ශක්තියක් වීම.
- ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් අංශයේ වැඩකටයුතු පහසුකර ගැනීමට කටයුතු කිරීම.
- අංශයේ ලේඛන ගොනු සම්බන්ධයෙන් ලේඛනාගාරයක් නඩත්තු කිරීම.
- අංශයේ නිලධාරීන්ගේ දැනුම, මානසික සුවය වැඩිදියුණුව උදෙසා පුස්තකාලයක් පවත්වාගෙන යාම.
- ප්‍රථමාධාර ඒකකයක් අංශය තුළ පවත්වාගෙන යාම.
- මහජනතාවට දුරකතනය ඔස්සේ පැමිණිලි ඉදිරිපත් කිරීමට 1905 මහජන පැමිණිලි ඒකකයක් හඳුන්වා දීම.

2.1.3. ස්වදේශ කටයුතු අංශය

2.1.3.1. දිස්ත්‍රික් පාලන අංශය

- නිදහස් දින සමරු උළෙල සැමරීම නිමිත්තෙන් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්ම මී පැළ, කොහොඹ පැල, කුඹුක් පැල හා ඒ ඒ ප්‍රදේශ වලට ගැලපෙන ශාක පැල මෙන්ම සෑම ගෙවත්තක් තුළම පළතුරු හෝ ආහාරමය වටිනාකමකින් යුතු පැළ සිටුවීම සම්බන්ධ රුක් රෝපණ ව්‍යාපෘති හා ශ්‍රමදාන සිදු කිරීම.
- SYSCGAA පද්ධතිය දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් අධීක්ෂණය හා යාවත්කාලීන කිරීම.

2.1.3.2. ප්‍රාදේශීය පාලන අංශය

- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන සියලුම ක්ෂේත්‍ර නිලධාරීන්ගෙන් කාර්යක්ෂම හා ඵලදායී මහජන සේවාවක් ලබා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක (Action Plan) මාර්ගෝපදේශනයක් සකස් කිරීම හා එම මාර්ගෝපදේශන සැලැස්ම සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ක්‍රියාත්මක කිරීම හා යොමු කිරීම.
- ගෘහ ආර්ථිකය,පෝෂණය වැඩි දියුණු කර පවුල් ඒකක බල ගැන්වීමේ ජාතික ගෙවතු වගා වැඩසටහනේ අධීක්ෂණ කටයුතු සිදු කිරීම.
- විවිධ සේවාවන්වල ඇති පරිපාලනමය ගැටලු විසඳීමට ඇති අවශ්‍ය පියවර ගැනීම. (සේවා ව්‍යවස්ථාවන්, උසස් කිරීමේ පටිපාටි වැනි දේ පිළියෙළ කිරීම)
- නව සීමා නිර්ණය කමිටුවක් පිහිටුවා ඇති අතර එමඟින් ග්‍රාම නිලධාරී වසම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල සීමා සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලු විසඳීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සිදු කිරීම.
- ප්‍රාදේශීය පරිපාලනයේ සේවයේ නියුතු නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා ව්‍යාපෘතියේ බඳවා ගැනීම් හා පුහුණු කිරීමේ කටයුතුවලට අදාළ කටයුතු අධීක්ෂණය කිරීම.

2.1.3.3. ග්‍රාම නිලධාරී පාලන අංශය

- කුසලතා පදනම් මත පරිපාලන ග්‍රාම නිලධාරී තනතුරට බඳවා ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණ පවත්වා එහි ප්‍රතිඵල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අතර සීමිත පදනම් මත බඳවා ගැනීමට අදාළ විභාගයේ ප්‍රතිඵල ලේඛනය මෙම අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

2.1.4. ඉංජිනේරු අංශය

- 2022 වර්ෂයට සමගාමීව "නිල මැදුර" ගොඩනැගිල්ලෙහි පිරිසිදු කිරීමේ නිලධාරීන් සඳහා වියළි ආහාර මලු ලබා දීමට කටයුතු කරන ලදී.

2.1.5. ක්‍රමසම්පාදන අංශය

- අංශයේ අභ්‍යන්තර මානව හා භෞතික සම්පත් භාවිතයෙන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වාර්ෂික වාර්තා අමතර පිරිවැය දැරීමක් නොරව නිම කිරීම.
    I. වාර්ෂික කාර්යසාධන වාර්තාව

II. වාර්ෂික ප්‍රගති වාර්තාව

- අත්‍යාවශ්‍ය හා හදිසි අවස්ථාවක දී හැර ලිපිද්‍රව්‍ය භාවිතය කාර්යක්ෂම කර ගැනීම සඳහා මෘදු පිටපත් මඟින් සියළුම ලේඛන පරීක්ෂා කිරීමට සියළුම නිළධාරීන් යොමු වීම.

2.1.6. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය

<u>ඉ-ග්‍රාම නිලධාරී (eGN) ව්‍යාපෘතිය යටතේ</u>

- රාජ්‍ය තන්ත්‍රයේ බිම් මට්ටමේ වඩාත් මහජනතාවට සමීප රාජ්‍ය නිලධාරියා ලෙස ග්‍රාම නිලධාරී තනතුරට මෙතෙක් තිබූ පිළිගැනීම් තත්ත්වය ඉහළ යන පරිදි ඔවුන් තොරතුරු සන්නිවේදන තාක්ෂණයෙන් බල ගැන්වීමට කටයුතු කිරීමට හැකි වීම.
- නවීන තාක්ෂණය කෙරෙහි ග්‍රාම නිලධාරීන් හා වෙනත් නිලධාරී කණ්ඩායම්වල තිබූ වැරදි ආකල්ප වඩාත් ධනාත්මක තත්ත්වයක් දක්වා යොමු කරවීමට හැකි වීම. ව්‍යාපෘතිය යටතේ වෙනම පුහුණු සැසි සංවිධානය කර පරිගණක සාක්ෂරතාව අඩු ග්‍රාම නිලධාරීන් 3,500කට අධික සංඛ්‍යාවක් පුහුණු කර ඇත.
- ගෘහ හා පුරවැසි දත්ත එකතු කිරීමට හා යාවත්කාලීන කිරීමට විවිධ රාජ්‍ය ආයතන දරනු ලබන ප්‍රයත්න හා පිරිවැය අවම වන සේ පුළුල් ප්‍රජා පාදක ඉලෙක්ට්‍රානික දත්ත පදනමක් (Community-based electronic database) බිහිකිරීම සඳහා තිරසාර අඩිතාලමක් දැමීමට හැකිවීම. මෙම ගෘහ/පුරවැසි දත්ත එක් කිරීමේ පත්‍රිකාව ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ විශේෂඥයින් ඇතුළු කණ්ඩායමක් විසින් (සිංහල/ඉංග්‍රීසි හා දෙමළ/ඉංග්‍රීසි ලෙස) නිම කර තිබීම.
- 06/2018/10 දිනැති අංක 2018/09 දරන ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛය මඟින් ඉහත දක්වන ලද දත්ත පදනම භාවිතයෙන් ග්‍රාම නිලධාරීන් විසින් නිකුත් කරනු ලබන සහතික පත්‍ර වර්ග 22ක් නිකුත් කිරීමට කටයුතු සළස්වා තිබීම.
- ව්‍යාපෘති නියාමනය හා නායකත්වය සඳහා දිස්ත්‍රික් මට්ටමේ හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ ක්‍රියාකාරී කමිටු පත් කර ඇත. ග්‍රාම නිලධාරී වෘත්තීය සංගම්වල සක්‍රීය දායකත්වය ද මෙම ව්‍යාපෘතියට හිමිව ඇත.
- පුරවැසි පරිශීලකයන්ගේ දත්ත මෘදුකාංගයට ඇතුළත් කිරීමට විශේෂ‘ ඉ-සේවා ’පෝටලය සංවර්ධනය කර ඇත.
- රාජ්‍ය සේවයේ සේවා සම්පාදනය කාර්යක්ෂමව හා මිත්‍රශීලී අයුරින් පවත්වාගෙන යාම සම්බන්ධව ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධක බලකායේ මෙහෙයවීමෙන් පැවති සාකච්ඡාවල නිර්දේශ/තීරණ අනුව ඉ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතියේ යෝජිත දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය කඩිනම් කිරීමටත්, මුළු දිවයිනම ආවරණය වන සේ එම දත්ත රැස් කිරීමටත්, සැලසුම් සකස් කිරීම.
- සියලුම රාජ්‍ය ආයතනවල හා ඒවා යටතේ පවත්නා සියලුම ශාඛා කාර්යාලවල සියලුම රාජ්‍ය නිලධරයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ දත්ත ඉ-ග්‍රාම නිලධාරී පද්ධතියට එකතු කිරීම සඳහා උපදෙස් ලබා දීමට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව චක්‍රලේඛයක් නිකුත් කරන ලදි.
- දැනට අභාවිත ගෘහමූලික ලැයිස්තු ක්‍රමයේ අවශ්‍යතාව සපුරන වඩාත් පිළිගත හැකි ජාතික දත්ත පද්ධතිය ලෙස ඉ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය යටතේ ගොඩනැගෙන දත්ත පද්ධතිය අමාත්‍ය මණ්ඩලය විසින් පිළිගැනීම හා ඒ වෙනුවෙන් ඒකාත්මික ආකාරයේ පොදු ‘ගෘහ ලේඛනයක්’ හඳුන්වා දීම.
- මෙම ව්‍යාපෘතියේ දත්ත පද්ධතිය මඟින් ලබාගන්නා දත්ත රජයේ නිල භාවිතය සඳහා ඉලෙක්ට්‍රොනිකව භාවිතය හා බෙදා හදා ගැනීම සම්බන්ධයෙන් 2006අංක19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ විධිවිධාන පරිදි අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ එක්ව සම්පූර්ණ කර,එකී පනත භාර වත්මන් අමාත්‍යවරයා (තාක්ෂණ) ලෙස අතිගරු ජනාධිපතිතුමන්ගේ අත්සනින් අති විශේෂ ගැසට් නිවේදනයක් ලෙස පල කිරීමට හැකි වීම.

2.2. අභියෝග

2.2.1. පාලන අංශය

- සැලසුම් කළ පරිදි කටයුතු කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොවීම.
- අත්දැකීම් බහුල නිලධාරීන්ගේ හිඟතාවය.
- තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධව නිලධාරීන්ගේ පවතින අවම දැනුම
- සංචාරක බංගලාවන්හී පහසුකම් හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ප්‍රමාණවත් තරම් ප්‍රතිපාදන නොමැති වීම.
- බංගලා භාරකරු/ සහායක බංගලා භාරකරුවන්ට පුහුණුව ලබා දීමට ඇති (මූල්‍යමය අපහසුතා)
- නව සංචාරක බංගලා ස්ථාපිත කිරීමට සුදුසු ස්ථාන සම්බන්ධයෙන් යෝජනා වී තිබුණද ප්‍රතිපාදන හිඟවීම.

2.2.2. සංවර්ධන අංශය

- රටෙහි පවතින මූල්‍ය අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් වෙළෙඳ පොළෙහි ගොඩනැගිලි ද්‍රව්‍යන්හි හිඟයක් පැවතීම හා ඒවායෙහි මිල අධික නිසා අතැම් කාර්යයන් අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීම.

- ජාතික අයවැය චක්‍රලේඛ 05/2019 හි පරිදි නව ව්‍යාපෘති ආරම්භ කිරීමට නොහැකි වීම නිසා 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කිරීමට නොහැකි වීම.
- කාර්තුමය වශයෙන් ප්‍රතිපාදන වෙන් කිරීම හේතුවෙන් නියමිත කාර්තුව තුළ ප්‍රසම්පාදන කටයුතු හා අලුත්වැඩියා කාර්යයන් අවසන් කිරීමට නොහැකි වීම.

2.2.3. මූල්‍ය අංශය

- අදාළ අංශවලින් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් නියමිත වේලාවට පුරෝකථනය කරන ලද තොරතුරු එක්රැස් කිරීමේ දුෂ්කරතා.
- සමහර පුරෝකථන මිනුම් මූල්‍ය වාර්තාකරණය සඳහා සුදුසු නොවීම.
- මූල්‍ය කාර්ය සාධන තොරතුරු නොමැතිවීම.
- නිසි ගෙවීම් පද්ධතියක් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම.
- ගෙවීම් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය ලියකියවිලි සමඟ සම්පූර්ණ කරන ලද වවුචර් ඉදිරිපත් නොකිරීම.
- වර්ෂය සඳහා වන සියළුම වියදම් පියවා ගැනීම සඳහා භාණ්ඩාගාරය වෙන් කරන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
- තාක්ෂණික ඇගයීම් කමිටු සහ ප්‍රසම්පාදන කමිටු සඳහා සුදුසු දිනයන් සහ වේලාවන් සොයා ගැනීම දුෂ්කර වීම.
- අංශවලින් ලැබෙන හදිසි ඉල්ලීම් සපයා දීම අසීරු වීම.

2.2.4. විමර්ශන අංශය

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි පිහිටුවා ඇති විමර්ශන ඒකකවල කටයුතු අක්‍රීයවීම නිසා සෘජුවම අමාත්‍යාංශයට ලැබෙන පැමිණිලි සංඛ්‍යාව ඉහළ යාම.
- විමර්ශන කටයුතු සිදුකිරීමේදී නිලධාරීන්ගේ පෞද්ගලික ආරක්ෂාවට අභියෝග එල්ලවීම.
- අනෙකුත් රාජ්‍ය ආයතනයන්ගෙන් තොරතුරු ලබා ගැනීමේදී ඇතිවන බාධා. උදා: ශ්‍රී ලංකා පොලීසිය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසන් සභාව

- දෙමළ මාධ්‍ය පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීමේදී භාෂා පරිවර්තනයෙහි ගැටලු පැන නැගීම.
- ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් නොමැති වීම හේතුවෙන් අපේක්ෂිත දිස්ත්‍රික් වැඩමුළු සහ කාර්යාල පරීක්ෂණ සිදුකර ගැනීම අභියෝගයක් වීම. (වර්තමාන ඉන්ධන අර්බුදය හේතුවෙන්)
- වර්තමාන ඉන්ධන අර්බුදය හේතුවෙන් විමර්ශන නිලධාරීන්ට රාජකාරී සඳහා දුරබැහැර දිස්ත්‍රික්ක වලට යාමේදී ප්‍රවාහන දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවීම.

2.2.5. ස්වදේශ කටයුතු අංශය

2.2.5.1. දිස්ත්‍රික් පාලන අංශය

- අංශයෙහි රාජකාරී කටයුතු ඉටු කිරීමේදී, රටෙහි පැවති අර්බුදකාරී තත්වය හමුවේ වුවද රාජකාරී කටයුතු නියමිත පරිදි අප්‍රමාදීව ඉටු කිරීමේ අභියෝගයක් පැවති අතර අංශයට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව මත අදාළ රාජකාරී කටයුතු නිසි පරිදි ඉටු කරන ලදී.

2.2.5.2. ග්‍රාම නිලධාරී පාලන අංශය

- පැවති කොරෝනා තත්වය හමුවේ විභාග කල්යාම හේතුවෙන් විභාග දෙපාර්තමේන්තුවේ කාර්ය බහුලත්වය මත කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම සම්බන්ධයෙන් දින නියම කර නොමැති අතර බඳවා ගැනීම් භාණ්ඩාගාර චක්‍රලේඛ 03/2022 උපදෙස් පරිදි තාවකාලිකව නතර කර තිබීම.
- ග්‍රාම නිලධාරීන් 2500 ට අධික පුරප්පාඩු ප්‍රමාණයක් පැවතියද දැනට සේවයේ නිරත ග්‍රාම නිලධාරීන් මඟින් කාර්යක්ෂම මහජන සේවාවක් සහතික කිරීම.
- පවතින ආර්ථික හා සමාජ අර්බුදය හමුවේ ග්‍රාම නිලධාරී කාර්යාල පරීක්ෂාව සඳහා ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමට අපහසු වීම හේතුවෙන් අඛණ්ඩව එම අධීක්ෂණ කටයුතු සිදු කළ නොහැකි වීම.

2.2.6. ඉංජිනේරු අංශය

- කාර්යය මණ්ඩල හිඟකම.
- ව්‍යාපෘති කළමනාකරණ කටයුතු හා ක්ෂේත්‍ර අධීක්ෂණ කටයුතු සිදු කිරීමට ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් නොමැති වීම.
- ඉදිකිරීම් කර්මාන්තයේ ද්‍රව්‍ය හිඟය හේතුවෙන් ඉදිකිරීම් කර්මාන්ත ප්‍රගතිය පසුබෑමට ලක්වීම.
- ආර්ථික අර්බුදය හමුවේ ඉදිකිරීම් ද්‍රව්‍ය වල මිල උච්ඡාවචනය වීමෙන් ඉදිකිරීම් කර්මාන්තය දැඩි අභියෝගයකට ලක්වීම.
- ඉදිකිරීම් ව්‍යාපෘති වල ප්‍රගතිය නිවැරදිව නිසි පරිදි නොලැබීම.
- "නිල මැදුර"ගොඩනැගිල්ලෙහි මෙහෙයුම්,නඩත්තු හා අලුත්වැඩියාවන් සිදු කිරීම සඳහා ද්‍රව්‍ය හිඟය සහ මූල්‍ය ප්‍රවාහයක් නොමැතිවීම හා ගෙවීම ප්‍රමාද වීම. ගෙවීම් ප්‍රමාදය නිසා වෙනත් පාර්ශවයවයන් සමඟ තිබෙන විශ්වාසය පළුදු වීම.
- දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් මඟින් නවීන තාක්ෂණික දැනුම ඉංජිනේරු අංශයෙහි විධායක නිළධාරීන්ට ලබාදීමේදී ගැටලු මතුවීම.

- භාණ්ඩ මිලදි ගැනීම් වලදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය, මිලදී ගැනීමෙන් පසු අවසන් වුවද ඉදිකිරීම් කළමනාකරණයේදී සන්තතිකව ප්‍රසම්පාදන කටයුතු සිදුවන බැවින් එම කාර්යයභාරය වෙනත් අංශයක් වෙත පවරා තිබීමෙන් සැලකිය යුතු කාල ප්‍රමාදයක් සිදුවීම.

2.2.7. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය

<u>ඉ-ග්‍රාම නිලධාරි (eGN) ව්‍යාපෘතිය යටතේ</u>

- ග්‍රාම නිලධාරීන් වෙත ප්‍රසම්පාදිත ටැබ් පරිගණක යන්ත්‍ර හා පරිගණක මුද්‍රණ යන්ත්‍ර සැපයීමේ ප්‍රසම්පාදනය අනපේක්ෂිත ලෙස කල් ඉකුත් වීම හා සෙසු ප්‍රායෝගික තත්ත්වයන් මත අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් අවලංගු කිරීමට සිදු වීමෙන් පසු විකල්ප යෝජනා ද සමගින් අදාළ අමාත්‍යාංශයට යොමු කළ ද, අදාළ මණ්ඩල තීරණය සම්බන්ධයෙන් පත් කළ නිලධාරී කමිටුවේ නිර්දේශ ලබා ගෙන එම කාර්යය සම්පූර්ණ කිරීම සඳහා වඩාත් සඵලදායී හා පිරිවැය සඵලදායී විකල්ප ක්‍රමවේද හඳුනාගත යුතු වීම.
- මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා අවශ්‍ය සංකල්ප හා නිර්මාණ කටයුතුවලින් කොටසක් පමණක් සැලසිනේ ආයතනය විසින් ලබා දී ඇති නමුත්, අනපේක්ෂිත සමාජ, ආර්ථික හා දේශපාලනික තත්ත්වයන් නිසා වඩාත් සඵලදායී සන්නිවේදන ක්‍රමයක් ජාතික හා ග්‍රාමීය ආරම්භ කිරීමට නොහැකි වීම.
- Covid-19 වැනි පෙර නොවූ විරූ අනපේක්ෂිත තත්ත්වයන් නිසා ඇති වූ ආයතනික හා ප්‍රසම්පාදන ගැටළු මෙන්ම ඇතැම් බාහිර පාර්ශවකාර රාජ්‍ය ආයතනවලින් අපේක්ෂිත සහාය නිසි කලට නොලැබීම නිසා ව්‍යාපෘතියේ සමස්ත ක්‍රියාත්මක කිරීම සඳහා බලපෑම් ඇති වීම.

<u>යාපනය ප්‍රදේශය තුළ ඉන්කියුබේටර් / ඇක්සලරේටර් සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම ව්‍යාපෘතිය යටතේ</u>

- ඉන්කියුබේටර් පවත්වා ගෙන යාම සඳහා ප්‍රමාණවත් රජය සතු ඉඩකඩ සහිත ගොඩනැගිලි යාපනය නගරයේ හඳුනා ගැනීම දුෂ්කර වීම.
- ඉන්දීය රජයේ මූල්‍යාධාර ලබාගැනීම සඳහා දැනට දෙරට අතර අත්සන් කර ඇති, 2022 පෙබරවාරි මස කල් ඉකුත්ව ඇති අවබෝධතා ගිවිසුම විධිමත්ව අලුත් කර දීර්ඝ කර ගැනීමට සිදුව තිබීම.
- Covid-19 වැනි පෙර නොවූ විරූ අනපේක්ෂිත තත්ත්වයන් නිසා ඇති වූ ආයතනික හා ප්‍රසම්පාදන ගැටළු.

<u>"ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ සහාය" ව්‍යාපෘතිය යටතේ</u>

- ව්‍යාපෘතිය ඒකාබද්ධ අරමුදලින් ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ගැනීමට නොහැකි වීම නිසා විකල්ප මූලාශ්‍ර සෙවිය යුතු වීම.
- දැනට අරමුදල් සම්පාදනයට සහාය පල කර ඇති UNDP වෙතින් එවා ඇති ගිවිසුම් පිටපත නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර අනුමැතිය ලබා ගත යුතු වීම.

2.3. අනාගත ඉලක්ක

2.3.1. පාලන අංශය

- මානව හා භෞතික සම්පත් කාර්යක්ෂමව හා සඵලදායිව භාවිත කිරීම තුළින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම.
- ඉතා කෙටි කාලයක් තුළ තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු ඉල්ලා සිටින අය වෙත ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතාවය සපුරාලීම.
- අමාත්‍යාංශය තුළ සේවය කරන නිලධාරීන්ගේ දේශීය-විදේශීය පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ සැලසුම්ගත පුහුණු වැඩසටහන් සියල්ල නියමිත කාලය තුළ අවසන් කිරීම.
- 2023 වර්ෂය අවසන් වීමට පෙර සංචාරක නිවාස වෙන්කිරීම සඳහා ගෙවීම් මාර්ගගතව සිදු කිරීමේ පහසුකම ලබාදීම.
- ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවය කරනු ලබන සියලු නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු ආශ්‍රිත තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සැකසීම.

2.3.2. සංවර්ධන අංශය

- රු 433.40 .මිලි.ක වියදමින් දැනට උප කාර්යාලයක් ලෙස පවත්වාගෙන යන මාදම්පාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස ස්ථාපිත කිරීම.
- කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව තෙමහල් ගොඩනැගිල්ල රු .මිලි.242. 00 ක වියදමින් ඉදිකිරීම.
- කුලියාපිටිය නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව තෙමහල් ගොඩනැගිල්ල රු248.00 .මිලි. ක වියදමින් ඉදිකිරීම.
- ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව තෙමහල් ගොඩනැගිල්ල රු 307.00 .මිලි. ක වියදමින් ඉදිකිරීම.
- රු 1,991.00.මිලි.ක වියදමින් අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිපාලන සංකීර්ණය ඉදිකිරීම.

- රු 1,150.00.මිලි.ක වියදමින් දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ල ඉදිකිරීම.
- මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දෙවන අදියර රු 328.00 .මිලි.ක වියදමින් ඉදිකිරීම.
- කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දෙවන අදියර රු 565.00 .මිලි.ක වියදමින් ඉදිකිරීම.

2.3.3. මූල්‍ය අංශය

- අදාළ ආයතනවල සියලු මට්ටම් සඳහා, ඵලදායී, වගවීමක් සහ විනිවිදභාවයකින් යුතු නිමැවුමක් ලබා දීම.
- කාර්යක්ෂම හා ඵලදායී ගෙවීම් පද්ධතියක් වැඩිදියුණු කිරීම.
- ආයතනයේ කාර්යක්ෂම සේවාවක් සහතික කිරීම සඳහා නිසි ප්‍රමිතියෙන් හා ප්‍රමාණයෙන් නිසි වේලාවට නිසි භාණ්ඩ හා සේවා සැපයීම.
- ස්වදේශ කටයුතු අංශය, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අරමුදල් කළමනාකරණය වඩාත් කාර්යක්ෂම කිරීම.

2.3.4. විමර්ශන අංශය

- මානව හා භෞතික සම්පත් පුළුල් කිරීම.
- නිලධාරීන්ගේ සේවා තෘප්තිය නංවාලීම සඳහා විධිමත් උසස් කිරීමේ පටිපාටියක් ඇති කර නිලධාරීන් එක් එක් ශ්‍රේණි වෙත අන්තර්ග්‍රහණය කිරීම.
- කාර්යාල පරීක්ෂණ පුළුල් කිරීම.
- දිස්ත්‍රික් විමර්ශන ඒකක ශක්තිමත් කිරීම.
- සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම අඛණ්ඩ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඔවුන් සඳහා අදාළ වන උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීම.
- පැමිණිල්ල මෙහෙයවීම හා සාක්ෂි ලබාදීමේ කටයුතුවල තත්ත්වයන් ඉහළ නැංවීමට වැඩපිළිවෙලක් සැකසීම.
- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පාලන ව්‍යුහයට අයත් රාජ්‍ය ආයතනවල වංචා හා දූෂණ වැළැක්වීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීම.
- දුරකථන මඟින් ඉදිරිපත්වන මහජන පැමිණිලි සහ සෙසු පැමිණිලි සඳහා පසුවිපරම් ක්‍රියාවලියක් හඳුන්වා දීම.

2.3.5. ස්වදේශ කටයුතු අංශය

2.3.5.1. දිස්ත්‍රික් පාලන අංශය

- ඉදිරියේදී පැවැත්වීමට නියමිත 75 වන නිදහස් දින සමරු උළෙල අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට කටයුතු සංවිධානය කිරීම.
- ඒකාබද්ධ ප්‍රවේශයක් සහ ජනතාවට වඩා සමීප වූ රාජ්‍ය සේවාවක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම.
- නවීන තොරතුරු තාක්ෂණික සම්බන්ධතාවය ශක්තිමත් කරමින් දිස්ත්‍රික් පරිපාලනය ශක්තිමත් කිරීම.

2.3.5.2. ප්‍රාදේශීය පාලන අංශය

- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ආයතන හා පරිපාලනමය කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා SYSCGAA පද්ධතිය හඳුන්වාදීම හා සංවර්ධනය කිරීම.
- ප්‍රාදේශිය පරිපාලනයේ නිලධාරීන්ගේ තොරතුරු ප්‍රවර්ධනය සඳහා Nextgen gov වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල කළමනාකරණ තරඟයක් තුළින් ප්‍රමුඛතාගත කිරීම.
- ප්‍රාදේශීය පරිපාලනයේ නිලධාරීන්ගේ තොරතුරු තාක්ෂණය සම්බන්ධ ධාරිතාවය ඉහළ නැංවීම සඳහා ICTA ආයතනය සමඟ එක්ව පවත්වන "ICTA Nextgen gov" වැඩසටහන
- "අලුත් ගමක් - අලුත් රටක්" ජාතික ඒකාබද්ධතා සහභාගීත්ව සංවර්ධන වැඩසටහන
- ඵලදායී ලෙස රජයේ ඉඩම් පරිහරණය කිරීම සඳහා රැකියා විරහිත තරුණ තරුණයින් යොදවා ගැනීමේ වැඩසටහන (2022 අතුරු අයවැය යෝජනා 21.6 ක්‍රියාත්මක කිරීම)

2.3.5.3. ග්‍රාම නිලධාරී පාලන අංශය

- පවතින පුරප්පාඩු සඳහා ග්‍රාම නිලධාරීන් හා පරිපාලන ග්‍රාම නිලධාරීන් කඩිනමින් බඳවා ගැනීම මෙම අංශයෙහි ප්‍රධාන ඉලක්කයකි. මෙහිදී ග්‍රාම නිලධාරි තනතුරට දැනට රාජ්‍ය සේවයේ සිටින සුදුසුකම් ලත් නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීම සඳහා මෙම අමාත්‍යාංශය විසින් යෝජනාවක් ඉදිරිපත් කර ඇත.

2.3.6. ඉංජිනේරු අංශය

- සේවාදායකයන්ට / භාවිතාකරන්නන්ට සහ මහජනතාවට මනා ලෙස ප්‍රතිචාර දැක්වීමත්, තෘප්තිමත් රාජ්‍ය සේවයක් සැපයීමට ඉඩ සැලසෙන පරිදි කාර්යාල ව්‍යුහය සංවර්ධනය කිරීම.
- ඉදිකිරීම් ව්‍යාපෘති වල ප්‍රගතිය සමාලෝචනය සඳහා නව තාක්ෂණික ක්‍රමවේදයක් අනුගමනය කිරීම.
- සියලුම දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් සිදු කෙරෙන ඉදි කිරීම් ව්‍යාපෘති කටයුතු අධීක්ෂණය සහ තාක්ෂණික උපදෙස් ලබා දීම.
- ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන වෙන් කරනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘති හා රාජ්‍ය උත්සව සම්බන්ධයෙන් ඉංජිනේරුමය කටයුතු, අනෙක් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම.

- දිස්ත්‍රික් ඉංජිනේරුවරුන් හා වාස්තු විද්‍යාඥයින් උසස්වීම්, වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම හා වරලත් තත්ත්වය ලබා ගැනීමේ කටයුතු සඳහා පහසුකම් සැපයීම, තාක්ෂණික කාර්යය මණ්ඩලවල පුහුණු අවශ්‍යතා සපුරාලීමට කටයුතු කිරීම සහ ඔවුනට අවශ්‍ය ඉංජිනේරුමය හා තාක්ෂණික ක්‍රියාකාරකම් සංවිධානය කොට මෙහෙය වීම.
- රාජ්‍ය සේවා නිලධාරීන්ට විවේක කාලය තෘප්තිමත්ව ගත කිරීම සඳහා සංචාරක බංගලාවල පහසුකම් වැඩි දියුණු කිරීම.
- මෙම අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශයට අයත් සියලුම සංචාරක බංගලාවල ඉදිකිරීම් ව්‍යාපෘති හා නඩත්තු කටයුතු ක්‍රියාත්මක කිරීමට අදාළ තාක්ෂණික උපදේශනය ලබා දීම.

2.3.7. ක්‍රමසම්පාදන අංශය

- විදේශ ගත හැකියා සහිත පිරිස් ග්‍රාමීය මට්ටමින් හඳුනාගෙන විදේශගත අතදෙන්නන්ගේ පොකුර නමින් ඔවුන් හරහා ගම දියුණු කිරීමට අවශ්‍ය සහය ලබා ගැනීම.
- අලුත් ගමක් අලුත් රටක් සංකල්පය ඔස්සේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත බිම් මට්ටම දක්වා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා එම ඒකාබද්ධ සහභාගීත්ව ජාතික සංවර්ධන වැඩසටහනට අවශ්‍ය ප්‍රතිපත්තිමය මග පෙන්වීම හා ප්‍රගති පාලනයට අදාළ කටයුතු සිදු කිරීම.

2.3.8. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය

- තිරසාර පුරවැසි සේවා සැපයීම් ක්‍රමවේදයක් උදෙසා පුළුල්, විශ්වාසනීය ඒකීය ගෘහ හා පුරවැසි දත්ත සමුදායක අවශ්‍යතාවය රාජ්‍ය ආයතන වෙත අවබෝධ කරවීම. මෙම අවශ්‍යතාව ‘ඉ-ග්‍රාම නිලධාරි’ (eGN) ව්‍යාපෘතිය හරහා ඉටු වන අතර, මෙම ව්‍යාපෘතියේ නියමු අදියරේ සාර්ථකත්වයෙන් පසු ආරම්භ කළ දෙවැනි අදියර මගින් 14,022ක් වූ මුළු ග්‍රාම නිලධාරි කොට්ඨාශවලින් තෝරාගත් දිස්ත්‍රික්ක 7ක සියලුම ග්‍රාම නිලධාරි වසම් වෙත මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කෙරේ. එලෙසම, ගෘහ හා පුරවැසි දත්ත එක්රැස් කිරීමට අදාළ ආකෘති පත්‍ර, අනෙකුත් රාජ්‍ය ආයතන ඇතුළු පාර්ශවවල අවශ්‍යතා ද සළකා නැවත නිර්මාණය කර ඇති අතර, ඒවා භාවිතයෙන් ගෘහ හා පුරවැසි දත්ත එකතු කිරීමේ පෙරහුරු වැඩසටහන් දෙකක් පවත්වා ඇත. ගෘහ හා පුරවැසි දත්ත එකතු කිරීමේ නිලධාරීන් (ගණුන් ගැනීමේ නිලධාරීන්) පුහුණුව කලුතර දිස්ත්‍රික්කයේ සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආවරණය කරමින් අවසන් කර ඇති අතර, දත්ත එකතු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන අනෙකුත් සියලුම උපකරණ හා ද්‍රව්‍ය මෙම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් බෙදා අවසන් කර ඇත.ගෘහ/පුරවැසි සංඛ්‍යා මූලික ඇස්තමේන්තුවට අදාළ පෝරම හා සෙසු පරිශීලන ලේඛන කොළඹ, පුත්තලම දිස්ත්‍රික්කයන්හි බෙදා හැරීම් කටයුතු අවසන් කර ඇත. හම්බන්තොට, ගාල්ල, මන්නාරම හා ගම්පහ දිස්ත්‍රික්කයන්හි මූලික ඇස්තමේන්තුවට අදාළ පෝරම මුද්‍රණයට හා බෙදා හැරීමට කටයුතු සැලසුම් කර ඇත. මූලික පරිගණක දැනුම අවශ්‍ය ග්‍රාම නිලධාරීන් වෙත ලබා දෙන පුහුණුව සැසිවාර 4ක් යටතේ පවත්වනු ලබන අතර, කලුතර දිස්ත්‍රික්කයේ සැසිවාර 3ක් සම්පූර්ණ කර ඇගයීම් පරීක්ෂණ සඳහා යොමු කර ඇත. පුත්තලම, ගාල්ල, හම්බන්තොට, මන්නාරම දිස්ත්‍රික්කවල මෙම පුහුණුව තව දුරටත් සිදු කිරීමට සැලසුම් කර ඇත.
- යාපනය ප්‍රදේශය තුළ ඉන්කියුබේටර්/ ඇක්සලරේටර් සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්දීය රාජ්‍ය ආධාර ලෙස මුලින් එකඟ වී තිබූ අරමුදල් සක්‍රීය කරවා ගැනීමට ව්‍යා. මෙහෙයුම් කමිටුවට/ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයට අවශ්‍ය මූලික වාර්තා සැකසීමට දේශීය අරමුදල් සංරචකය යොදා උපදේශන ආයතනයක් ප්‍රසම්පාදනය කරන ලදී. මේ පිළිබඳව වන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර එම උපදේශන ආයතනයේ කටයුතු නිල වශයෙන් ආරම්භ කර ඇත. යෝජිත ව්‍යාපාර මධ්‍යස්ථානය පිහිටුවීමට වඩාත් සුදුසු ස්ථාන කිහිපයක් යාපනය දිස්ත්‍රික් ලේකම්ගේ සහාය ඇතිව එම උපදේශන සමාගම විසින් නිර්දේශ කර ඇත.
- 2021වසරේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද ‘ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ සහාය’ ව්‍යාපෘති යෝජනාව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ උපදෙස් මත තවදුරටත් වැඩි දියුණු කිරීමට පියවර ගෙන ඇත. UNDP ආයතනය විසින් මේ සඳහා අරමුදල් සම්පාදනයට කැමැත්ත පල කළ ද, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ හා ජනාධිපති කාර්යාලයීය චක්‍රලේඛ/නිර්දේශ මත UNDP සමග වූ ද්විපාර්ශවීය ගිවිසුම් වැඩිදුර අධ්‍යයනය සහ අනුමැතිය සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදි.



ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
කේ.ඩී.එන්.රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

04. කාර්යසාධන දර්ශක

#	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100% - 90%	89%-75%	74%-50%
1	අළුත්වැඩියා කරන ලද වාහන සංඛ්‍යාව	√		
2	අළුත්වැඩියා කරන ලද සංචාරක බංගලා සංඛ්‍යාව			√
3	අමාත්‍යාංශයේ මානව සම්පත් ඵලදායිතාවය වැඩිකිරීම වෙනුවෙන් දේශීයව පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව සහ විදෙස් පුහුණු සංඛ්‍යාව			√
4	තොරතුරු පනත යටතේ ලද ඉල්ලීම් වෙනුවෙන් යොමු කළ පිළිතුරු සංඛ්‍යාව	√		
5	මහජන පැමිණිලි සම්බන්ධයෙන් ගැනීමට හැකි වූ පියවර සංඛ්‍යාව	√		
6	මාර්ගගතව සංචාරක බංගලා වෙන් කිරීමේ පහසුකම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබාදීම, වෙන්කිරීම් තොරතුරු සේවාලාභීන්ට දුරකථන පණිවුඩයකින් දැනුම්දීම සහ සේවාලාභී ප්‍රතිපෝෂණ ලබා ගැනීම යන අවශ්‍යතා ඉටුවන පරිදි සපයන ලද සංචාරක බංගලා වෙන් කිරීම් ගණන.	√		
7	2022.01.01 – 2022.12.31 ගොඩනැගිලි ඉදිකිරීම- 2104	√		
8	2022.01.01 – 2022.12.31 පිබිදෙමු පොලොන්නරුව- 2509	√		
9	2022.01.01 – 2022.12.31ගොඩනැගිලි අලුත්වැඩියාව- 2001			√
10	ඵලදායී සහ වගවීමේ පද්ධතියක් හරහා නීති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම මඟින් මහජන අභිලාෂයන් මූලූන්පත් කරගැනීම සඳහා අයවැය අරමුදල් උපයෝජනය	√		
11	නියමිත දින හෝ ඊට පෙර වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම	√		
12	වත්කම් කළමනාකරණ සැලසුම සහ භාණ්ඩ සමීක්ෂණය මඟින් ඵලදායී සහ කාර්යක්ෂම ලෙස වත්කම් කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම	√		
13	අයවැය මඟින් ප්‍රසම්පාදනය සඳහා වෙන් කරන ලද අරමුදල්වල ප්‍රශස්ත භාවිතය			√
14	අදාළ බලධාරීන් වෙත කාර්යක්ෂම වාර්තාකරණ පද්ධතියක් පවත්වාගෙන යාම	√		
15	පැමිණිල්ල ලද බවට පැමිණිලිකරු දැනුවත් කිරීම	√		
16	නිශ්චිත කාලයක් තුල දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් මඟින් වාර්තා කැඳවීම. අවශ්‍ය ඒවා සඳහා ක්ෂේත්‍ර පරීක්ෂා සිදු කිරීම		√	
17	වාර්තාවේ සඳහන් කරුණු අනුව පැමිණිලිකරුට පිළිතුරු යැවීම හා/හෝ අවශ්‍යතාව පරිදි අදාළ බලධාරීන් දැනුවත් කිරීම.	√		
18	පැමිණිල්ල සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදුකරන බවට තීරණය කර, ඒ සඳහා විමර්ශන නිලධාරීන් වෙත බලය පවරා ලිපි සැකසීම.	√		
19	අදාළ විමර්ශන නිලධාරීන් විසින් නිශ්චිත කාලයක් තුළ විමර්ශන පැවැත්වීම	√		
20	මූලික විමර්ශන වාර්තාව/ චෝදනාපත්‍ර කෙටුම්පත් සහිත මූලික විමර්ශන වාර්තාව සකස් කර මාණ්ඩලික නිලධාරීන්ගේ අනුමැතියට ඉදිරිපත් කිරීම		√	
21	මාණ්ඩලික නිලධාරීන්ගේ අනුමැතිය අනුව ලබාදෙන තීරණය අදාළ පාර්ශව වෙත දැනුම් දීම හෝ චෝදනා පත්‍ර කෙටුම්පත් විනය බලධාරීන් වෙත යැවීම			√
22	විධිමත් විනය පරීක්ෂණයක දී පැමිණිල්ල මෙහෙයවන නිලධාරියා ලෙස කටයුතු කිරීම.	√		
23	විධිමත් විනය පරීක්ෂණ සඳහා සාක්ෂි ලබාදීම	√		
24	*කාර්යාල පරීක්ෂණ පැවැත්වීම.			
25	දිස්ත්‍රික් මට්ටමින් වැඩමුළු පැවැත්වීම	√		
26	ප්‍රාදේශීය පරිපාලනයේ නියුතු නිලධාරීන්ගේ ආයතනික කටයුතු විධිමත් ලෙස ඉටු කිරීම.	√		
27	සීමා නිර්ණය කටයුතු කිරීම.	√		
28	ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් නව ව්‍යවසාකයින් බිහි කිරීම හා දරිද්‍රතාවයෙන් පෙළෙන පවුල් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම.			√

#	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100% - 90%	89%-75%	74%-50%
29	විධිමත් පැමිණිලි කළමනාකරණ ක්‍රියාපටිපාටියක් ක්‍රියාත්මක කිරීම විධිමත් කිරීම.	√		
30	මාණ්ඩලික නිලධාරීන්ගේ දේශීය පශ්චාත් උපාධි පාඨමාලාවන් සඳහා ගෙවීම් සිදුකිරීම.	√		
31	ප්‍රාදේශීය පරිපාලනයේ නියුතු නිලධාරීන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරීම.			√
32	ප්‍රාදේශීය පරිපාලනයේ නියුතු නිලධාරීන්ගේ උසස් කිරීම් ලිපි නිකුත් කිරීම විධිමත්ව ක්‍රියාත්මක කිරීම.	√		
33	විදේශ නිවාඩු ඉල්ලීම් අනුමත කිරීම කාර්යක්ෂම කිරීම.	√		
34	විශ්‍රාම ගැන්වීම් අනුමත කිරීමට කාර්යක්ෂම ක්‍රියාපටිපාටියක් ක්‍රියාත්මක කිරීම.	√		
35	විශ්‍රාමික ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා වාහන බලපත්‍ර නිකුත් කිරීම.	√		
36	ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීම			√
37	පරිපාලන ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීම		√	
38	ග්‍රාම නිලධාරීන් සේවයේ ස්ථිර කිරීම	√		
39	ග්‍රාම නිලධාරීන් විශ්‍රාම ගැන්වීම	√		
40	ග්‍රාම නිලධාරීන් උසස් කිරීම	√		
41	ග්‍රාම නිලධාරී දින පොත	√		
42	කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම			√
43	ග්‍රාම නිලධාරී කාර්යාල හා රාජකාරී පරීක්ෂා කිරීම.		√	
44	අමාත්‍යාංශයට අදාළව වර්ෂය සඳහා විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පැවැත්වීම.		√	
45	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 103 ක් සඳහා කමිටු සාමාජික ලෙස සහභාගී වීම.	√		
46	විගණන සැලැස්මෙහි දැක්වෙන විගණනයන් පදනම් වූ විගණන වාර්තා සංඛ්‍යාව	√		
47	දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල විගණන වාර්තා පසුවිපරම තුලින් නිකුත් කළ ලිපි සංඛ්‍යාව	√		
48	ප්‍රධාන අභ්‍යන්තර විගණක වරුන්ගේ කාර්තු වාර්තා තුලින් ඒකාබද්ධ කාර්තුගත වාර්තාවක් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.	√		
49	මිලදී ගැනීම් වලට (ප්‍රසම්පාදන) අදාළව සිදුකල විගණනයන් සංඛ්‍යාව	√		
50	ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන වෙන් කරනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘති		√	
51	දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම		√	
52	දිස්ත්‍රික් ඉංජිනේරු, තාක්ෂණ නිලධාරී සහ තාක්ෂණ සහායක නිලධාරීන්ගේ වෘත්තීයමය කාර්යභාර්ය අධීක්ෂණය	√		
53	"නිල මැදුර" ගොඩනැගිල්ලේ මෙහෙයුම්, නඩත්තු හා අලුත්වැඩියාවන් සිදු කිරීම	√		
54	සංචාරක බංගලා නඩත්තු හා අලුත්වැඩියාවන් අධීක්ෂණය කිරීම		√	
55	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	√		
56	ප්‍රගති සමාලෝචනය - ජාතික මට්ටම/ දිස්ත්‍රික් මට්ටම	√		
57	වාර්ෂික කාර්ය සාධන වාර්තාව සැකසීම	√		
58	වාර්ෂික අයවැය සඳහා අමාත්‍යාංශයේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම	√		
59	ජාතික මට්ටමේ සම්පත් පැතිකඩ සකස් කිරීම			√
60	ඉ-ග්‍රාම නිලධාරි' ව්‍යාපෘතිය මඟින් පහසුකම් සපයනු ලබන ග්‍රාම නිලධාරීන් සංඛ්‍යාව		√	

* පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් ප්‍රවාහන දුෂ්කරතා මත අපේක්ෂිත මට්ටමේ කාර්යාල පරීක්ෂණ පැවැත්වීමට නොහැකි වීම.

5.තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

#	අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	ළඟා කර ගෙන ඇති ප්‍රගතිය		
				0%-49%	50%-74%	75%-100%
1	8. සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම.	8.2 නවීන තාක්ෂණය උපයෝගි කරගනිමින් ඵලදායී රාජ්‍ය සේවයක් ඇති කිරීම.	• අමාත්‍යාංශයේ මානව සම්පත් ඵලදායිතාවය වැඩිකිරීමට නිලධාරීන් 456 දෙනෙකු සඳහා ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 14කි.		√	
			• ජාත්‍යන්තර දැනුම පිරිපුන් නිලධාරීන් පිරිසක් ඇති කිරීම සඳහා අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල නිලධාරීන් වෙනුවෙන් ලබා දුන් කෙටි කාලීන පුහුණු සංඛ්‍යාව 3කි. දිගු කාලීන විදේශ පුහුණු සඳහා අයදුම්පත් පමණක් යොමු කර ඇත.		√	
2	9. සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම.	9.1 අමාත්‍යාංශය සතු යටිතල පහසුකම් ඉහළ ගුණාත්මකභාවයෙන්, විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන පරිදි සංවර්ධනය කිරීම.	• වර්ෂය තුළ වෙන් වූ ප්‍රතිපාදන අනුව අළුත්වැඩියා කරන ලද සංචාරක බංගලා සංඛ්‍යාව 09කි.			√
			• අලුත්වැඩියා කර නව සංචාරක බංගලා ලෙස වෙන්කිරීම් කළ සංචාරක බංගලා සංඛ්‍යාව 03කි. (දඹුල්ල-පැල්වෙහෙර, දෙනියාය, බදුල්ල 02,)			√
		9. a වැඩි දියුණු කළ මූල්‍ය, තාක්ෂණික හා තාක්ෂණ සහය තුළින් තිරසාර හා මනා ඔරොත්තු දීමේ හැකියාවෙන් යුතු යටිතල පහසුකම් සංවර්ධනයට පහසුකම් සැපයීම.	• වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉතිරි වැඩ නිම කිරීම.			√
			• මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉතිරි වැඩ නිම කිරීම.			√
			• වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉතිරි වැඩ නිම කිරීම.			√
			• ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉතිරි වැඩ නිම කිරීම.			√
			• ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉතිරි වැඩ නිම කිරීම.			√
3	11. නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම.	11. a ජාතික සහ කලාපීය සංවර්ධන සැලසුම් ශක්තිමත් කිරීම මඟින් නාගරික, උප නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල ධනාත්මක ආර්ථික, සමාජයීය සහ පරිසරාත්මක සම්බන්ධතාවලට සහාය දැක්වීම.	• ඉටුකරන ලද ඉල්ලීම් ප්‍රමාණය			√

#	අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	ළඟා කර ගෙන ඇති ප්‍රගතිය		
				0%-49%	50%-74%	75%-100%
4	12. තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් තහවුරු කිරීම	12.7 ජාතික ප්‍රමුඛතාවන් අනුව තිරසර මහජන ප්‍රතිසම්පාදන භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය සතුව පවතින සම්පත් පූර්ණ ධාරිතාවයෙන් යුතුව පවත්වාගෙන යාම.	• අමාත්‍යාංශය සතු වාහන අළුත්වැඩියා කටයුතු අවසන් කළ හැකි වීම.			√
			• ප්‍රසම්පාදන කටයුතු සඳහා අයවැය අරමුදල් උපයෝජන ප්‍රතිශතය	√		
5	16. තිරසර සංවර්ධනය සඳහා වූ සාමකාමී හා අන්තර්ග්‍රහණය වූ සමාජ ප්‍රවර්ධනය හා සැමට සාධාරණය සඳහා ප්‍රවේශය සැපයීම හා වගවීමක් සහිත හා අන්තර්ග්‍රහණය වූ ආයතන ඇති කිරීම	16.5 අල්ලස් හා දූෂණ වංචා සැලකිය යුතු මට්ටමකින් අඩු කිරීම.	• සුපිරිසිදු රාජ්‍ය සේවයක් බිහි කිරීමට ක්‍රියාකාරී වීම.			√
		16.6. සෑම මට්ටමකින්ම ඵලදායී, වගවීම සහ විනිවිදභාවයකින් යුතු ආයතන සංවර්ධනය කිරීම	• නියමිත කාලය තුල අයවැය ඇස්තමේන්තු මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.			√
			• පෙබරවාරි 28 දින හෝ ඊට පෙර මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.			√
			• පෙබරවාරි 28 දින හෝ ඊට පෙර අත්තිකාරම් බී ගිණුම විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.			√
			• 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ කාලරාමුවට අනුව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සම්පූර්ණ කිරීම.			√
		16.7සෑම මට්ටමකින්ම ප්‍රතිචාරාත්මක ඇතුළත් සහභාගිත්ව සහ නියෝජිත තීරණ ගැනීම සහතික කිරීම.	• සුපිරිසිදු රාජ්‍ය සේවයක් බිහි කිරීමට ක්‍රියාකාරී වීම.			√
		16.9 උපත් ලියාපදිංචි කිරීමද ඇතුළුව 2030 වන විට සියලු දෙනාටම නීතිමය අනන්‍යතාවයක් ලබා දීම.	• වයස අනුව, රජයේ බලයලත් ආයතනයක් තුළ තම උපත ලියාපදිංචි කර ඇති වයස අවු.5ට අඩු ළමුන්ගේ ප්‍රමාණය	√		
		16.10 ජාතික නීති පද්ධතියට අනුකූලව මහජනතාවට තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම සහ කාර්යක්ෂම හා විනිවිදභාවයකින් යුතු රාජ්‍ය සේවයක් පවත්වාගෙන යාම.	• තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු සපයන ලද ඉල්ලීම් සංඛ්‍යාව.			√
			• මහජන පැමිණිලි විසඳීම සඳහා ගත් මූලික පියවර සංඛ්‍යාව			√

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

5.2.1. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ

5.2.1.1. සංවර්ධන අංශය

- වලල්ලාවිට හා මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි නව කාර්යාල ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු අවසන් කර මේ වන විට රාජකාරී කටයුතු සිදු කිරීම.
- වත්තල හා ජාදේශීය ලේකම් ඇල ප්‍රා- කාර්යාලයන්හි ගෙවීමට ඉතිරිවපැවති අතැති බිල්පත් ගෙවා අවසන් කිරීම.

5.2.1.2. මූල්‍ය අංශය

- ඉල්ලීම් ප්‍රමාණයට සරිලන අයුරින් ග්‍රාමීය හා ප්‍රාදේශීය පරිපාලන කටයුතු සඳහා ප්‍රතිපාදන සැපයීම.
- නියමිත කාලය තුළදී වාර්ෂික අයවැය සැකසීම.
- නියමිත දිනට පෙර ස්වදේශ කටයුතු අංශයෙහි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.
- නියමිත දිනට පෙර රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම පිළියෙල කිරීම.
- නිවැරදි තීරණ ගනිමින් ස්වදේශ කටයුතු අංශයෙහි ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කිරීම.
- නියමිත කාලය තුළ නිසි වන්කම් කළමනාකරණයක් සිදුකිරීම සහ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකිරීම.

5.2.1.3. විමර්ශන අංශය

- ලැබෙන මහජන පැමිණිලි වර්ගීකණයට ලක් කරමින් මූලික විමර්ශන කඩිනමින් අවසන් කිරීමටහැකිවීම.
- ඇතැම් මහජන පැමිණිලි විසඳීම සඳහා අදාළ පාර්ශව ආයතනය වෙත කැඳවා විසඳුම් ලබාදීමට කටයුතු කිරීම.

5.2.1.4. ඉංජිනේරු අංශය

- ඉදිකිරීම් ව්‍යාපෘති අධීක්ෂණය හා උපදේශනය ලබා දීමට උපදේශන ආයතනයන් සම්බන්ධීකරණය කටයුතු සිදු කිරීම.
- ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාළ සැලසුම් ඇස්තමේන්තු, පිරිවිතර හා විවිධ්‍යතා වාර්තා ආදී ලේඛන නිර්දේශ කිරීම හා අනුමත කිරීම් සිදු කිරිම.
- ගුණාත්වයෙන් යුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිලි සැලසුම් කිරීම.
- දිස්ත්‍රික් කාර්යාලවල නියුතු ඉංජිනේරුවරුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා බාහිර පාර්ශ්වයන්ගේද සහයෝගය ඇතිව වැඩමුළු සංවිධානය කිරීමට හැකි වීම.
- ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ නඩත්තු අංශයේ ක්‍රියාකාරිත්වය විධිමත් කිරීමට හැකි වීම තුළින් සියලු අංශවල නඩත්තු කාර්යයන් ක්‍රමවත් පරිදි සිදු කිරීමට හැකි වීම.
- කාර්මික නිලධාරීන්ගේ හා උසස්වීම් පිළිබඳව පවතින ගැටලුවක් නිරාකරණය කර ගැනීමට සක්‍රීය දායකත්වයක් ලබා දිය හැකි වීම.
- සේවාදායකයාගේ සියලු අවශ්‍යතා ඇතුළත් කරමින් ගෘහ නිර්මාණ සැලසුම් සකස් කිරීම.
- රාජ්‍ය සේවකයින් සඳහා සංචාරක බංගලා වැඩි දියුණු කරමින් පවත්වාගෙන යාම.

5.2.1.5. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය

- අදාළ සියලුම පාර්ශවකරුවන් සම්බන්ධ කර ගනිමින් ආයතනික අරමුණු ලඟා කර ගැනීමට කටයුතු කිරීම හා ව්‍යාපෘති මෙහෙයුම් කමිටු සක්‍රීය කරවීමට හැකි වීම.
- මහජන සේවා වඩාත් කාර්යක්ෂමව ලබා දීම පිණිස ගෘහ හා පුරවැසි තොරතුරු ඉලෙක්ට්‍රොනික දත්ත පද්ධතියකට ඇතුළත් කිරීමට කටයුතු කොට, පුද්ගලිකත්වය ආරක්ෂාවන පරිදි දත්ත හැසිරවීමට කටයුතු කිරීම.
- සේවාලාභීන් හට සේවා ලබා ගැනීම තාක්ෂණය සමඟ මුසු කොට වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ලෙස ලබා දීමට කටයුතු කිරීම.
- ග්‍රාම නිලධාරීන්ගේ සේවා සැපයීම සඳහා පුද්ගල සවිබල ගැන්වීම යටතේ ග්‍රාම නිලධාරීන්ගේ සේවා තත්ත්වය හා වෘත්තීමයභාවය වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම.
- පරිගණක සාක්ෂරතාවකින් යුත් ග්‍රාම නිලධාරීන් පිරිසක් බිහි කිරීම හා ඔවුන් විසින් ඉලෙක්ට්‍රොනිකව කළමනාකරණය කරනු ලබන ගෘහ/පුරවැසි දත්ත සඳහා නීතිමය ආවරණයක් ලබා දීමට අවශ්‍ය නියෝග ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට හැකි වීම.

5.2.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග

5.2.2.1. සංවර්ධන අංශය

- රටෙහි පවතින මූල්‍ය අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් වෙළෙඳ පොළෙහි ගොඩනැගිලි ද්‍රව්‍යාන්හි හිඟයක් පැවතීම හා ඒවායෙහි මිල අධික වීම නිසා අතැම් කාර්යයන් අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීම .
- ජාතික අයවැය චක්‍රලේඛ 2019/05 හි පරිදි නව ව්‍යාපෘති 2022 වර්ෂයේ ආරම්භ කිරීමට

නොහැකි වීම නිසා ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කිරීමට නොහැකි වීම.

- කාර්තුමය වශයෙන් ප්‍රතිපාදන වෙන් කිරීම හේතුවෙන් නියමිත කාර්තුව තුළ ප්‍රසම්පාදන කටයුතු හා අලුත්වැඩියා කාර්යයන් අවසන් කිරීමට නොහැකි වීම.

5.2.2.2. මූල්‍ය අංශය

- වර්ෂය සඳහා වන සියළුම වියදම් පියවා ගැනීම සඳහා භාණ්ඩාගාරය විසින් අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමේ දුර්වලතා.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් සහ අදාල අංශවලින් පුරෝකථනය කල තොරතුරු ලබාගැනීමේ දුර්වලතා.
- රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් නිකුත් කිරීම සඳහා සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් ලද තොරතුරු සමඟ සැසඳීම සඳහා යම් කාලයක් ගත වීම.
- සීමිත අයවැය ප්‍රතිපාදන
- තාක්ෂණ ඇගයීම් කමිටු රැස්වීම් සහ ප්‍රසම්පාදන කමිටු රැස්වීම් සඳහා සුදුසු දිනයන් සහ වේලාවන් වෙන් කිරීම
- අංශවලින් ලැබෙන හදිසි ඉල්ලීම්
- පද්ධති ශේෂය හා වත්කම්වල ශේෂය සමතුලිත කිරීමේ දුෂ්කරතා.

5.2.2.3. විමර්ශන අංශය

- කාර්යාල පරීක්ෂණ හා විමර්ශන කටයුතු කරගෙන යාම සඳහා පවතින නිලධාරී හිඟය.
- කාර්යාල පරීක්ෂණ සඳහා පවතින ප්‍රවාහන පහසුකම් ප්‍රමාණවත් නොවීම.
- දෙමළ භාෂා පරිවර්තන නිලධාරීන් නොමැති වීම.
- මහජන පැමිණිලි විසඳීමට අදාළ පාර්ශව ඇතැම් අවස්ථාවලදී ආයතනයට පැමිණීම ප්‍රතික්ෂේප කිරීම.

5.2.2.4. ඉංජිනේරු අංශය

- රජයේ අරමුදල් තිරසර සංවර්ධනයට අරපිරිමැස්මෙන් යෙදවීමට සාධනීය යෝජනා ඉදිරිපත් කිරීමේදී වෙනත් පාර්ශ්වයන්ගේ ආකල්පමය දිශානතිය ලබාදීම නිසා ඇතිවන ගැටලු.
- ඉදිකිරීම් වල ප්‍රමුඛතාවය නිර්ණය කිරීමේදී සියලු පාර්ශ්වකරුවන්ගේ සාකච්ඡාවලින් ඒකමතික තීරණ වලට එළඹීම ගැටලුකාරී වීම.
- නවීන අංගෝපාංගයන්ගෙන් යුතු කාර්යාල සංකීර්ණ ඉදිකිරීමේදී, ඉදිකල පසු ඒවා ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම හා සේවා කටයුතු සඳහා ඉදිරි සැලසුම් නොමැති වීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම.

5.2.2.5. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය

- ඉලක්ක ලඟා කර ගැනීමට සම්බන්ධිත බාහිර පාර්ශවකරුවන් විශාල ප්‍රමාණයක් සිටීම හා නිසි කලට ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස් කිරීමේ දී ඇති වන ගැටළු
- රාජ්‍ය මූල්‍ය තත්ත්වය මත ප්‍රතිපාදන ලබාදීමේ ප්‍රමාදයන් හා වරින් වර රාජ්‍ය මූල්‍ය කළමනාකරණ චක්‍රලේඛයන් මඟින් ඇති වන සීමාකිරීම් මෙන්ම අමාත්‍ය මණ්ඩලය දක්වා වූ විවිධ ස්ථර වෙතින් සිදු කර ගත යුතු අනුමැතීන් සඳහා කාලය ගත වීම නිසා ප්‍රතිපාදන ඉතිරිවීමේ අභියෝග
- බාහිර ආයතන හා පාර්ශවකරුවන් වෙතින් ප්‍රසම්පාදන කාර්යයන් සිදුකිරීමේදී ඇතිවන ප්‍රමාද.
- ඉ-ග්‍රාම නිලධාරි ව්‍යාපෘතිය මුළු දිවයිනම ආවරණය වන සේ අදියර ලෙස ක්‍රියාත්මක කළ යුතු වීම නිසා කාර්යයන් පෙළ ගැස්වීමේ කළමනාකරණයේ උපායමාර්ග වඩාත් සුපරීක්ෂාකාරීව සිදු කිරීමේ අවශ්‍යතාව
- තාක්ෂණයේ සීමා හා උපාංගවල, බාහිර උපදේශනයේ ශීඝ්‍ර මිල වැඩි වීම් නිසා ඇතැම් ව්‍යාපෘති අංගවල තිරසභාවය පිළිබඳ ගැටලු.
- ව්‍යාපෘතියට තාක්ෂණ සහාය ලබා දෙනු ලබන ICTA ආයතනයේ තිරසරභාවය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව පුරෝකථනය කළ නොහැකි වීම මඟින් සිදුවන අනපේක්ෂිත තත්ත්වයන් කළමනාකරණය කර ගත යුතු වීම.

06.මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ මට්ටම	51	38	13
තෘතිය මට්ටම	8	2	6
ද්විතික මට්ටම	320	299	49
ප්‍රාථමික මට්ටම	140	117	50
මුළු එකතුව	**519**	**456**	**118**

6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපා ඇති ආකාරය

- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් මෙම අමාත්‍යාංශය සඳහා අනුමත කර ඇති කාර්ය මණ්ඩලය 519ක් වන අතර, එම තනතුරු සඳහා මේ වන විට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත හිඟවීම ගැටලුවක්ව පවතී. ඒ අතරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වන මාණ්ඩලික නිලධාරී තනතුරු 12ක් පුරප්පාඩු පවතී.
  - ප්‍රධාන මූල්‍ය නිලධාරී - 01
  - අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) - 01
  - අධ්‍යක්ෂ (සැලසුම්) - 01
  - සහකාර ලේකම් - 01
  - ගණකාධිකාරී - 01
  - පරිශ්‍ර කළමනාකරු - 01
  - වාස්තු විද්‍යාඥ (ගෘහ නිර්මාණ ශිල්පී) - 06
- එමෙන්ම, තෘතීය මට්ටමේ අනුමත තනතුරු අතරින් පහත තනතුරු පුරප්පාඩුව පැවතීම ස්වදේශ කටයුතු අංශයේ රාජකාරී ඵලදායීව හා කාර්යක්ෂම පවත්වා ගෙන යාම සඳහා බාධාවක් ව පවතී.
  - පරිපාලන නිලධාරී - 01
  - භාෂා පරිවර්තක (සිංහල-දෙමළ) - 03
  - තොරතුරුහා සන්නිවේදනතාක්ෂණනිලධාරී 01
- ද්විතික මට්ටමේ අනුමත තනතුරු අතරින් කාර්මික නිලධාරී තනතුරු 01ක් හා කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 47ක් පුරප්පාඩුව පැවතිය ද ඒකාබද්ධ සේවයට අයත් නොවන කළමනාකරණ සහකාර නිලධාරීන් 12ක් අනුයුක්ත කර ඇත. මෙම අමාත්‍යාංශය සඳහා මේ වන විට සංවර්ධන නිලධාරී තනතුරු 203ක් අනුමතව පවතින අතර 2022.12.31 දිනට සංවර්ධන නිලධාරීන් 222 ක් අමාත්‍යාංශය තුළ සේවයෙහි නිරතවන බැවින් අතිරික්ත නිලධාරීන් සංඛ්‍යාව අනුමත කර ගැනීම සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇත.
- ප්‍රාථමික මට්ටමට අයත් අනුමත තනතුරු අතරින් රියදුරු තනතුරු 09ක් පුරප්පාඩු වී පවතී. බංගලා භාරකරු තනතුරු 33ක් හා සහායක බංගලා භාරකරු තනතුරු 33ක් ලෙස තනතුරු 66ක් අනුමතව පවතී. මේ වන විට නිලධාරීන් 60 දෙනෙකු සහායක බංගලා භාරකරු තනතුරේ සේවය කරන අතර ඒ අතරින් සහායක බංගලා භාරකරු II ශ්‍රේණියේ නිලධාරීන් 14 දෙනෙකු බංගලා භාරකරු තනතුරට උසස්වීමට නියමිතය.2019 වර්ෂයේදී බංගලා භාරකරු තනතුර සඳහා PL 2 වැටුප් කේතය යටතේද සහායක බංගලා භාරකරු තනතුර සඳහා වැටුප් කේතය යටතේද සහායක බංගලා භාරකරු තනතුර සඳහා PL 1 වැටුප් කේතය යටතේද බඳවා ගැනීමේ පටිපාටි අනුමත වී ඇති අතර මේ වන විට සේවයේ යෙදී සිටින සියලුම නිලධාරීන් සහායක බංගලා භාරකරු තනතුරට අන්තර්ග්‍රහණය වී ඇත.
- ඒ අනුව, මෙම පුරප්පාඩු තනතුරු සම්පූර්ණ වීමෙන් ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීමට හැකි වන අතර එම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත මේ වන විට දන්වා යවා ඇත. සේවයේ අවශ්‍යතාවය මත අවශ්‍යව පවතින සෙසු තනතුරු අලුතින් ඇති කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් යොමු කර ඇත.

ස්වදේශ කටයුතු අංශයේ 2022.12.31 දිනට සේවයේ නියුතු හා අනුමත කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

#	තනතුරු නාමය	සේවය	ශ්‍රේණිය/ පන්තිය	වැටුප් කේතය	බඳවා ගනු ලබන පදනම (ස්ථිර/ කොන්ත්‍රාත්/ආදේශක/අනියම)	අනුමත කාර්ය මණ්ඩලය	දැනට සිටින සංඛ්‍යාව	වැඩබලන/ රාජකාරී ඉටුකරනු ලබන	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ මට්ටම									
1	ලේකම්			SL 4	ස්ථිර	1	1	-	-
2	අතිරේක ලේකම් (පාලන)	ශ්‍රී.ලං.ප.සේ	විශේෂ	SL 3	ස්ථිර	1	1	-	-
3	අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු)	ශ්‍රී.ලං.ප.සේ	විශේෂ	SL 3	ස්ථිර	1	1	-	-
4	අතිරේක ලේකම් (සංවර්ධන)	ශ්‍රී.ලං.ප.සේ	විශේෂ	SL 3	ස්ථිර	1	1	-	-
5	අතිරේක ලේකම් (විමර්ශන)	ශ්‍රී.ලං.ප.සේ	විශේෂ	SL 3	ස්ථිර	1	1	-	-
6	අතිරේක ලේකම් (ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ)	ශ්‍රී.ලං.ප.සේ	විශේෂ	SL 3	ස්ථිර	1	1	-	-
7	අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන)	ශ්‍රී.ලං.ක්‍ර.සේ	විශේෂ	SL 3	ස්ථිර	1	1	-	-
8	අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ)	ශ්‍රී.ලං.ඉ.සේ	විශේෂ	SL 3	ස්ථිර	1	1	-	-
9	ප්‍රධාන මූල්‍ය නිලධාරී	ශ්‍රී.ලං.ග.සේ	විශේෂ	SL 3	ස්ථිර	1	1		-
10	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)	ශ්‍රී.ලං.ප.සේ	1	SL 1	ස්ථිර	1	1	-	-
11	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (දිස්ත්‍රික් පාලන)	ශ්‍රී.ලං.ප.සේ	1	SL 1	ස්ථිර	1	-	-	1
12	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රාදේශීය පාලන)	ශ්‍රී.ලං.ප.සේ	1	SL 1	ස්ථිර	1	1	-	-
13	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ග්‍රාම නිලධාරී පාලන)		1	SL 1	ස්ථිර	1	1	-	-
14	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (විමර්ශන)	ශ්‍රී.ලං.ප.සේ	1	SL 1	ස්ථිර	1	1	-	-
15	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන)	ශ්‍රී.ලං.ප.සේ	1	SL 1	ස්ථිර	1	1	-	-
16	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ)	ශ්‍රී.ලං.ප.සේ	1	SL 1	ස්ථිර	1	1	-	-
17	ප්‍රධාන ගණකාධිකාරී	ශ්‍රී.ලං.ග.සේ	1	SL 1	ස්ථිර	1	1	-	-
18	ප්‍රධාන අභ්‍යන්තර	ශ්‍රී.ලං.ග.සේ	1	SL 1	ස්ථිර	1	1	-	-

#	තනතුරු නාමය	සේවය	ශ්‍රේණිය/ පන්තිය	වැටුප් කේතය	බඳවා ගනු ලබන පදනම (ස්ථිර/ කොන්ත්‍රාත්/ආදේශක/අනියම්)	අනුමත කාර්ය මණ්ඩලය	දැනට සිටින සංඛ්‍යාව	වැඩබලන/ රාජකාරි ඉටුකරනු ලබන	පුරප්පාඩු
	විගණක								
19	ප්‍රධාන ඉංජිනේරු	ශ්‍රී.ලං.ඉ.සේ	1	SL 1	ස්ථිර	1	1	-	-
20	අධ්‍යක්ෂ (සැලසුම්)	ශ්‍රී.ලං.ක්‍ර.සේ	1	SL 1	ස්ථිර	1	-	1*	1
21	අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)	ශ්‍රී.ලං.තො.හා.සන්.තා.සේ	I-1	SL 1	ස්ථිර	1	-	-	1
22	සහකාර ලේකම් (පාලන)	ශ්‍රී.ලං.ප.සේ	111/1 1	SL 1	ස්ථිර	1	1	-	-
23	සහකාර ලේකම් (දිස්ත්‍රික් පාලන)	ශ්‍රී.ලං.ප.සේ	111/1 1	SL 1	ස්ථිර	2	2	-	-
24	සහකාර ලේකම් (ප්‍රාදේශීය පාලන)	ශ්‍රී.ලං.ප.සේ	111/1 1	SL 1	ස්ථිර	2	2	-	-
25	සහකාර ලේකම් (ග්‍රාම නිලධාරි පාලන)	ශ්‍රී.ලං.ප.සේ	111/1 1	SL 1	ස්ථිර	1	1	-	-
26	සහකාර ලේකම් (විමර්ශන)	ශ්‍රී.ලං.ප.සේ	111/1 1	SL 1	ස්ථිර	1	1	-	-
27	සහකාර ලේකම් (පුහුණු)	ශ්‍රී.ලං.ප.සේ	111/1 1	SL 1	ස්ථිර	1	1	-	-
28	සහකාර ලේකම් (සංවර්ධන)	ශ්‍රී.ලං.ප.සේ	111/1 1	SL 1	ස්ථිර	1	-	-	1
29	සහකාර ලේකම් (ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ)	ශ්‍රී.ලං.ප.සේ	111/1 1	SL 1	ස්ථිර	1	1	-	-
30	සහකාර අධ්‍යක්ෂ /නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)	ශ්‍රී.ලං.ක්‍ර.සේ	111/1 1	SL 1	ස්ථිර	1	1	-	-
31	සහකාර අධ්‍යක්ෂ /නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) (ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ)	ශ්‍රී.ලං.ක්‍ර.සේ	111/1 1	SL 1	ස්ථිර	1	1	-	-
32	සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)	ශ්‍රී.ලං.තො.හා.සන්.තා.සේ	111	SL 1	ස්ථිර	1	1	-	-
33	ගණකාධිකාරී	ශ්‍රී.ලං.ග.සේ	111/1 1	SL 1	ස්ථිර	4	3	-	1
34	ඉංජිනේරු	ශ්‍රී.ලං.ඉං.සේ	111/1 1	SL 1	ස්ථිර	1	1	-	-
35	අභ්‍යන්තර විගණක	ශ්‍රී.ලං.ග.සේ	111/1 1	SL 1	ස්ථිර	1	-	1*	1
36	නීති නිලධාරි	දෙපාර්තමේන්තුගත	111/1 1	SL 1	ස්ථිර	1	1	-	-

#	තනතුරු නාමය	සේවය	ශ්‍රේණිය/ පන්තිය	වැටුප් කේතය	බඳවා ගනු ලබන පදනම (ස්ථිර/ කොන්ත්‍රාත්/ආදේශක/අනියම්)	අනුමත කාර්ය මණ්ඩලය	දැනට සිටින සංඛ්‍යාව	වැඩබලන/ රාජකාරි ඉටුකරනු ලබන	පුරප්පාඩු
37	පරිශ්‍ර කළමනාකරු	දෙපාර්තමේන්තුගත	111/11	SL 1	ස්ථිර	1	-	-	1
38	වාස්තු විද්‍යාඥ (ගෘහ නිර්මාණ ශිල්පී)	ශ්‍රී.ලං.වා.වි.සේ	111/11	SL 1	ස්ථිර	9	3	-	6
					එකතුව	**51**	**38**	**2**	**13**
කෘතිය මට්ටම									
39	පරිපාලන නිලධාරී	රා.ක.ස.සේ	අධි	MN 7	ස්ථිර	1	-	1*	1
40	භාෂා පරිවර්තක (සිංහල- දෙමළ)	රජ.භාෂා පරි.සේ	11/1	MN 6	ස්ථිර	3	-	-	3
41	භාෂා පරිවර්තක (සිංහල- ඉංග්‍රිසි)	රජ.භාෂා පරි.සේ	11/1	MN 6	ස්ථිර	1	1	-	-
42	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී	ශ්‍රී.ලං.තො.හා.සන්.තා.සේ	II-11/1	MN 6	ස්ථිර	2	1	-	1
43	සහයක පරිශ්‍ර කළමණාකරු (තොරතුරු තාක්ෂණ)	දෙපාර්තමේන්තුගත	III	MN 6	ස්ථිර	1	-	-	1
					එකතුව	**8**	**2**	**1**	**6**
ද්විතික මට්ටම									
44	සංවර්ධන නිලධාරී	සං.නි.සේ.	111/11/1	MN 4	ස්ථිර	203	223**	-	-
45	විමර්ශන නිලධාරී	ආශ්‍රිත සේවා	-	MN 4	ස්ථිර	10	10	-	-
46	ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්	තාවකාලික	-	රා.ප.ව. 03/2016 හි උපලේඛන IV අනුව	තාවකාලික	1	1	-	-
47	කාර්මික නිලධාරී	ශ්‍රී.ලං.තා.සේ	111/11/1	MN 3	ස්ථිර	4	3	-	1
48	සැලසුම් ශිල්පී	ශ්‍රී.ලං.තා.සේ	111/11/1	MN 3	ස්ථිර	1	1	-	-
49	කළමනාකරණ සේවා නිලධාරී	ක.සේ.නි.සේ.	111/11/1	MN 2	ස්ථිර	95	48	-	47
50	කළමනාකරණ සහකාර	දෙපාර්තමේන්තුගත	111/11/1	MN 2	ස්ථිර	-	8	-	-
51	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	ශ්‍රී.ලං.තො.හා. සන්තා.සේ	3 පන්තිය 111/11/1 ශ්‍රේණි	MT 1	ස්ථිර	5	4	-	1

#	තනතුරු නාමය	සේවය	ශ්‍රේණිය/ පන්තිය	වැටුප් කේතය	බඳවා ගනු ලබන පදනම (ස්ථිර/ කොන්ත්‍රාත්/ආදේශක/අනියම්)	අනුමත කාර්ය මණ්ඩලය	දැනට සිටින සංඛ්‍යාව	වැඩබලන/ රාජකාරි ඉටුකරනු ලබන	පුරප්පාඩු
52	කාර්මික සහකාර	දෙපාර්තමේන්තුගත	111/1 1/1	MT 1	ස්ථිර	1	1	-	-
					එකතුව	**320**	**299**	**0**	**49**
ප්‍රාථමික මට්ටම									
53	රියදුරු	ඒකාබද්ධ රි. සේ	111/1 1/1 විශේෂ	PL 3	ස්ථිර	31	22	-	9
54	බංගලා භාරකරු	දෙපාර්තමේන්තුගත	111/1 1/1 විශේෂ	PL 2	ස්ථිර	33	-	-	33
55	කාර්යාල කාර්ය සහායක	කා.සේ. සේ.	111/1 1/1 විශේෂ	PL 1	ස්ථිර	40	35	-	5
56	සහායක බංගලා භාරකරු***	දෙපාර්තමේන්තුගත	111/1 1/1 විශේෂ	PL 1	ස්ථිර	33	60***	-	-
57	නිශ්චල ඡායාරූප ශිල්පී	තාවකාලික		රු. 29,840 + රු.7,800	තාවකාලික	1	-	-	1
58	වීඩියෝ කැමරා ශිල්පී	තාවකාලික		රු. 29,840 + රු.7,800	තාවකාලික	1	-	-	1
59	ඡායාරූප ශිල්පී සහායක	තාවකාලික		රු. 24,250 + රු.7,800	තාවකාලික	1	-	-	1
					එකතුව	**140**	**117**	**0**	**50**
					මුළු එකතුව	**519**	**456**	**3**	**118**

* පූර්ණ කාලීනව වැඩ බැලීම සිදු කරයි.

** සංවර්ධන නිලධාරී සේවයේ පුහුණුවීම් ලද නවක පත්වීම්ලාභීන් පිරිසක් ද ඇතුළත්ය.

*** බංගලා භාරකරු ලෙස උසස් කිරීමට නියමිත සේවකයින් පිරිසක් ද ඇතුළත්ය.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය RS		වැඩසටහනේ ස්වභාවය	නිමැවුම / ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
English Diploma Mrs.W.M.S.K.Weerakon(PMA) Admin Division	1	අවුරුදු 01	48,000.00		සේවා අවශ්‍යතාවය මත සිදු කෙරේ	පාඨමාලාව අවසන්ව නොමැත
නිලධාරීන්ගේ ආකල්ප හා කාර්යක්ෂමතා සංවර්ධන පුහුණු වැඩසටහන	100	දින 01	54,695.00		ආකල්ප වර්ධනය ඉලක්ක කොට සිදුවිය	වෘත්තීය අභිවෘද්ධිය සඳහා යොදා ගැනීම
විනය කටයුතු පිළිබඳ පුහුණුව	71	දින 01	27,210.00		විනය පිළිබඳ දැනුවත් කිරීම.	විනය පිළිබඳ අවබෝධය
ශ්‍රී.ලං.ප.සේ. නවක නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව	58	දින 02	182,000.00		වෘත්තීමය අත්දැකීම් ඇසුරින් සිදුවිය	වෘත්තීය අභිවෘද්ධිය සඳහා යොදා ගැනීම
ව්‍යාපාර මූල්‍ය හා ගිණුම්කරණ පශ්චාත් උපාධි පාඨමාලාව, ඩබ්.ඒ.බී.පී.විජේසිංහ මයා (ගණකාධිකාරී) මූල්‍ය අංශය	1	වසර 02	157,000.00		සේවා අවශ්‍යතාවය මත සිදු කෙරේ	පාඨමාලාව අවසන්ව නොමැත
ප්‍රසම්පාදනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව, එන් ජේ.පතිරණ මිය (ගණකාධිකාරී) මූල්‍ය අංශය	1		100,000.00		සේවා අවශ්‍යතාවය මත සිදු කෙරේ	පාඨමාලාව අවසන්ව නොමැත
පශ්චාත් උපාධි පාඨමාලාව (2022.03.30 ගෙවීම)	1	වසර 02	158,500.00		සේවා අවශ්‍යතාවය මත සිදු කෙරේ	පාඨමාලාව අවසන්ව නොමැත
සංචාරක බංගලා භාරකරුවන් හා සහයක සංචාරක භාරකරුවන් පුහුණු වැඩසටහන(බදුල්ල)	25	දින 02	261,305.00		සංචාරක හා හෝටල් කළමණාකරණ ආයතනය මගින් සිදුකෙරිණි.	සංචාරක බංගලාවන්හි ගුණාත්මක භාවය ඉහළ නැංවීම.
පශ්චාත් උපාධි පාඨමාලාව	1	වසර 02	120,000.00		සේවා අවශ්‍යතාවය මත සිදු කෙරේ	පාඨමාලාව අවසන්ව නොමැත
නවක නිලධාරීන් සඳහා පුහුණුව	70	දින 01	4874.00		වෘත්තීමය අත්දැකීම් ඇසුරින් සිදුවිය	වෘත්තීය අභිවෘද්ධිය සඳහා යොදා ගැනීම
දෙමළ භාෂා පැය 200 (මාණ්ඩලික නිලධාරීන්)	5	මාස 01	75,000.00		රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරිණි	වෘත්තීය අභිවෘද්ධිය සඳහා යොදා ගැනීම
පශ්චාත් උපාධි පාඨමාලාව (MBA/MSC In Management Degree Program – 2021)	1	වසර 02	218,000.00		සේවා අවශ්‍යතාවය මත සිදු කෙරේ	පාඨමාලාව අවසන්ව නොමැත
රියදුරු පුහුණු වැඩසටහන	22	දින 01	15,800.00		මාර්ග නීති ඇසුරින් සිදු විය	නිවැරදිව රථ වාහන හැසිරවීම පිළිබඳ අවබෝධය
කුසලතා පදනම මත බඳවා ගත් නිලධාරීන් සඳහා වන පුහුණු වැඩසටහන (මාණ්ඩලික නිලධාරීන්)	12	දින 01	15,900.00		වෘත්තීමය අත්දැකීම් ඇසුරින් සිදුවිය	වෘත්තීය අභිවෘද්ධිය සඳහා යොදා ගැනීම

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය RS		වැඩසටහනේ ස්වභාවය	නිමැවුම / ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
ටී.ආර්.වරුණ ශ්‍රී ධනපාල මයා (අති.ලේ.ප්‍රාදේශීය ප්‍රතිසංස්කරණ පාලන) ඉන්දියාවේ පැවති සම්මන්ත්‍රණයකට සහභාගී වීම වෙනුවෙන්	1	දින 03		44,511.00	ඉන්දියානු රජය මගින් සිදු කෙරිණි.	වෘත්තීය අභිවෘද්ධිය සඳහා යොදා ගැනීම

- පුහුණුව තුළින් නිලධාරින්ගේ ඵලදායිතා ඉහළ නැංවීම මගින් සේවකයින්ගේ සේවා පරිසරය පිළිබඳ තෘප්තිමත් කිරීම.

07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්	අදාල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවෙනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ		අදාළ කරුණු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදි සාකච්ඡා කිරීමට නියමිතයි.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ		2023 වර්ෂයේ සියලුම රැස්වීම් පැවැත්වීමට නියමිතයි.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

පළාත් සභා හා පළාත් පාලන අංශය

පටුන

පිටු අංකය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය.....	*1 - 4*
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම.....	*5 - 41*
පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක.....	*42 - 42*
පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය).....	*43- 44*
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ.....	*45 - 46*
පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව.....	*47 - 54*
ඇමුණුම් 01 - සංවිධාන සටහන.....	*55- 55*

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

මෙම වාර්තාව මඟින් පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ විෂයයන් හා කාර්යයන්වල 2022 වර්ෂයට අදාළ භෞතික හා මූල්‍ය කාර්යසාධනය සවිස්තරාත්මකව ඉදිරිපත් කරයි. මුදල් අමාත්‍යාංශය විසින් ලබාදෙන ලද උපදෙස් හා ආකෘතිය අනුව මෙම වාර්තාවේ ආකෘතිය හා පෙළගැස්ම සකස් කර ඇත.

2022 අයවැය මඟින් මෙම අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා වෙන්වූ සමස්ත ප්‍රතිපාදන ප්‍රමාණය රු. 25,821,500,000 කි. එම ප්‍රතිපාදන වලින් රු. 23,401,400,000 ක් එනම්, 90.62% ක් 2022.12.31 දිනට ඵලදායීව වියදම් කිරීමට අමාත්‍යාංශයට හැකිවී තිබේ.

අමාත්‍යාංශයට වෙන්වූ ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් පළාත් සභා සහ පළාත් පාලන ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කිරීමට, අමාත්‍යාංශයට හැකිවීම සුවිශේෂී කරුණකි. ඒ අනුව දිවයිනේ බොහෝ පළාත් පාලන ආයතන ආවරණය කරමින් දේශීය සහ විදේශීය අරමුදල් යටතේ සංවර්ධන ව්‍යාපෘති රාශියක් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමටත් ඉකුත් වර්ෂවල ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘතිවල නොපියවූ බිල්පත් නිරවුල් කිරීමටත් හැකිවිය. තවද, පළාත් සභා හා පළාත් පාලන ක්ෂේත්‍රයට අදාළ නීති අණපනත් සහ ජාතික ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම හා නියමිත සංශෝධන කටයුතු ඉටු කිරීම හා ඒ පිළිබඳ අවධානය යොමු කිරීම අමාත්‍යාංශය විසින් ඉටුකරන ලද තවත් මෙහෙවරකි. ඒ යටතේ මහා නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත සහ ප්‍රාදේශීය සභා පනත් තුළ පවත්නා යල්පැනගිය නීතීන් ජාතික ප්‍රතිපත්ති රාමුව හා සැසඳෙන පරිදි යාවත්කාලීන කිරීම, උසාවි දඩ මුදල්, මුද්දර ගාස්තු සෘජුවම පළාත් පාලන ආයතනයේ ගිණුමට යොමුවන පරිදි පළාත් සභා පනතේ ඉදිරි සංශෝධන කටයුතු සිදු කිරීම සඳහා පළාත් සභාවල අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කිරීම, පළාත් පාලන ආයතනවල කාර්යයන් පහසු හා සුමට කිරීම සඳහා නව විද්‍යුත් මෙවලම් හඳුන්වා දීම විශේෂ වේ.

මෙම වාර්තාවේ ඉදිරි පරිච්ඡේද තුළින් 2022 වර්ෂයට අදාළ අමාත්‍යාංශයේ ප්‍රගතිය හා ඉදිරි දැක්ම, සමස්ත මූල්‍ය කාර්යසාධනය, කාර්යසාධන දර්ශක, තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය, මානව සම්පත් පැතිකඩ, විගණන මතය හා තවත් කරුණු පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරයි.

‘‘සෞභාග්‍යයේ දැක්ම’’ ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුව අමාත්‍යාංශයේ විෂයය පථයට අයත් කාර්යයන් හා අමාත්‍යාංශයට නියමිත වූ සුවිශේෂී ප්‍රමුඛතා කාර්යක්ෂමව සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා ගරු අමාත්‍යතුමාගේ නිසි නායකත්වය හා මඟපෙන්වීම, අමාත්‍යාංශ ලේකම්තුමාගේ මනා කළමනාකාරිත්වය, අතිරේක ලේකම්වරුන් මෙන්ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ, පළාත් පාලන කොමසාරිස්වරුන්ගේ, ආයතන සහ විදේශ ආධාර ව්‍යාපෘතිවල අධ්‍යක්ෂවරුන්ගෙන් ලද මහඟු දායකත්වය විශේෂයෙන් මෙහිලා සඳහන් කළ යුතුය.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර අරමුණු

1.2.1. දැක්ම

පළාත් සහ ප්‍රාදේශීය ආණ්ඩුකරණයක් සඳහා බලගැන්වීම

1.2.2. මෙහෙවර

ජනතා හිතවාදී නීතිරීති හා ප්‍රතිපත්ති සම්පාදනය මඟින් හා නූතන තාක්ෂණයේ සහාය ඇතිව දේශීය සම්පත් පූර්ණ උපයෝජනයට ලක් කරමින් විනිවිදභාවයෙන් හා වග වීමෙන් කටයුතු කිරීම සඳහා පළාත් සභා හා පළාත් පාලන ආයතන වලට මඟපෙන්වීම සහ සහායවීම.

1.3. කාර්යයන් හා කර්තව්‍යයන්

2022.07.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලද නව අමාත්‍යාංශවල කාර්යයන් හා කර්තව්‍යයන් පිළිබඳ නිවේදනයට අනුව පළාත් සභා සහ පළාත් පාලන අංශයේ කාර්යයන් හා කර්තව්‍යයන්.

I. පළාත් සභාවලට අදාළ කටයුතු නියාමනය කිරීම.
II. පළාත් සභා හා පළාත් පාලන ආයතන පරිපාලනයෙහි සෑම මානයක් සම්බන්ධයෙන්ම පර්යේෂණ පැවැත්වීම.
III. පළාත් සභා හා පළාත් පාලන ආයතනවල අඩු පහසුකම් සහිත ක්ෂේත්‍ර/ අංශ හඳුනාගෙන අදාළ පහසුකම් ලබා දීම සඳහා විශේෂ ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.
IV. පළාත් සභාවල මන්ත්‍රීවරුන්, නිලධාරීන් හා සේවකයින් පුහුණු කිරීම.
V. පළාත් පාලන ආයතනවලට අදාළ රජයේ කර්තව්‍යයන්.
VI. පොදු පහසුකම් සංවර්ධනය සඳහා පළාත් පාලන ආයතනවලට ණය පහසුකම් ලබා දීම.
VII. පළාත් පාලන ආයතනයන්හි මන්ත්‍රීවරුන් නිලධාරීන් හා සේවකයින් පුහුණු කිරීම.

1.4. සංවිධාන සටහන

කරුණාකර ඇමුණුම් අංක 1 බලන්න.

1.5. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන/ ප්‍රධාන අංශ

1. පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍ය කාර්යාලය	9. නීති අංශය
2. ලේකම් කාර්යාලය	10. මූල්‍ය අංශය
3. පාලන හා පුහුණු අංශය i. තොරතුරු තාක්ෂණ ඒකකය	11. වියදම් විමංසන අංශය
4. පළාත් සභා අංශය	12. අභ්‍යන්තර විගණන අංශය
5. පළාත් පාලන අංශය	13. ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය
6. සංවර්ධන අංශය	14. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
7. ව්‍යාපෘති අධීක්ෂණ අංශය	15. දේශීය ණය සහ සංවර්ධන අරමුදල
8. ක්‍රමසම්පාදන අංශය	

1.6. අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මකවන සංවර්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් සපයන ආයතන/ රටවල්

1. ශ්‍රී ලංකා රජය (GOSL)
2. ලෝක බැංකුව (WB)
3. ආසියානු සංවර්ධන බැංකුව (ADB)
4. යුරෝපා සංගමය (EU)
5. යුරෝපීය ආයෝජන බැංකුව (EIB)
6. ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA)
7. එක්සත් රාජධානිය
8. නෙදර්ලන්තය
9. ඔස්ට්‍රියාව

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල මූලික තොරතුරු

2022 වර්ෂය තුළදී විදේශ ආධාර ව්‍යාපෘති 13 ක් ක්‍රියාත්මක වූ අතර ඒවායේ මූලික තොරතුරු පහත සඳහන් පරිදි වේ.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල (රු.මි.)	ව්‍යාපෘති කාලය
1	මහකොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය (GCWWMP)	ආසියානු සංවර්ධන බැංකුව (ADB)	14,331.00	2010 සැප්තැම්බර් - 2023 ජූනි
2	මහකොළඹ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (GCWWMIIP) 2 කොටස	ආසියානු සංවර්ධන බැංකුව (ADB)	1,227.00	2014 සැප්තැම්බර් - 2022 ඔක්තෝබර්
3	මහකොළඹ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (GCWWMIIP) 3 කොටස	යුරෝපීය ආයෝජන බැංකුව (EIB) ආසියානු සංවර්ධන බැංකුව (ADB)	26,953.00	2016 නොවැම්බර්- 2022 දෙසැම්බර්
4	පළාත් පාලන ආයතන නහාසිටුවීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) – අතිරේක මූල්‍යයනය	ආසියානු සංවර්ධන බැංකුව (ADB)	13,790.00	2017 අප්‍රේල් - 2023 මාර්තු
5	ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය - අදියර 5	නෙදර්ලන්තය	13,300.00	2021 ජූලි - 2024 ජූලි
6	ප්‍රාථමික සෞඛ්‍ය සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය (PSSP)	ලෝක බැංකුව (WB)	21,188.44	2018 ජූනි - 2023 දෙසැම්බර්
7	සාමාන්‍ය අධ්‍යාපන නව්‍යකරණ ව්‍යාපෘතිය (GEM)	ලෝක බැංකුව (WB)	15,505.00	2018 අප්‍රේල් - 2024 ජූනි

අනු අංකය	ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල (රු.මි.)	ව්‍යාපෘති කාලය
8	නැගී එන ප්‍රදේශවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP)	ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (JICA)	20,622.00	2017 ජූලි - 2023 දෙසැම්බර්
9	ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය - පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (TCAMP-PRDP)	ලෝක බැංකුව (WB)	15,020.00	2019 මැයි - 2023 මාර්තු
10	ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP)	ලෝක බැංකුව (WB)	17,749.85	2019 ජූනි - 2023 ජූලි
11	ගිනි නිවන උපකරණ සැපයීම	ඔස්ට්‍රියානු රජය	3,031.00	2019 ජනවාරි - 2022 දෙසැම්බර්
12	උතුරු පළාත් පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය	ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (JICA)	200.00	2019 මාර්තු - 2024 සැප්තැම්බර්
13	ප්‍රජා ජල සම්පාදන ක්‍රම කළමනාකරණයේ ප්‍රජා සහභාගිත්වයේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ධාරිතා ගොඩනැගීම	ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (JICA)	Just Started	2022 - 2025

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. විශේෂ ජයග්‍රහණ

සැලසුම්ගත ඉලක්කය අනුව 2022 දෙසැම්බර් මස 31 දිනට සමස්ත මූල්‍ය ප්‍රගතියෙහි ප්‍රතිශතය

2022 වර්ෂය සඳහා මුළු ප්‍රතිපාදන = රු. 25,821,500,000.00

2022 වර්ෂය සඳහා සත්‍ය වියදම = රු. 23,401,400,000.00

මූල්‍ය ජයග්‍රහණයෙහි ප්‍රතිශතයක් ලෙස = 90.62%

2022 වර්ෂයේදී දේශීය ආධාර ව්‍යාපෘතිවල ප්‍රගතිය

අංකය	ව්‍යාපෘතියේ නම	මූල්‍ය ඉලක්කය 2022 (රු.මිලියන)	මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)	භෞතික ප්‍රගතිය (%)
1	ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන	160.00	135.90	85%
2	අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රාදේශීය සභා (අයවැය යෝජනා - 36)	146.50	139.18	95%
3	ප්‍රාදේශී සභා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන (අයවැය යෝජනා - 36)	493.50	457.15	80%
4	පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන)	252.72	215.29	88%
5	ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (පුනරාවර්තන)	139.54	126.63	96%
6	පුස්තකාල සංවර්ධන වැඩසටහන	23.74	23.74	100%

2.2. මහජන දුක් ගැනවිලි කළමනාකරණය

දිවයිනෙහි ඕනෑම පළාත් පාලන ආයතනයක් විසින් සපයනු ලබන සේවාවන් පිළිබඳව සෑහීමකට පත් නොවන අවස්ථාවකදී, මහජනතාවගෙන් ලැබී ඇති එබඳු පැමිණිලි යොමු කිරීම සඳහා පළාත් පාලන අංශයට අනුයුක්තව විමර්ශන ඒකකයක් ස්ථාපිත කර ඇත. 2022 වර්ෂයේදී ජනතාවගෙන් ලද පැමිණිලි 5266 ක් අදාළ පළාත් වෙත යොමු කොට සුදුසු පරිදි විසඳුම් ලබා දෙන ලදී. තවද, පෙත්සම් 06ක් මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් වී ඇති අතර, පෙත්සම් 03ක් කාරක සභාව වෙත යොමු කර ඇත. පෙත්සම් 01ක් උපදේශක කාරක සභාව වෙත යොමු කර ඇත.

2.3. පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG) පළාත් සභා සහ පළාත් පාලන නිලධාරීන් සඳහා දේශීය පුහුණු/ වැඩමුළු 178 ක් පවත්වා ඇති අතර එම පුහුණු/ වැඩමුළු සඳහා නිලධාරීන් 6,561 දෙනෙකු සහභාගී වී තිබේ. මීට අමතරව, අමාත්‍යාංශයේ විවිධ මට්ටම් නියෝජනය කරන නිලධාරීන් සඳහා පුහුණු/ වැඩමුළු 12 ක් පවත්වා ඇති අතර එම පුහුණු/ වැඩමුළු සඳහා නිලධාරීන් 62 දෙනෙකු සහභාගී වී ඇත.

2022 වර්ෂයේදී විදේශ ආධාර ව්‍යාපෘතිවල ප්‍රගතිය

අංකය	ව්‍යාපෘතියේ නම	වර්ෂය තුළ මූල්‍ය ඉලක්කය 2022 (රු.මිලියන)	වර්ෂය තුළ මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන)	ව්‍යාපෘතියේ සමුච්චිත භෞතික ප්‍රගතියය (%)
1	මහකොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය (GCWWMP)	992.00	750.00	94.4%
2	මහකොළඹ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (GCWWMIIP) 2 හා 3 කොටස	530.00 2050	1,019.11 512.00	57.27% 19.25%
3	පළාත් පාලන ආයතන නහාසිටුවීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) – අතිරේක මූල්‍යයනය	2,250.00	1,911.93	90%
4	ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (අදියර 5)	300.00	207.26	10%
5	ප්‍රථමික සෞඛ්‍ය සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය (PSSP)	5,000.00	4,785.00	69%
6	සාමාන්‍ය අධ්‍යාපනය නව්‍යකරණ ව්‍යාපෘතිය (GEM)	3,014.00	2,672.31	–
7	නැගී එන ප්‍රදේශවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය ((RIDEP)	1,911.00	1,422.97	47%
8	ප්‍රවාහන සම්බන්ධක සහ වත්කම් ව්‍යාපෘතිය - පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (TCAMP-PRDP)	3,000.00	4,408.00	73%
9	ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP)	3,350.00	2,421.43	60.8%
10	ගිනි නිවන උපකරණ සැපයීම	2,167.00	2,152.00	100%
11	උතුරු පළාත් පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය	41.50	41.50	68%

2.4 අභියෝග

I. 2020-2021 වර්ෂවල කොවිඩ් වසංගත තත්ත්වය නිසා ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ පුද්ගලික අංශයේ ශක්‍යතාවය අඩුවීම.
II. විදේශ විනිමය අර්බුදය නිසා ඇතිවූ ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළ අමුද්‍රව්‍ය විශේෂයෙන් සිමෙන්ති, යකඩ වැනි ද්‍රව්‍යවල හිඟකම සහ මිල ගණන් අධික ලෙස ඉහළ යාම.
III. කොවිඩ් වසංගත කාලය තුළ කළමනාකරණ සේවා ඉටු කිරීමට නොහැකිව අපතේ ගිය කාල සීමාව.
IV. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ භාණ්ඩවල මිල නිරන්තරයෙන් වැඩිවීම නිසා නැවත ඇස්තමේන්තු සකස් කිරීමට සිදුවීම.
V. ආනයනික භාණ්ඩවල මිල ඉහළ යාම හා හිඟ වීම.
VI. රටේ පවතින ආර්ථික අර්බුදය නිසා ප්‍රමාණවත් ලෙස අයැවය ප්‍රතිපාදන නොලැබීම සහ රාජ්‍ය ආයතනවල වියදම් සීමා කිරීමේ රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු කිරීමට සිදුවීම.

2.5 ඉදිරි ඉලක්ක

1. පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් පළාත් පාලන ආයතනවල සේවා සැපයීමේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව වැඩිදියුණු කිරීම.
2. පළාත් පාලන ආයතන පුස්තකාල සංවර්ධනය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් නවීන දැනුම ළඟා කර ගැනීම වැඩි දියුණු කිරීම.
3. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2003ට අනුව ‘‘අලුත් ගමක්-අලුත් රටක්’’ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

4. පළාත් පාලන ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ධාරිතාවය ශක්තිමත් කිරීම.
5. පළාත් පාලන පද්ධතිය සංවර්ධනය කිරීම හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
6. නව පළාත් පාලන ආයතන සංස්ථාපනය / උත්ශ්‍රේණිගත කිරීම.
7. පළාත් පාලන ආයතනවල කාර්ය පහසු හා සුමට කිරීම සඳහා නව විද්‍යුත් මෙවලම් මාර්ගගත ක්‍රමවේද හඳුන්වා දීම.
8. සහෝදර නගර/ මිතුරු නගර සංකල්පය යටතේ විදේශ රාජ්‍යයන් සමඟ ගිවිසුම්වලට එළඹීම සම්බන්ධව මාර්ගෝපදේශ සැපයීම සහ දිරිගැන්වීම.
9. පළාත් සභාවල ක්‍රියාකාරිත්වයට අවශ්‍ය පහසුකම් සැලසීම, මධ්‍යම රජය හා පළාත් සභා අතර සම්බන්ධීකරණය හා පළාත් සභාවල මානව සම්පත් සංවර්ධනය මගින් ඵලදායී හා කාර්යක්ෂම පළාත් සභා ක්‍රමයක් ඇති කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.
10. පළාත් පාලන ජන්ද විමසීම් ආඥා පනත සහ පළාත් සභා ජන්ද විමසීම් පනත සංශෝධනය කිරීම.
11. පළාත් පාලන ආයතනවල ස්වයං උත්පාදන ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් ආවරණය කරන උසාවි දඩ මුදල්, මුද්දර ගාස්තු ඍජුවම පළාත් පාලන ආයතනයේ ගිණුමට යොමුවන පරිදි පළාත් සභා පනතේ ඉදිරි සංශෝධන කටයුතු අවසන් කිරීම.
12. පළාත් පාලන ආයතන සඳහා හඳුන්වා දී ඇති නව ගිණුම් ක්‍රමයට අදාල රීති සකස් කිරීමේ වැඩසටහන, පළාත් පාලන ආයතනවල අතුරු ව්‍යවස්ථා යාවත්කාලීන කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
13. රජයේ අයවැය යෝජනා අනුව යෝජිත නව පළාත් පාලන ආයතන සංස්ථාපනයට අදාල ගැසට් නිවේදන පිළියෙල කිරීම සහ නව පළාත් පාලන ආයතන සංස්ථාපනය කිරීමෙන් අනතුරුව කොට්ඨාස සීමා නීර්ණය කිරීමට අදාළ කටයුතු සිදු කිරීම.
14. පළාත් පාලන ආයතන සඳහා රීති සකස් කිරීම, ජලභීතිකා ආඥා පනතේ සංශෝධන කටයුතු අවසන් කිරීම සහ පළාත් පාලන ආයතනවල නෛතික ගැටළුවලට අදාළ උපදෙස් ලබාදීම.
15. වඩාත් කාර්යක්ෂමව සඵලදායී විනිවිදභාවයකින් යුතු ගුණාත්මක ගිණුම්කරණ ක්‍රියාවලියක් පවත්වා ගෙන යාම, සියලුම නිලධාරීන්ගේ වැන්දඹු අනත්දරු දායක මුදල් වෙනුවෙන් අයකරගැනීම් ඇතුළත් දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම.
16. චෙක්පත් ආදායකයින් වෙත e-banking ක්‍රමය මගින් ලබාදීමේ කටයුතු කාර්යක්ෂම කිරීම.
17. පවතින ආර්ථික අභියෝග හමුවේ නව තාක්ෂණික ක්‍රමවේදයන් ඔස්සේ මානව සම්පත් හා භෞතික සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව මෙහෙයවීමට අවශ්‍ය කටයුතු කිරීම.
18. අමාත්‍යාංශයේ අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමේදී භෞතික හා මානව සම්පත් කාර්යක්ෂම සහ ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා වන අභ්‍යන්තර විගණන කටයුතු සාර්ථකව පවත්වාගෙන යාම
19. 2023 වර්ෂය තුළදී ද මධ්‍යම රජයේ ප්‍රදානයන් හා පළාත් සභා ආදායම් ඇස්තමේන්තුගත වියදම් සීමාවන්ට යටත්ව පළාත් සභා සහ පළාත් පාලන ආයතන විසින් වියදම් කරනු ලබන ආකාරය පිළිබඳව අඛණ්ඩ ඇගයීමක් සිදු කිරීම, එම ආයතනවල සේවක සංඛ්‍යා, ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පද්ධති විශ්ලේෂණය කර පළාත් පාලන ආයතනවල මූල්‍ය කාර්යසාධන වාර්තාව සකස් කිරීම.
20. මෙම අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘතීන්හි මූල්‍ය කාර්යසාධනය පිළිබඳ මාසික තොරතුරු පළාත් සභා මූල්‍ය කාර්යසාධන වාර්තාවට ඇතුළත් කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කිරීම.
21. පළාත් සඳහා වඩාත් ඵලදායී හා කාර්යක්ෂම අයුරින් ක්‍රියාත්මක වීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සහ අවශ්‍ය අවස්ථාවලදි උපදෙස් ලබා දීමට කටයුතු කිරීම.
22. ආණ්ඩුකාර සම්මේලනය, ප්‍රධාන ලේකම්වරුන් සමඟ පවත්වන අන්තර් පළාත් විෂය සම්බන්ධීකරණ සමුළුව කාර්තුමය වශයෙන් පැවැත්වීම සහ එහිදී මතුවන ගැටළු සඳහා පළාත් 9ටම අදාළ වන ඒකීය ක්‍රම හඳුන්වා දීම.
23. පළාත් සභා හා පළාත් පාලන ආයතන සඳහා ඉඩම් අත්පත් කරගැනීම සම්බන්ධ කටයුතු සහ පළාත් සභා කටයුතු කඩිනම් හා පහසු කරවන මෙන්ම නෛතික රාමුව ආරක්ෂා කිරීමට අදාළව හඳුනාගත් ක්‍රියාකාරකම් සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම
24. කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2014 අනුව පළාත් රාජ්‍ය සේවයේ නව තනතුරු ඇති කිරීම සම්බන්ධව සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම හා පළාත් 9 සඳහා ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරුවලට අදාළව කාර්යමණ්ඩල සමාලෝචනයක් සිදු කිරීම.
25. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අධීක්ෂණ හා මෙහෙයුම් කටයුතු සිදු කිරීම.

26. CDLG ව්‍යාපෘතියේ සහය ඇතිව උතුර, නැගෙනහිර, ඌව, උතුරු මැද පළාත්වල දේපල හා වරිපනම් තක්සේරු කිරීම් කටයුතු කඩිනම් කිරීම සහ GPS හා GIS තාක්ෂණය භාවිතා කර පළාත් පාලන ආයතන සඳහා භූගෝලීය තොරතුරු ජාලයක් සකස් කිරීමට අදාල මූලික පියවර ගැනීම.
27. දත්ත විශ්ලේෂණය හා ඉදිරිපත් කිරීමේ ඒකකයේ (DAVU) ඉදිරි සම්බන්ධීකරණ කටයුතු පවත්වාගෙන යාම.
28. 2005-2020 කාලය තුළ මෙම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කර ඇති සංවර්ධන ව්‍යාපෘතිවල සාර්ථක අසාර්ථකභාවය පිළිබඳ ඇගයුමක් සිදු කිරීම
29. මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සියලුම විදේශාධාර ව්‍යාපෘති, ව්‍යාපෘති අරමුණු කරා සම්බන්ධීකරණය කිරීම, නව ව්‍යාපෘති යෝජනා හඳුනා ගැනීම සඳහා අවශ්‍යතා විශ්ලේෂණය කිරීම (Need Analysis), ව්‍යාපෘති යෝජනා සකස් කිරීම සහ ව්‍යාපෘති ප්‍රගතිය පසුවිපරම් කිරීම හා මාසික ප්‍රගති වාර්තා සකස් කිරීම.
30. ජාතික මෙහෙයුම් කමිටු (NSC) රැස්වීම් 06ක් පැවැත්වීම හා ඒ තුළින් පැන නගින ගැටලු නිරාකරණය කිරීම.
31. ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ දැනට පැන නැගී ඇති ගැටළු නිරාකරණය කර පාලම් තට්ටු මෙරටට ගොඩබෑමෙන් අනතුරුව, පාලම් 110 ක් පමණ භෞතික ඉදිකිරීම් නිම කිරීම.
32. පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය/ පුරනැඟුම (අතිරේක ප්‍රතිපාදන) යටතේ උතුරු මැද, වයඹ, මධ්‍යම සහ ඌව පළාත්වල පවුල් 72,000 කට ආරක්ෂිත පානීය ජල පහසුකම් ලබා දීමට අදාළව ඉතිරිව ඇති ඉදිකිරීම් නිම කිරීම මඟින් පවතින නිදන්ගත වකුගඩු රෝගය සමනය කිරීම සඳහා සහාය වීම.
33. මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය (GCWMP) මගින් කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුළ තෝරාගත් කිලෝමීටර් 10ක මලාපවහන මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ කිලෝමීටර් 125ක මලාපවහන මාර්ගවල තත්ත්වය තක්සේරු කිරීම. සහ මළාපවහන මාර්ග විමර්ශන කටයුතු (වනාතමුල්ල පොම්පාගාරය 2023 පළමු කාර්තුව තුළ අවසන් කිරීම, මාලිගාවත්ත, තිඹිරිගස්යාය, බොරැල්ල සහ Vystwyke පොම්පාගාර ඉදිකිරීම. සහ වනාතමුල්ල සහ Vystwyke පොම්පාගාර ආශ්‍රිතව පිඩන නළ මාර්ග ඉදිකිරීම.
34. මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය (GCWMP) 2-3 යටතේ මලාපවහන 97.2km (89 km (ගුරුත්වාකර්ෂණ මලාපවහන) + 8.2 km (බල ප්‍රධාන) තත්ත්වය තක්සේරු කිරීම, කිරුළපන ජල පෝෂක ප්‍රදේශය සඳහා නව ගුරුත්වාකර්ෂණ කාණු, බල ප්‍රධාන මාර්ග සහ පොම්පාගාර සැපයීම, කිරුළ-නාරාහේන්පිට ප්‍රදේශයට මලාපවහන පහසුකම් ලබාදීම සහ දෝෂ සහිත මළාපවහන පද්ධති අලුත්වැඩියා කිරීම සහ දක්ෂිණ ජල පෝෂක ප්‍රදේශයේ අඩු ධාරිතාවයෙන් යුත් මළාපවහන පද්ධති ඉහළ නැංවීම සහ ක්‍රියාත්මක කිරීම.
35. නැගී එන කලාප ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP) අදියර II හා III යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති වාරි මාර්ග, මාර්ග හා ජල යෝජනා අනුව සම්පූර්ණ කර ව්‍යාපෘතිය අවසන් කිරීම.
36. සාමාන්‍ය අධ්‍යාපන නව්‍යකරණ (GEM) ව්‍යාපෘතිය මගින් ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම.
37. ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය (PSSP) යටතේ නව ඉදිකිරීම්, අලුත් වැඩියා කිරීම් සහ ධාරිතා සංවර්ධනය කිරීම (රසායනාගාර, සායන මධ්‍යස්ථාන, දන්ත ශල්‍යාගාර, ඖෂධ ගබඩා, ETU, සෞඛ්‍ය නිල නිවාස, ධාරිතා සංවර්ධනය හා වෙනත් ව්‍යාපෘති 1133ක් ක්‍රියාත්මක කිරීම)
38. පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ (TCAMP) ඉතිරි කොන්ත්‍රාත් පැකේජවල වැඩ අවසන් කිරීමේ, ඉතිරි ධාරිතා සංවර්ධන වැඩ අවසන් කිරීම, තාක්ෂණික ඇඟයුම් වර්තා සහ ව්‍යාපෘතිය අවසන් කිරීමේ වාර්තා සකස් කිරීම.
39. ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) මගින් රටේ පවතින අභිතකර ආර්ථික තත්වය සමනය කිරීම සඳහා සහය ලබා දිය හැකි උප ව්‍යාපෘති 248ක් ක්‍රියාත්මක කර අවසන් කිරීම.
40. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG) මගින් යහපාලන පළාත් සභා හා පළාත් පාලන ක්‍රමයක් උදෙසා එම ක්ෂේත්‍රවල මහජන නියෝජිතවරුන් හා නිළධාරීන්ගේ ධාරිතා වර්ධනය කිරීම, එම ආයතනවල සංවිධාන ව්‍යුහයන් හා කළමණාකරණ හැකියාවන් වැඩිදියුණු කිරීමෙන් සහාය වීම, පළාත් සභා හා පළාත් පාලන ක්ෂේත්‍රයේ උපදේශක පැවරුම් බාරගැනීම,

පළාත් සභා හා පළාත් පාලන ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීම හා තොරතුරු බෙදා හැරීම, පුහුණු පාඨමාලා 215ක් හා ධාරිතා සංවර්ධන වැඩසටහන් 04ක් පැවැත්වීම.

41. දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDF) යටතේ පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදක ව්‍යාපෘති සඳහා වන ණය ඉල්ලුම සම්පූර්ණ කිරීම, ආයතනික හැකියාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිකිරීම සහ පළාත් පාලන ආයතන සඳහා තරගකාරී මූල්‍ය දායකත්වයක් ලබාදීම.

2.6. දේශීය අරමුදල් මත ක්‍රියාත්මකවන වැඩසටහන් හා ව්‍යාපෘතිවල කාර්යසාධනය

2.6.1. සංවර්ධන අංශය

1. අරමුණ

පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ජීවත් වන ප්‍රජාවන්ට එම ආයතනවලින් ප්‍රතිලාභ සැලසෙන පරිදි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා දේශීය අරමුදල් යෙදවීම මගින් මහජන සේවා සම්පාදනය කාර්යක්ෂම හා ඵලදායී කිරීම සහ ඒ මඟින් අන්තර් පළාත් විෂමතා අවම කිරීමට දායකත්වය ලබා දීම.

2. 2022 වර්ෂයේ සිව්වන කාර්තුව අවසානය දක්වා ප්‍රගතිය

සංවර්ධන අංශයේ සමස්ත ප්‍රගතිය

වැඩසටහන	2022 ප්‍රතිපාදන (රු.මි)	2022.12.31 දිනට වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන)	252,723,000.00	215,296,954.80	55%	62%
ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (පුනරාවර්තන)	139,543,780.00	126,638,789.41	68%	82%
පුස්තකාල සංවර්ධන වැඩසටහන	23,740,000.00	23,740,000.00	100%	100%
ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන (අයවැය යෝජනා - 36)	493,500,000.00	457,153,780.08		
එකතුව	**909,506,780.00**	**822,829,524.29**		

2022 වර්ෂය සඳහා සංවර්ධන අංශය වෙත රු. 909,506,780.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් වූ අතර මෙම ප්‍රතිපාදන වලින් 2022 වර්ෂය සඳහා කිසිදු නව ව්‍යාපෘතියක් ආරම්භ නොකල අතර 2021 වර්ෂයේ ආරම්භ කර වැඩ අවසන් කලද අක් මුදල් නොමැති කම නිසා ගෙවීමට නොහැකි වූ බිල්පත් හා වැඩ අවසන් නොවූ ව්‍යාපෘති වල වැඩ අවසන් කර ගෙවීම් කිරීම සිදු කෙරුණි.

එක් එක් ප්‍රධාන සංවර්ධන වැඩසටහන් යටතේ 2022.12.31 දින වන විට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

1. පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන)

2022 වර්ෂය සඳහා වෙන් වූ රු. 252,723,000.00 ක ප්‍රතිපාදන 2021 වර්ෂයේ අනුමත කරන ලද එහෙත් වැඩ අවසන් නොවූ වූ ව්‍යාපෘති සඳහා යොදා ඇත.

2022 ප්‍රතිපාදන (රු.)	2022.12.31 දිනට වියදම (රු.)	අවිච්ඡේද ව්‍යාපෘති ගණන	අවලංගු ව්‍යාපෘති ගණන	අවිච්ඡේද ව්‍යාපෘති වටිනාකම (රු.)	වැඩ නිමි ව්‍යාපෘති	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
252,723,000.00	215,296,954.80	84	09	51	24	85%	88%

මෙම වැඩසටහනට අදාළව 2021 වර්ෂයේ අනුමත කරන ලද එහෙත් වැඩ අවසන් නොවීම හේතුවෙන් ව්‍යාපෘති 84 ක් 2022 වසර සඳහා ක්‍රියාත්මක කිරීමට තිබුණි. එයින් ව්‍යාපෘති 09 ක් අවලංගු කරන ලදී. ඉතිරි ව්‍යාපෘති 75 න් ව්‍යාපෘති 51 ක වැඩ 2022.12.31 වන විට නිම කර ඇත. තවත් ව්‍යාපෘති 24 ක වැඩ ඉතිරි වී ඇත.



නවගත්තේගම බස්නැවතුම්පල භූමියේ නව කඩ කාමර සංකීර්ණයේ ඉතිරිවැඩ නිම කිරීම



28 කණුව වකුගඩු රෝහල ඉදිරිපිට බස් නැවතුම්පොළක් ඉදි කිරීම (පොළොන්නරුව ම.න.ස - උතුරුමැද පළාත)

2. ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (පුනරාවර්තන)

2022 ප්‍රතිපාදන (රු.)	2022.12.31 දිනට වියදම (රු.)	අවිච්ඡේද ව්‍යාපෘති ගණන	අවලංගු ව්‍යාපෘති ගණන	අවිච්ඡේද ව්‍යාපෘති වටිනාකම (රු.)	වැඩ නිමි ව්‍යාපෘති	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
139,543,780.00	126,638,789.41	181	26	146	09	91%	96%

2022 වර්ෂය සඳහා වෙන් වූ රු. 139,543,780.00 ක ප්‍රතිපාදන 2021 වර්ෂයේ අනුමත කරන ලද එහෙත් වැඩ අවසන් නොවූ වූ ව්‍යාපෘති සඳහා යොදා ඇත.
මෙම වැඩසටහනට අදාළව 2021 වර්ෂයේ අනුමත කරන ලද එහෙත් වැඩ අවසන් නොවීම හේතුවෙන් ව්‍යාපෘති 181 ක් 2022 වසර සඳහා ක්‍රියාත්මක කිරීමට තිබුණි. එයින් ව්‍යාපෘති 26 ක් අවලංගු කරන ලදි. ඉතිරි ව්‍යාපෘති 155 න් ව්‍යාපෘති 146 ක වැඩ 2022.12.31 වන විට නිම කර ඇත. තවත් ව්‍යාපෘති 09 ක වැඩ ඉතිරි වී ඇත.



නානට්ටාන් වෙළඳ සංකීර්ණය අලුත්වැඩියා කිරීම
නානට්ටාන් ප්‍රා.ස - උතුරු පළාත



වෑගම පෙර පාසල අළුත්වැඩියා කිරීම
රිදීගම ප්‍රා.ස - වයඹ පළාත

3. පුස්තකාල සංවර්ධන වැඩසටහන

2021 වර්ෂයේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කල විද්‍යුත් පුස්තකාල 50 ක් සඳහා උපකරණ ලෙස පරිඝණක, කාර්යාලීය මේස, කාර්යාලීය පුටු, පරිඝණක මේස, පරිඝණක පුටු, රවුටර් ආදිය මිල දී ගන්නා ලදි. ඒ අනුව 2022 වර්ෂයේදි එම බිල්පත් පියවීම පමණක් සිදු කරන ලදි.

2022 ප්‍රතිපාදන (රු.)	2022.09.30 දිනට වියදම (රු.)	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
23,740,000.00	23,740,000.00	100%	100%

4. 2021 වර්ෂයේ ක්‍රියාත්මක කළ ග්‍රාමීය සහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන (අයවැය යෝජනා - 36)

“ගම සමඟ පිළිසඳරක් සංවර්ධන ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම, කුඩා වාරි මාර්ග ව්‍යාපෘති, කෘෂි මාර්ග, සනීපාරක්ෂක පහසුකම්, වතු හා දුෂ්කර ප්‍රදේශවල කෘෂිකර්ම පහසුකම්, සතිපොල හා ආදාහනාගාර වැඩි දියුණු කිරීම” සඳහා වන අයවැය යෝජනාව.

2022 ප්‍රතිපාදන (රු.)	2022.12.31 දිනට ගෙවූ මුදල (රු.)	2021 වසරේ අර්ධ නිමි ව්‍යාපෘති ගණන	අවලංගු කරන ලද ව්‍යාපෘති ගණන	වැඩ නිමි ව්‍යාපෘති ගණන	2022 වසරේ අර්ධ නිමි ව්‍යාපෘති ගණන	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
493,500,000.00	457,153,780.08	495	170	224	101	93%	80%

මෙම වැඩසටහනට අදාළව 2021 වර්ෂයේ අනුමත කරන ලද එහෙත් වැඩ අවසන් නොවීම හේතුවෙන් ව්‍යාපෘති 495 ක් 2022 වසර සඳහා ක්‍රියාත්මක කිරීමට තිබුණි. එයින් ව්‍යාපෘති 170 ක් අවලංගු කරන ලදි. ඉතිරි ව්‍යාපෘති 325 න් ව්‍යාපෘති 224 ක වැඩ 2022.12.31 වන විට නිම කර ඇත. තවත් ව්‍යාපෘති 101 ක වැඩ ඉතිරි වී ඇත.





2.6.2. ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය

1. අරමුණ

පළාත් පාලන ආයතනයන්හි අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ඵලදායී ලෙස ඉටු කර ගැනීම සඳහා සහය වන තාක්ෂණික හස්තය වශයෙන් ක්‍රියාත්මක වෙමින් සාර්ථක ක්‍රම පිළිබඳව තොරතුරු විසුරුවා හැරීමත්, විශේෂිත ස්ථාන සඳහා සුදුසු කසළ කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ මග පෙන්වීම.

2. 2022 වර්ෂයේ සිව්වන කාර්තුව අවසානය දක්වා ප්‍රගතිය

2022 වර්ෂය සඳහා ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සහයක මධ්‍යස්ථානය වෙත, ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් වෙනුවෙන් රු.200,000, 000.00ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් වූ අතර එම ප්‍රතිපාදනයෙන් රු.40,000,000.00 ක් අයවැය යෝජනා වැය විෂය අංක 130–2–21-024-2504 සඳහා යොමු කරන ලදී. 2022 වර්ෂය සඳහා කිසිදු නව ව්‍යාපෘතියක් ආරම්භ නොකළ අතර 2021 වර්ෂයේ අවිච්ඡේද ව්‍යාපෘති සඳහා යොදා ගන්නා ලදී. ඒ අනුව, 2022.12.31 දින වන විට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

වැඩසටහන	ප්‍රතිපාදන (රු.)	ව්‍යාපෘතියේ ස්වභාවය	භෞතික ප්‍රගතිය (%)	මූල්‍ය ප්‍රගතිය (%)	2022.12.31 දිනට වියදම (රු.මිලියන)
ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන (ප්‍රාග්ධන)	160,000,000.00	2020/2021 වර්ෂයන්හි ව්‍යාපෘති සඳහා බිල්පත් පියවීම	85	67	135.9

2021 වසරේ ක්‍රියාත්මක කළ අපද්‍රව්‍ය කළමනාකරණය - ප්‍රාදේශීය සභා (අයවැය යෝජනා 36)

01.කොම්පෝස්ට් අංගනවල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම
02. අලි වැට ඉදිකිරීම
03. කසළ කළමනාකරණ උපාංග ලබා දීම
04.මළ අපද්‍රව්‍ය ප්‍රතිකර්ම පද්ධති ඉදිකිරීම
05.ජීව වායු ඒකක ඉදිකිරීම

වැඩසටහන	ප්‍රතිපාදන (රු.)	ව්‍යාපෘතියේ ස්භාවය	භෞතික ප්‍රගතිය (%)	මූල්‍ය ප්‍රගතිය (%)	2022.12.31දිනට වියදම (රු.)
අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රාදේශිය සභා (අයවැයයෝජනා 36)	146,500,000.00	2021වර්ෂයේ ආරම්භ කළ ව්‍යාපෘති සඳහා බිල්පත් පියවීම.	65%	95 %	139,186,736.50



කාත්තාන්කුඩි කවෂිමා අංගනය සහ මළ අපද්‍රව්‍ය ප්‍රතිකර්ම පද්ධතිය



දැරණියගල ජීව වායු ඒකකය

2.6.3. පළාත් පාලන අංශය

1. අරමුණ

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතියේ කාර්යසාධනය කළමනාකරණය කිරීම හා එහි කටයුතු නව තාක්ෂණයත් සමඟ එක් කිරීම මගින් සීඝ්‍ර සංවර්ධන දිශානතියකට යොමු කර වඩාත් මහජන හිතකාමී කාර්යක්ෂම පළාත් පාලන ආයතනයක් බිහිකිරීමට කටයුතු කිරීම.

2. 2022 වර්ෂයේ සිව්වන කාර්තුව අවසානය දක්වා කාර්යසාධනය

කාර්යය	ප්‍රගතිය
I. නව පළාත් පාලන ආයතන සංස්ථාපනය කිරීම.	ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක 25ට අයත් ප්‍රධාන අගනගර මහා නගර සභා බවට පත් කිරීම සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණයට අදාළව අංක අමප/22/1094/605/002 හා 2022.08.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මහා නගර සභා ස්ථාපිත කර නොමැති දිස්ත්‍රික්ක 07ක අග නගර සඳහා පවතින නගර සභා මහ නගර සභා බවට සංස්ථාපනය කිරීමේ කටයුතු සිදු කරන ලද අතර, මෙවන විට කෑගල්ල,පුත්තලම, කළුතර,වව්නියාව සහ ත්‍රිකුණාමලය යන නගර සභා 05 මහා නගර සභා බවට සංස්ථාපනය කර ගැසට් නිවේදන නිකුත් කරන ලදී. අම්පාර හා මන්නාරම නගර සභා මහ නගර සභා බවට සංස්ථාපනය කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමප/22/2003/605/002-II අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇති අතර,එම දිස්ත්‍රික් කමිටු වාර්තා ලද විගස, එම නගර සභා ද්විත්වය මහ නගර සභා බවට සංස්ථාපනය කිරීමට නියමිතව ඇත.
II. සහෝදර නගර/ මිතුරු නගර සංකල්පය ක්‍රියාවට නැඹීම	සහෝදර නගර/ මිතුරු නගර සංකල්පය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශය සකස් කිරීම සඳහා සියලු කමිටු සාමාජිකයින්ගෙන් නිරීක්ෂණ සහ ඊට ඇතුළත් විය යුතු කරුණු පිළිබඳ අදහස් කැඳවා අවසන් කෙටුම්පත් මාර්ගෝපදේශය සකස් කර ඇත.ඒ සඳහා වන අවසන් සංශෝධන ඇතුළත් අවසන් වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර පළාත් පාලන ආයතන සඳහා නිකුත් කිරීමට නියමිතව ඇත.
III. රාජ්‍ය ගිණුම් කාරක සභා කටයුතු සඳහා පළාත් පාලන ආයතන සමඟ පෙනී සිටීම හා සම්බන්ධීකරණය.	2021 වර්ෂයේ කුරුණෑගල මහ නගර සභාවට අදාළව පැවැති රැස්වීමේදී ලබා දුන් නියෝග පරිදි මේ වනවිට සියලුම පළාත් පාලන ආයතන සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයක් සැකසීම වෙනුවෙන් සාමාජිකයින් 07 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කර ඇති අතර, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත්කරන ලද 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය හා ප්‍රසම්පාදන අත්පොත අදාල කර ගනිමින් එහි අවසන් කෙටුම්පත සකස් කරමින් පවතී.
IV. පළාත් පාලන ආයතනවලට වාහන හා යන්ත්‍රෝපකරණ ලබා දීම	සියලුම පළාත් පාලන ආයතන සඳහා වාහන හා යන්ත්‍රෝපකරණ ලබා දීම සිදු කරනු ලබයි.
V. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා මහජනතාව විසින් පාර්ලිමේන්තුව වෙත යොමුකරනු ලබන ගැටලු	2022 වර්ෂය සඳහා ඉදිරිපත්වූ පාර්ලිමේන්තු ප්‍රශ්න ගණන 06ක් වන අතර, එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයා ඇත. මේ වර්ෂය තුළ මහජන පෙත්සම් කාරක සභාව වෙතින් මෙම අංශයට ලැබුණු පෙත්සම් 06න් පෙත්සම් 01කට අදාළ පිළිතුරු සපයා ඇති අතර ඉතිරි 05 සඳහා පිළිතුරු වාර්තා ලබා ගැනීමට අදාළ පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත යොමු කර ඇත. එම පෙත්සම් සඳහා පිළිතුරු ලැබුණු පසු පෙත්සම් කාරක සභා වෙත යොමු කිරීමට කටයුතු කෙරේ. උපදේශක කාරක සභාව වෙතින් යෝජනා 03ක් ඉදිරිපත් වී ඇති අතර, එම යෝජනාවලට අදාළව පිළිතුරු උපදේශක කාරක සභා වෙත යොමු කර ඇත.

VI. මහජන පැමිණිලි විමර්ශනය කිරීම		පැමිණිලි සංඛ්‍යාව	ගනු ලැබූ ක්‍රියාමාර්ගය
	පළාත්වලින් ලැබුණු පැමිණිලි	5148	පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇත.
	පොදු පැමිණිලි	118	අදාළ ආයතනවලට යොමු කර ඇත
VII. පළාත් පාලන ආයතන සපයනු ලබන සේවාවන් සඳහා තොරතුරු තාක්ෂණ විසඳුම් ලබාදීම.	වයඹ සංවර්ධන අධිකාරිය මගින් හඳුන්වා දෙනු ලබන CAT 2020 තොරතුරු තාක්ෂණ පද්ධතිය ලබා ගැනීමට මේ වන විට පළාත් පාලන ආයතන 341 න් එකඟතාවය පළ කරන ලද පළාත් පාලන ආයතන ගණන 254 ක් වන අතර, මෙම ආයතන මේ වන විට වයඹ සංවර්ධන අධිකාරිය සමඟ සම්බන්ධ වී අවශ්‍ය පූහුණු වීම් සහ පද්ධතිය සංස්ථාපනය කිරීමේ කටයුතු සම්පාදනය කරමින් පවතී.		

2.6.4. පළාත් සභා අංශය

1. අරමුණ

පළාත් සභාවල ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම, මධ්‍යම රජය හා පළාත් සභා අතර සම්බන්ධීකරණය හා පළාත් සභාවල මානව සම්පත් සංවර්ධනය මගින් ඵලදායී හා කාර්යක්ෂම පළාත් සභා ක්‍රමයක් ඇති කිරීම.

2. 2022 වර්ෂයේ සිව්වන කාර්තුව අවසානය දක්වා කාර්යසාධනය

කාර්යය	ප්‍රගතිය
I. අන්තර් පළාත් විෂය සම්බන්ධීකරණ සමුළුව පැවැත්වීම	ගරු පළාත් ආණ්ඩුකාරවරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන් සහ අදාළ ආයතනවල නියෝජිතයන් සම්බන්ධ කර ගනිමින් පවත්වන අන්තර් පළාත් විෂය සම්බන්ධීකරණ සමුළුව අවස්ථා පහකදී (5) පවත්වා ඇත.
II. ඉඩම් අත් කරගැනීම් කටයුතු	1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීම් පනතේ 2 වගන්තියේ නියමය නිකුත් කිරීමේ සිට ඉදිරි කටයුතු සඳහා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත්කර තිබූ ඉල්ලීම් 34ක් ඇතුළු ලිපි ලේඛන සමඟ ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කිරීමද, 04 වන වගන්තිය ප්‍රකාරව විරෝධතා පරීක්ෂණ පැවැත්වීම සඳහා පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව නිලධාරීන් 09 දෙනෙකු පත් කිරීමද, 38(අ) අතුරු විධානය යටතේ ඉඩම් අත්කර ගැනීමට අදාළව ඉඩම් අමාත්‍යාංශයට නිර්දේශ 12ක් ඉදිරිපත් කිරීමද, 50(1) වගන්තිය යටතේ අත්හැරීම් 07ක් ද සිදු කර ඇත.
III. පළාත් පාලන ආයතන සතු දේපල තක්සේරු කටයුතු	පළාත් පාලන ආයතන සතු දේපලවල තක්සේරු කටයුතු විධිමත් කිරීම කඩිනම් කිරීමට ක්‍රමවේදයක් සකස් කර ඇත.
IV. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල නිලධාරීන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම	පළාත් සභා සඳහා බඳවාගෙන ඇති වයස අවුරුදු 45ට වැඩි ස්ථිර පත්වීම් ලබා විශ්‍රාම වැටුප් අහිමි නිලධාරීන්ගේ තොරතුරු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු කරමින් ඔවුන් සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරීමට උපදෙස් ඉල්ලා ඇත. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි එලෙස පළාත් සභාවන්හී සේවය කරනු ලබන නිලධාරීන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා පළාත් වෙතින් තොරතුරු නැවත ගෙන්වා ගැනීමට කටයුතු කර එම තොරතුරු සාරාංශගත කරමින් පවතී.
V. කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කිරීම	2013 වසරින් පසු කාර්යමණ්ඩල සමාලෝචනයක් සිදු කර නොමැති බැවින් කාර්යමණ්ඩල සමාලෝචනයක් සිදු කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග මූලික සාකච්ඡාවක් පැවති නමුත් රටේ පවතින අයහපත් ආර්ථික තත්වය මත වියදම් සීමා කිරීමට රජය විසින් පියවර ගැනීම හේතුවෙන් එම කටයුතු තාවකාලිකව අත්හිටුවීමට පියවර ගත් අතර 2022.12.21 දින පැවති අන්තර් පළාත් විෂය සම්බන්ධීකරණ සමුළුවේදී පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ ඉල්ලීම මත පළාත් සභාවල ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු සම්බන්ධව කාර්යමණ්ඩල සමාලොචනයක් 2023 වසරේ සිදු කිරීමට යෝජනා විය.

VI. පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා නව තනතුරු ඇති කිරීම	පළාත් සභා හා පළාත් පාලන ආයතන සඳහා නව තනතුරු ඇති කිරීමට කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2014 පරිදි ලැබී ඇති ඉල්ලීම් 73ක් නිර්දේශ කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරි කටයුතු සඳහා යොමු කර ඇත.
VII. වාහන බලපත්‍ර කටයුතු	සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 යටතේ පළාත් සභාවල විශ්‍රාමික නිලධාරීන් වෙත වාහන බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව පළාත්වලින් ලද අයදුම්පත් 18ක් නිර්දේශ කර වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
VIII. පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම	පාර්ලිමේන්තු ප්‍රශ්න 04ක් සඳහා පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගෙන් තොරතුරු ලබා ගෙන පිළිතුරු පාර්ලිමේන්තුව වෙත යොමු කර ඇත.
IX. උපදේශක කාරක සභා යෝජනා පිළිබඳ කටයුතු	උපදේශක කාරක සභා වෙත ඉදිරිපත් කර ඇති යෝජනා 06ක් සම්බන්ධව පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගෙන් තොරතුරු කැඳවා උපදේශක කාරක සභාව වෙත පිළිතුරු යොමු කර ඇත.
X. මහජන පැමිණිලි පිළිබඳ කටයුතු	පළාත් සභා කටයුතුවලට අදාළව ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, අනෙකුත් අමාත්‍යාංශ ආයතන සහ මහජනතාව විසින් යොමු කරනු ලැබූ පැමිණිලි 261ක් සම්බන්ධව අදාළ පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කිරීම
XI. පළාත් සභා තොරතුරු යාවත්කාලීන කිරීම	පළාත් සභා ධූරධාරීන් හා නිලධාරීන් සම්බන්ධ කරගත හැකි තොරතුරු කාර්තුමය වශයෙන් යාවත්කාලීන කිරීම සිදු කර ඇත.

2.6.5. නීති අංශය

1. අරමුණ

රටේ සමස්ත ජනතාවගේ පොදු අපේක්ෂාවන් මුදුන් පත්වන ආකාරයට, ඵලදායීවූද , කාර්යක්ෂමවූද ජනතාවාදී ප්‍රාදේශීය ආණ්ඩුකරණයක් ශ්‍රී ලංකාව තුළ පවත්වා ගෙනයාම සහතික කරලීම සඳහාත් සමානාත්මතාවයෙන් යුතු තිරසර මානව සංවර්ධනයක් ලහා කර ගැනීම සඳහාත් පහසුකම් සළසාලීම සහ උපදෙස් ලබා දීම පිණිස අමාත්‍යාංශයේ නීති අංශය ස්ථාපිත කර ඇත.

2. 2022 සමස්ත ප්‍රගතිය

කාර්යය	ප්‍රගතිය
1. මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා පනත සංශෝධනය	මහා නගර සභා ,නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා සකස් කරන ලද අවසන් කෙටුම්පත් නව අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය එකඟතාවය ලබාගැනීම සඳහා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඊට අනුමැතිය ලැබී ඇති අතර එහිදී 2021.07.19 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගෙන ඇති තීරණයක් පරිදි පවත්නා නීතිවල සංශෝධන හෝ නව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන අවස්ථාවලදී අදාළ කෙටුම්පත් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට ප්‍රථම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ අදහස් හා යෝජනා ලබාගත යුතු බවට උපදෙස් ලැබී ඇත. ඒ අනුව එම පනත් කෙටුම්පත් පිළිබඳව ගරු ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ගෙන් ලැබුණු අදහස් හා යෝජනා කෙටුම්පත්කරණ කටයුතු සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කොට ඇත.
2. ජලභීතිකා රෝගය තුරන් කිරීම සහ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥා පනත සංශෝධනය කිරීම	මීට අදාළ ආඥා පනත සංශෝධන පනත් කෙටුම්පතේ කටයුතු අවසන් කිරීම සඳහා ප්‍රතිපත්තිමය එකඟතාවය ලබාගැනීමට 2021.04.27 දින ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් ලබාගත් අමාත්‍ය මණ්ඩල එකඟතාවය මත අවසන් කෙටුම්පත සකසා නීතිපතිගේ සහතිකය සඳහා ඉදිරිපත් කිරීමට නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කෙරිණි. ඔහුගේ නිර්දේශ පරිදි පශු සම්පත් අමාත්‍යාංශයේ නිරීක්ෂණ ලබාගතයුතු වගන්ති කිහිපයකට එම අමාත්‍යාංශයේ නිරීක්ෂණ ලබාගෙන නීති කෙටුම්පත් සම්පාදක වෙත යවා කෙටුම්පත් සකස් කර නීතිපතිගේ සහතිකයට යොමු කිරීම සඳහා ඉදිරිපත් කර ඇත
3. පළාත් සභා ජන්ද විමසීම් පනත සංශෝධනය කිරීම.	2017 අංක 17 දරණ පළාත් සභා ජන්ද විමසීම් (සංශෝධන) පනත මගින් සංශෝධිත 1988 අංක 02 දරණ පළාත් සභා ජන්ද විමසීම් පනත සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට 2021.03.23 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් එම අමාත්‍ය මණ්ඩල සංදේශය පසුව සලකා බැලීම සඳහා කල් තබා ඇත.
4. උසාවි දඩ මුදල් හා	පළාත් පාලන ආයතන වෙත හිමිවිය යුතු මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් සෘජුවම පළාත් පාලන

ඉඩම් පැවරීම මත අයවන මුද්දර ගාස්තු පළාත් පාලන ආයතන වෙත ලැබීම විධිමත් කිරීම හා කඩිනම් කිරීම.	ආයතන වෙත ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන ඇත.මේ වන විට පළාත් සභා නොවීම නිසා මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නොහැකි තත්වයක් උද්ගතවී ඇත. ඒ අනුව පවත්නා නඩු තීන්දු ප්‍රකාරව ගතහැකි යම් ක්‍රියාමාර්ගයක් වේද යන්න පිළිබඳ නීතිපතිගේ අදහස් ලබාගැනීම සඳහා යොමු කිරීමට 2021.12.14 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. එකී පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව සහ මුදල් කොමිෂන් සභාවේ අදහස් ලබාගන්නා ලෙස අමාත්‍ය මණ්ඩලයෙන් නියම කර ඇති බැවින් ඒ සඳහා පවත්වන ලද රැස්වීමේදී ගන්නා ලද තීරණ අනුව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට නියමිතය.
5. පළාත් පාලන ආයතන සංස්ථාපනය හා පුනස්ථාපනය කිරීමට අදාළ ගැසට් නිවේදන පළ කිරීම	පළාත් පාලන අංශයෙන් නව මහානගර සභා 5 ක් සංස්ථාපනයට සහ නව ප්‍රාදේශීය සභා 2 ක් පුනස්ථාපනය සඳහා ගැසට් නිවේදන සකස් කිරීමට මෙම අංශය වෙත යොමු කර ඇති අතර ඊට අදාළ ගැසට් නිවේදන පළකර අවසන් කර ඇත.
7. නව පළාත් පාලන ආයතන සංස්ථාපනය කිරීමෙන් අනතුරුව කොට්ඨාස සීමා නීර්ණය කිරීමට අදාල කටයුතු.
8. පළාත් පාලන ආයතන සඳහා අතුරු ව්‍යවස්ථා සකස් කිරීමේ වැඩසටහන
9. ජලභීතිකා ආඥා පනතේ සංශෝධන කටයුතු අවසන් කිරීම.
10. පළාත් පාලන ආයතනවල නෛතික ගැටළු වලට අදාල උපදෙස් ලබාදීම.

2.7.10. ක්‍රමසම්පාදන අංශය

1. 2005 සිට 2022 දක්වා කාලය තුළ ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ පශ්චාත් ඇගයීමක් පැවැත්වීම.
2. අමාත්‍යාංශයේ දත්ත විශ්ලේෂණ සහ දෘශ්‍යකරණ ඒකකයේ මෘදුකාංග සක්‍රීය කිරීම.
3. 2022 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කිරීම.
4. 2024 අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කිරීමට නියමිත 2023 වර්ෂයේ අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාව සකස් කිරීම.
5. පළාත් පාලන අංශයෙන් උගත් පාඩම් වලින් තෝරාගත් හොඳම භාවිතයන් සඳහා වීඩියෝ ක්ලිප් නිර්මාණය කිරීම.

2.7.11. ව්‍යාපෘති අධීක්ෂණ අංශය

1. මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සියලුම විදේශාධාර ව්‍යාපෘති, ව්‍යාපෘති අරමුණු කරා සම්බන්ධීකරණය කිරීම
2. නව ව්‍යාපෘති යෝජනා හඳුනා ගැනීම සඳහා අවශ්‍යතා විශ්ලේෂණය කිරීම (Need Analysis) හා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම
3. ජාතික මෙහෙයුම් කමිටු (NSC) රැස්වීම් 06ක් පැවැත්වීම හා ඒ තුළින් පැන නගින ගැටලු නිරාකරණය කිරීම
4. ව්‍යාපෘති ප්‍රගතිය පසුවිපරම් කිරීම හා මාසික ප්‍රගති වාර්තා සකස් කිරීම

2.7.12. ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

දැනට ව්‍යාපෘතියේ පැන නැගී ඇති ගැටළු නිරාකරණය කර පාලම් තට්ටු මෙරටට ගොඩබෑමෙන් අනතුරුව, පාලම් 110 ක් පමණ භෞතික ඉදිකිරීම් නිම කිරීමට බලාපොරොත්තුවේ.

2.7.13. පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය/ පුරනැඟුම (අතිරේක ප්‍රතිපාදන)

2023 වර්ෂය සඳහා වූ ව්‍යාපෘතියේ ඉලක්කය වනුයේ උතුරු මැද, වයඹ, මධ්‍යම සහ ඌව පළාත්වල පවුල් 72,000 කට ආරක්ෂිත පානීය ජල පහසුකම් ලබා දීම සඳහා ඉතිරිව ඇති ඉදිකිරීම් නිම කිරීම සහ එමඟින් පවතින නිදන්ගත වකුගඩු රෝගය සමනය කිරීම සඳහා සහාය වීමයි. එම ප්‍රදේශයන්හි 2022 වර්ෂය දක්වා නිම කරන ලද පානීය ජල සම්පාදන ව්‍යාපෘති මඟින් පවුල් 28,000 කට නව ජල සම්බන්ධතා පහසුකම් සැලසේ. ඉතිරි ඉදිකිරීම් කටයුතු අවසන් වූ විට 2023 වර්ෂයේදී පවුල් 12,000 කට නව පානීය ජල සැපයුම් පහසුකම් ලබා දෙනු ඇත. දැනට ජලය ලබා ගන්නා පවුල් 60,000 කට පිරිසිදු හා අඛණ්ඩ ජල සැපයුම සැපයීමටද මෙම 2023 වර්ෂය තුල හැකි වේ.
2023 වර්ෂය තුල ප්‍රාදේශීය සභා 29 ක ධාරිතාවය ඉහළ නැංවීම හා සම්බන්ධ සංවර්ධන කටයුතු මඟින් ප්‍රාදේශීය සභා ජනතාවට වඩා හොඳ සේවාවක් සැපයීම අඛණ්ඩව සිදු කෙරේ.
2023 වර්ෂය සඳහා රු. මිලියන 2000 ක මුදලක් ලැබී ඇති අතර එම මුදල ඉහත අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීමට නියමිතය.

2.7.14. මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය (GCWWMP)

i. කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුළ තෝරාගත් කිලෝමීටර් 10ක මලාපවහන මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ කිලෝමීටර් 125ක මලාපවහන මාර්ගවල තත්ත්වය තක්සේරු කිරීම.

- W1 මලාපවහන මාර්ග විමර්ශන කටයුතු.

ii. අපජල පොම්පාගාරය සැලසුම් කිරීම, ඉදිකිරීම, ස්ථාපනය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම.

- වනාතමුල්ල පොම්පාගාරය 2023 පළමු කාර්තුව අවසන් වන විට අවසන් වේ.
- මාලිගාවත්ත, තිඹිරිගස්යාය, බොරැල්ල සහ Vystwyke පොම්පාගාර ඉදිකිරීම.
- වනාතමුල්ල සහ Vystwyke පොම්පාගාර ආශ්‍රිතව පීඩන නල මාර්ග ඉදිකිරීම

2.7.15. මහ කොළඹ ජල සහ අප ජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 2 හා 3 කොටස (GCWWIIMP)

1. මලාපවහන 97.2km (89 km (ගුරුත්වාකර්ෂණ මලාපවහන) + 8.2 km (බල ප්‍රධාන)) තත්ත්වය තක්සේරු කිරීම - සේවායෝජකයා විසින් කොන්ත්‍රාත්කරුට අන්‍යෝන්‍ය අවබෝධතාවය මත කොන්ත්‍රාත්තුව අවසන් කළ යුතු බව දැනුම් දෙන ලදී.
2. කිරුළපන ජල පෝෂක ප්‍රදේශය සඳහා නව ගුරුත්වාකර්ෂණ කාණු, බල ප්‍රධාන මාර්ග සහ පොම්පාගාර සැපයීම - අරමුදල් නොමැතිවීම හේතුවෙන් තාවකලිකව අත්හිටුවා ඇත.
3. වැල්ලවත්ත අපජල පවිත්‍රාගාරය (WWTP) – සේවායෝජකයා විසින් කොන්ත්‍රාත්කරුට අන්‍යොන්‍ය අවබෝධතාවය මත කොන්ත්‍රාත්තුව අවසන් කළ යුතු බව දැනුම් දෙන ලදී.
4. කිරුළ-නාරාහේන්පිට ප්‍රදේශයට මලාපවහන පහසුකම් ලබාදීම - කොන්ත්‍රාත්තුව 2023 පළමු කාර්තුවේදී ප්‍රදානය කිරීමට නියමිතය.
5. දෝෂ සහිත මලාපවහන අලුත්වැඩියා කිරීම සහ දක්ෂිණ ජල පෝෂක ප්‍රදේශයේ අඩු ධාරිතාවයෙන් යුත් මලාපවහන ඉහළ නැංවීම සහ ක්‍රියාත්මක කිරීම - කොන්ත්‍රාත්තුව 2023 පළමු කාර්තුවේදී ප්‍රදානය කිරීමට නියමිතය.

2.7.16. නැගී එන කලාප ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP)

අදියර II හා අදියර III යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති වාරි මාර්ග, මාර්ග හා ජල යෝජනා අනුව සම්පූර්ණ කර ව්‍යාපෘතිය අවසන් කිරීම.

2.7.17. සාමාන්‍ය අධ්‍යාපන නව්‍යකරණ (GEM) ව්‍යාපෘතිය

ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම

2.7.18. ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය (PSSP)

ක්‍රියාකාරකම	උප ව්‍යාපෘති සංඛ්‍යාව
1. නව ඉදිකිරීම් හා අලුත් වැඩියා කිරීම	
I. රසායනාගාර	17
II. සායන මධ්‍යස්ථාන	40
III. දන්ත ශල්‍යාගාර	17
IV. ඖෂධ ගබඩා	19
V. ETU	27
VI. සෞඛ්‍ය නිල නිවාස	55
VII. වෙනත්	253
2. දැනුවත් කිරීමේ වැඩසටහන්	159
3. IT පහසුකම් හා සංවර්ධන	70
4. වෛද්‍යමය උපකරණ මිලදී ගැනීම	136
5. වෛද්‍ය නොවන උපකරණ මිලදී ගැනීම	121
6. සෞඛ්‍ය කාර්ය මණ්ඩල ධාරිතා සංවර්ධන	196
7. උපයෝගිතා වාහන මිලදී ගැනීම	23

2.7.19. TCAMP - පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය

1. ඉතිරි කොන්ත්‍රාත් පැකේජ වල වැඩ අවසන් කිරීම.
2. සැලසුම් ආයතනයේ ඉතිරි ධාරිතා සංවර්ධන වැඩ අවසන් කිරීම.
3. තාක්ෂණික ඇඟයුම් වර්තා සකස් කිරීම
4. ව්‍යාපෘතිය අවසන් වර්තා සකස් කිරීම.

2.7.20. ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP)

රටේ පවතින අහිතකර ආර්ථික තත්වය සමනය කිරීම සඳහා සහය ලබා දිය හැකි උප ව්‍යාපෘති 248ක් පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ 2023.01.01 දාන සිට 2023.07.31 වන දක්වා ක්‍රියාත්මක කර අවසන් කිරීමට නියමිතව ඇත.

- සූර්ය බලශක්ති සංවර්ධනය
- අපනයන සංවර්ධනය
- ආනයන ආදේශන සංවර්ධනය
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය
- ජීවනෝපාය සංවර්ධනය

2.7.21. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG)

- යහපාලන පළාත් සභා හා පළාත් පාලන ක්‍රමයක් උදෙසා එම ක්ෂේත්‍රයන් හි මහජන නියෝජිතවරුන් හා නිළධාරීන්ගේ ධාරිතා වර්ධනය.
- පළාත් සභා වල හා පළාත් පාලන ආයතනවල සංවිධාන ව්‍යුහයන් හා කළමණාකරන හැකියාවන් වැඩිදියුණු කිරීමෙන් ඒ ඒ පළාත් සභාවලට හා පළාත් පාලන ආයතනවලට සහය වීම.
- පළාත් සභා හා පළාත් පාලන කේෂ්ත්‍රයේ උපදේශක පැවරුම් බාරගැනීම.
- පළාත් සභා හා පළාත් පාලන ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීම හා තොරතුරු බෙදා හැරීම.

- පළාත් පාලන පුවත්පත (කාර්තුමය) සිංහල/ දෙමළ
- පළාත් පාලන සභරාව (වාර්ෂික)

පාඨමාලාවේ ස්වභාවය	පාඨමාලා වර්ග ගණන
ඩිප්ලෝමා පාඨමාලාවන්	4
සහතිකපත්‍ර පාඨමාලාවන්	13
කෙටි කාලීන පුහුණු වැඩසටහන්	198
කාර්ය මණ්ඩලය සඳහා වන ධාරිතා සංවර්ධන වැඩසටහන්	04
එකතුව	**198**

2.7.22. දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDF)

- ✓ පළාත් පාලන ආයතන වල ආදායම් උත්පාදක ව්‍යාපෘති සඳහා වන ණය ඉල්ලුම සම්පූර්ණ කිරීම.
- ✓ ආයතනික හැකියාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිකිරීම.
- ✓ පළාත් පාලන ආයතන සඳහා තරගකාරී මූල්‍ය දායකත්වයක් ලබා දීම.



ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
කේ.ඩී.එන්.රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

04 පරිච්ඡේදය – කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අනු අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම		
		100%-90%	75%-89%	50%-74%
1	පළාත් සභා හා පළාත් පාලන මට්ටමෙන් පවත්වන ලද ධාරිතා සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව	**90**		
2	පළාත් පාලන සේවා වැඩිදියුණුකිරීම සඳහා අමාත්‍යාංශ අයවැය මඟින් ප්‍රදාන ලද පළාත් පාලන ආයතන සංඛ්‍යාව (පළාත් පාලන ප්‍රදේශ)			**40**
3	අමාත්‍යාංශය මඟින් ලද වාර්ෂික ප්‍රතිපාදන උපයෝගීකිරීමේ ප්‍රතිශතය	**90.62**		
4	‘‘ඍණ අපද්‍රව්‍ය කළමනාකරණ වාර්ෂික සැලසුම්‘‘ සකස් කර ක්‍රියාත්මක කරන ලද පළාත් පාලන ආයතන සංඛ්‍යාව (අපද්‍රව්‍ය රැස් කිරීම / කොම්පෝස්ට්කරණය/ ප්‍රතිචක්‍රීකරණ.....)			**60**
5	දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය ස්ථාපනය කර ක්‍රියාත්මක කරනු ලබන පළාත් පාලන ආයතන සංඛ්‍යාව	**100**		
6	පවත්වන ලද පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ සමූළු සංඛ්‍යාව	**100**	_	_
7	විදේශ ආධාර ව්‍යාපෘති සඳහා පවත්වන ලද ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් සංඛ්‍යාව			**67**
8	සිදු කරන ලද පර්යේෂන / අධ්‍යයන සංඛ්‍යාව සහ පවත්වන ලද ඇගයීම් සංඛ්‍යාව	_	_	_

05 පරිච්ඡේදය – තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කර තිබෙන "ශ්‍රීලංකාවේ තිරසාර සංවර්ධන ඉලක්ක නිර්ණායක - 2017" වාර්තාව පදනම් කරගෙන අදාළ ඉලක්ක සහ නිර්ණායකවල අංක පහත වගුවට ඇතුළත් කර ඇති බව කාරුණිකව සලකන්න.

අනු අංකය	අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
				0% - 49%	50% - 74%	75% - 100%
1	**ඉලක්ක අංක . 1** සියලුම ස්ථාන ආවරණය කරමින් සියලු ආකාරයේ දුගීභාවය දුරලීම	1.5	1.1.1 1.2.1			
2	**ඉලක්ක අංක . 2** සාගින්න අවසන් කර ආහාර සුරක්ෂිතතාවය සහ වැඩිදියුණු කළ පෝෂණය සාක්ෂාත් කිරීම සහ තිරසාර කෘෂිකර්මය සඳහා අනුබල දීම	2.1 2.2 2.3 2.4 2.a	8.3.1			
3	**ඉලක්ක අංක 3** නිරෝගී ජීවිත තහවුරු කිරීම සහ සියලුම වයස් කාණ්ඩවල සියලු දෙනාගේ යහපැවැත්ම ඉහළ නැංවීම	3.4 3.8 3.9 3.b	2.2.1 3.1.1			
4	**ඉලක්ක අංක 4** සියල්ල ඇතුළත් සහ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලීන ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම	4.1 4.a 4.c	4.1.1 4.a.1 4.c.1			
5	**ඉලක්ක අංක 5** ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඇති කිරීම සහ සියලුම කාන්තාවන් සහ ගැහැණු ළමුන් බලගැන්වීම	5.5 5.c				
6	**ඉලක්ක අංක 6** සියලු දෙනාට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් පැවතීම සහතික වීම	6.1 6.3 6.b	6.1.1			

අනු අංකය	අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
				0% - 49%	50% - 74%	75% - 100%
7	**ඉලක්ක අංක 9** ඔරොත්තු දීමේ හැකියාව සහිත යටිතල පහසුකම් ගොඩනැගීම, සියල්ල ඇතුළත් සහ තිරසාර කාර්මිකකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදන කෙරෙහි උනන්දු කරවීම	9.1 9.c				
8	**ඉලක්ක අංක 10** රටවල් තුළ සහ රටවල් අතර අසමානාත්මතාවය අවම කිරීම.	10.2	1.4.1			
9	**ඉලක්ක අංක 11** නගර සහ මානව ජනාවාස සියල්ල ඇතුළත්ව, ආරක්ෂිත, ඔරොත්තු දෙන සහ තිරසාර බවට පත්කිරීම.	11.2 11.6 11.7 11.a	10.7.2 12.4.2			
10	**ඉලක්ක අංක 12** තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන රටා තහවුරු කිරීම	12.4 12.5	1.5.3			

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ සහ අභියෝග

ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ඉලක්ක නිර්ණායක - 2017 වාර්තාව අනුව තිරසර සංවර්ධන අභිමතාර්ථ හා ඉලක්ක සමස්ථ රටම එක ඒකකයක් ලෙස සැලකීමට ලක් කොට සකස් කර ඇත. එම නිසා ශ්‍රී ලංකාවේ පවතින ඒ ඒ අමාත්‍යාංශ, ආයතන හෝ දෙපාර්තමේන්තුවලට වෙන් වෙන්ව තිරසර සංවර්ධන අභිමතාර්ථ හෝ ඉලක්ක සකස් කිරීමක් සිදු කර නොමැත. කෙසේ වෙතත් මෙම කාර්යසාධන වාර්තාවේ ආකෘතිය අනුව තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ සහ අභියෝග පිළිබඳ විස්තර ඉදිරිපත් කළ යුතු වේ.

මෙම අමාත්‍යාංශය යටතේ විවිධ ක්ෂේත්‍රවල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වන අතර පළාත් පාලන ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ජාතික මට්ටමෙන් කටයුතු කරයි. එම සංවර්ධන ව්‍යාපෘතිවල, වැඩසටහන්වල අරමුණු හා විෂය පථය අනුව මෙම අමාත්‍යාංශයට අදාළ තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඇත. එම ඉලක්ක ළඟා කර ගැනීම සඳහා මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති, වැඩසටහන් මඟින් යම් දායකත්වයක් ලැබෙන අතර ඒ ඒ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා වන දායකත්වය මැනීම අසීරු කරුණක් වී ඇත. විශේෂයෙන් පදනම් දත්ත නොතිබීම, ඉලක්ක ළඟා කර ගැනීමට මෙම අමාත්‍යාංශයේ දායකත්වය සමස්ථ රටේ දායකත්වයෙන් කොපමණ ප්‍රතිශතයක්ද යන්න ගණනය කිරීමට නොහැකිවීම ඉහත අසීරුතාවයට මූලික හේතු වී තිබේ.

අධ්‍යාපන, සෞඛ්‍යය, වාරි මාර්ග, මහා මාර්ග, සනීපාරක්ෂක සේවා, පානීය ජල සැපයුම්, ප්‍රවාහන සම්බන්ධතා හා පළාත් පාලන ක්ෂේත්‍රවලට අදාළ ව්‍යාපෘති හා වැඩසටහන් මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීම මඟින් තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා යම් දායකත්වයක් ලබා දී ඇති බව ඒ ඒ ක්ෂේත්‍ර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති හා වැඩසටහන් 2022 වසරේ අත් කරගත් ප්‍රතිඵල හා නිමැවුම් මඟින් පෙනී යයි.

06 පරිච්ඡේදය – මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඌනතා / (අතිරික්ත) **
ජ්‍යෙෂ්ඨ	37	24	13
තෘතීයික	05	01	04
ද්විතියික	142	121	21
සුළු	59	45	14

6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

අනුමත කාර්ය මණ්ඩලය නොමැති නිසා රාජකාරී කටයුතු නිසි පරිදි සිදුකිරීම බාධාවක්ව ඇත. කෙසේ වෙතත් දැනට පවතින කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරීමෙන් ආයතනයේ ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

6.3. කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු. මි.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
නවක සංවර්ධන නිලධාරීන් රැකියා ස්ථානය සඳහා අනුගත කිරීමේ පුහුණු වැඩසටහන සඳහා සංග්‍රහ වියදම	30	2022.01.27 2022.02.03	33,896.00		දේශීය	මනා දැනුම ක් ලැබිණි.
ඩිජිටල් අලෙවිකරණය සහ Drop Shipping පිළිබඳ පුහුණු වැඩසටහන	01	2022.01.22	8,500.00		දේශීය	
තෙදින සේවාරම්භක පුහුණු වැඩසටහන	01	2022.10.10 2022.10.11 2022.10.14	15,000.00		දේශීය	
ගබඩා කළමනාකරණය සහ ඉන්වෙන්ට්‍රි පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන	01	2022.10.17 2022.10.18	7,000.00		දේශීය	

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු. මී.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
රියදුරන් හා කාර්යාල කාර්ය සහායකයන් සඳහා විනය හා කාර්යාලීය ආචාරවිධි පිළිබඳ පුහුණු වැඩසටහන	05	2022.02.28 2022.03.02	42,500.00		දේශීය	මනා දැනුම ක් ලැබිණි.
පරිසර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව	01	2022.01.28	151,000.00		දේශීය	
Excel පිළිබඳ උසස් පුහුණු වැඩසටහන	02	2022.03.21 2022.03.24	24,000.00		දේශීය	
පද්ධති සහ ජාල පරිපාලනයේ අත්‍යවශ්‍ය කරුණු පිළිබඳ පුහුණු වැඩසටහන	02	2022.03.24, 25, 31 2023.04.01,07	50,000.00		දේශීය	
ඵලදායිතා පුහුණු වැඩසටහන සඳහා සංග්‍රහ වියදම	අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන්	2023.03.04 2023.03.09 2023.03.11	3,472.00		දේශීය	
දෙමළ භාෂා පුහුණු වැඩසටහන	50	2022.04.04 – 2022.11.13	112,500.00		දේශීය	
දෙමළ භාෂා පාඨමාලාව (පැය 200)	01	2022.08.30 – 2022.10.26	15,000.00		දේශීය	

07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිශ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.5	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රිගත ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.10	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)**			
3.1	මූල්‍ය බලතල ආයතන තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිළධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කර ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ.	විගණන විමසුම් වලට පිළිතුරු සකස් කිරීමේදී අමාත්‍යාංශය යටතේ ඇති අංශ හා ව්‍යාපෘති වලින් තොරතුරුගෙන්වා ගැනීමේදී ඇතිවන ප්‍රමාදයන්	අදාළ ප්‍රමාදයන් අවම කිරීමට කටයුතු කිරීම

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මුදල් රෙගුලාසි 134 (2) ප්‍රකාරව විගණකාධිපතිගෙන් උපදෙස් ලබා ගැනීමෙන් පසුව වර්ෂය ආරම්භයේදී අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කරන ලදි.	අනුකූල වේ.	-	-
6.2	සියළු අභ්‍යන්තර විගණන වාර්තාවලට මසක් තුළ පිළිතුරු සපයා ඇත.	අනුකූල වේ.	-	-
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (14) උප වගන්තිය ප්‍රකාරව සියළු අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.	අනුකූල වේ.	-	-
6.4	සියළු අභ්‍යන්තර විගණන වාර්තා මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.	අනුකූල වේ.	-	-
7	**විගණන හා කළමනාකරණ කමිටුව**			
7.1	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ 1/2019 අනුව වර්ෂය තුළ කළමනාකරණ විගණන කමිටු රැස්වීම් අවම වශයෙන් 04 ක් පවත්වා ඇත.	අනුකූල වේ.	-	-
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිළදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිළධාරියෙකු පත්කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර්ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	දෛනික ධාවන සටහන් සහ සංචිත වාහන පිළිබඳ මාසික සාරාංශ සකස් කළ අතර නියමිත දිනයේ දී විගණකාධිපති වෙත භාර දෙන ලදී .	අනුකූල වේ.	_	_
9.2	අභාවිත වාහන එම තත්ත්වයට පත්වී සය මසක් ගතවීමට පෙර අපහරණය කරන ලදී .	අනුකූල වේ.	_	_
9.3	වාහන ලොග් පොත් යාවත්කාලීන කර පවත්වාගන්නා ලදී .	අනුකූල වේ.	_	_
9.4	සෑම රිය අනතුරක් සම්බන්ධයෙන් ම මු .රෙ.103,104,109 සහ 110 ප්‍රකාරව පියවර ගන්නා ලදී.	අනුකූල වේ.	_	_
9.5	2016.12.29 දිනැති 30/2016 අංක දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන භාවිතය නැවත පරීක්ෂා කරන ලදී.		අනුකූල නොවේ.	ඉන්ධන කෝටා ක්‍රමය හඳුන්වාදීම හේතුවෙන්
9.6	කල් බදු පදනම මත මිලදී ගත් වාහන වල ලොග් පොත් වල පූර්ණ අයිතිය කල්බදු කාලසීමාව අවසන් වීමෙන් පසු පවරන ලදී.	අනුකූල වේ.	_	_
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිගහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිගහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	හිඟ ණය ශේෂ පහත පරිදි වේ 1. එම්.ටී.එස්.ගුනවංශ මයා හිඟ ණය ශේෂ - 143,200/- - නීතිපති දෙපාර්තමේන්තු වේ කොළඹ දිසා අධිකරණයේ DMR 4680/2019 අංකය යටතේ නඩු පවරා ඇත. 2.බී.ඒ.එස්.කේ.අමරසිංහ මයා - හිඟ ණය ශේෂ - රු.30,994/22 නීතිමය කටයුතු කරන ලෙස නීතිපති වෙත දන්වා යවා ඇත.	නඩු තීන්දුවට අනුව ඉදිරි පියවර ගනු ලැබේ
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර නොතිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුම් ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	_		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදයමට බැර කර තිබීම.	_		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබීම	_		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත සේවක සංඛ්‍යාව අනුව කාර්ය මණ්ඩලය වෙත ගෙවීම් සිදු කරන ලදී	අනුකූල වේ.	_	_
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන් වෙත ලිඛිතව රාජකාරි ලැයිස්තුවක් නිකුත් කරන ලදී	අනුකූල වේ.	_	_

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16.3	2017.09.20 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.	–	–
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනතෙහි රෙගුලාසි අනුව තොරතුරු නිලධාරියෙක් පත්කර ඇති අතර විධිමත් තොරතුරු ලේඛනයක් යාවත් කාලීන කර පවත්වාගෙන යනු ලැබේ	අනුකූල වේ.	–	–
17.2	වෙබ් අඩවිය මඟින් ආයතනික තොරතුරු මහජනතාව වෙත සපයා ඇති අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා චෝදනා පළකිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.	–	–
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන සහ 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.	වාර්ෂික වාර්තාව කඩිනමින් ඉදිරිපත් කරනු ලැබේ.	–
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	ආයතනය විසින් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ චක්‍රලේඛ අංක 05 /2008 සහ 05/2008(1) ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තිය/ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර ක්‍රියාත්මක කරනු ලැබේ	අනුකූල වේ.	–	–
18.2	චක්‍රලේඛයෙහි 2.3 ඡේදය ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තිය/ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය සැකසීම සහ ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය සහ ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස්කර තිබේ	අනුකූල නොවේ.	–	–
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.1	2018.01.24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි ඇමුණුම 02 අනුව මානව සම්පත් සැලැස්මක් සකස්කර තිබේ	අනුකූල වේ.	_	_
19.2	ඉහත මානව සම්පත් සැලැස්මෙහි කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙක් සඳහා ම වසරකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සලසා තිබේ	අනුකූල වේ.	_	_
19.3	ඉහත චක්‍රලේඛයේ ඇමුණුම 01 පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන අත්සන්කර තිබේ	අනුකූල වේ.	_	_
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර ඔහු වෙත මානව සම්පත් සංවර්ධන සැලැස්ම ස කස් කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමේ වගකීම පවරන ලදී	අනුකූල වේ.	_	_
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		

ඇමුණුම-01


ගරු අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ලේකම්තුමා
අතිරේක ලේකම් (පළාත් සභා හා පළාත් පාලන) ශ්‍රී ලං.ප සේ
අතිරේක ලේකම් (පාලන හා පුහුණු) ශ්‍රී ලං.ප සේ
අතිරේක ලේකම් (සංවර්ධන) ශ්‍රී ලං.ප සේ
අතිරේක ලේකම් (ව්‍යාපෘති අධීක්ෂණ)
ප්‍රධාන ගිණුම් නිලධාරි ශ්‍රී ලං.ග.සේ
අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ප.සේ)
ප්‍රධාන ඉංජිනේරු ශ්‍රී ලං.ඉ.සේ
ප්‍රධාන ගණකාධිකාරි ශ්‍රී ලං.ග.සේ-I
ප්‍රධාන ගණකාධිකාරි (Monitoring) ශ්‍රී ලං.ග.සේ-I
ප්‍රධාන ගණකාධිකාරි (ශ්‍රී ලංකා ගණලේඛණ) ශ්‍රී ලං.ග.සේ-III/II
ගණකාධිකාරි (සැපයුම් හා අත්පිටකාර්) ශ්‍රී ලං.ග.සේ-III/II
ඉංජිනේරු (සංවර්ධන) ශ්‍රී ලං.ඉ.සේ III/II
ඉංජිනේරු (ව්‍යාපෘති) ශ්‍රී ලං.ඉ.සේ-I
අධ්‍යක්ෂ (ඉංජිනේරු) ශ්‍රී ලං.ඉ.සේ-I
අධ්‍යක්ෂ (සුළු යටිතල) ශ්‍රී ලං.ඉ.සේ-I
ඉංජිනේරු (ව්‍යාපෘති) ශ්‍රී ලං.ඉ.සේ-I
අධ්‍යක්ෂ ජරාවාරු (සුළු පරිපාලන) ශ්‍රී ලං.ඉ.සේ
ඉංජිනේරු (ව්‍යාපෘති) ශ්‍රී ලං.ඉ.සේ-I

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PAF/B/MPA/02/22/08

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 29 දින

ලේකම්

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

කේ.ආර්.ටී. මැණිකේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත: අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

Scanned with CamScanner

මගේ අංකය / எனது இல. / My No.: PAF/B/MPA/02/22/08
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2023 මැයි 29 දින.

ලේකම්

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

Scanned with CamScanner

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

Scanned with CamScanner

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

Scanned with CamScanner

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

ඇතැම් ආයතන විසින් එකතු කරනු ලබන රජයේ වත්කම්වලින් ලැබෙන ගොඩනැගිලි කුලී ආදායම, උක්ත ආදායම් සංකේතාංකය යටතේ රාජ්‍ය ආදායමට බැර නොකරන අවස්ථා පවතින බව විගණනයට නිරීක්ෂණය වී ඇත. ඒ අනුව ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂය තුළදී සංචාරක නිවාස හා නේවාසිකාගාරවලින් රැස්කර තිබුණු රු.1,298,432ක් 20.02.01.01 දරන ආදායම් සංකේතාංකය යටතේ රාජ්‍ය ආදායමට බැර නොකර වෙනත් ආදායම් සංකේතාංක යටතේ රාජ්‍ය ආදායමට බැරකර තිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

2021 ජූනි - ඔක්තෝබර් කාල පරිච්ඡේදය තුළ පදිංචිය සඳහා වෙන්කරදී තිබූ කොළඹ, මොණරාගල සහ මහනුවර නිල පියස 03ක ඉදිකිරීමේ මුළු වියදම රු.1,311,795,048ක් ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත නොකර නොනිමි වැඩ ලෙස දක්වා තිබුණි.

1.6.3 මූල්‍ය වත්කම්

(අ) 2022 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුමේ දෙපාර්තමේන්තු පොත් අනුව හා පාලන ගිණුම අනුව ශේෂය රු.1,802,048,070ක් වුවද, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව ශේෂය රු.1,801,972,683ක් හා කේවල ශේෂ ලැයිස්තුව අනුව එදිනට අයවිය යුතු ණය ශේෂය රු.1,805,321,977ක් වූ හෙයින් පිළිවෙලින් රු.75,387ක් හා රු.3,273,907ක වෙනසක් විය.

(ආ) ඒකාබද්ධ ශේෂ පිරික්සුමට අනුව මුදලින් හා හරස් සටහන් මගින් අත්තිකාරම් අයකර ගැනීම් හා අත්තිකාරම් ගෙවීම් පිළිවෙලින් රු.2,562,501,774ක් හා රු.2,572,631,983ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම අගයන් පිළිවෙලින් රු.47,104,446ක් හා රු.57,234,654ක් ලෙස දක්වා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

(අ) 2015 ජූලි 20 දිනැති හා අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 03 ඡේදයෙහි සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරමින් ආදායම් ඇස්තමේන්තු නිවැරදිව හා තාත්විකව පිළියෙල කළයුතු වුවද, සංශෝධිත ඇස්තමේන්තුව අනුව සමාලෝචිත වර්ෂයේ රජයේ ගොඩනැගිලිවලින් රැස්කිරීමට අපේක්ෂිත කුලී ආදායම රු.1,300,000,000ක් වුවද

Scanned with CamScanner

රැස්කළ තථ්‍ය ආදායම රු.1,504,677,796ක් වූයෙන් ඇස්තමේන්තු කළ ආදායම හා තථ්‍ය ආදායම අතර සියයට 16 ක එනම් රු.204,677,796ක වාසිදායක විචලනයක් විය.

(ආ) යටෝක්ත වක්‍රලේඛයේ 4 (ආ) ඡේදය ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් හිඟ ආදායම් එකතු කර ගැනීමට කටයුතු කිරීම සහ අයවීමට ඇති හිඟ ආදායම් තව තවත් එකුවීම වැළැක්වීම සඳහා ක්ෂණිකව පියවර ගතයුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ගොඩනැගිලි කුලී හිඟ ආදායම රු.341,748,077ක් වී තිබුණි. මෙම ගොඩනැගිලි කුලී හිඟ ආදායම ඉකුත් වර්ෂයේ සංඛ්‍යා හා සැසඳීමේදී රු.18,901,344ක වැඩිවීමක් නිරීක්ෂණය වූ අතර මෙම හිඟ කුලී ආදායමෙන් රු.194,578,337ක් 2019 දෙසැම්බර් 31 දිනට පෙර වර්ෂවල සිට අයවිය යුතුව පවතින හිඟ ආදායම් විය. උක්ත හිඟ කුලී මුදලින් සියයට 22ක් හෙවත් රු.74,210,789ක් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පාලනය වන රජයේ බංගලා, සංචාරක බංගලා සහ නිල නිවාසවලින් අයවිය යුතු හිඟ කුලී ආදායම් ලෙස දක්වා තිබූ අතර රජයේ බංගලා සහ නිල නිවාස 110කින් අයවිය යුතු හිඟ නිවාස කුලී ආදායම රු.72,108,339ක් විය.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් ද කරනු ලැබේ.

i. 2022 දෙසැම්බර් 31 දිනට මැති ඇමතිවරුන් 74 දෙනෙකුගෙන් රු.4,590,791 ක හිඟ කුලී මුදලක් අයවිය යුතුව පැවතුන අතර එම ශේෂයන් තුළ 2015 වර්ෂයේ සිට පැවත එන රු.1,406,586ක් වූ ශේෂ 19ක්ද විය.

ii. සමුළු නිවාස ලබාදුන් 77 දෙනෙකුගෙන් සමුළු නිවාස 48කින් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කුලී මුදල රු.4,131,259ක් වූ අතර එයින් රු.2,468,657ක් වූ ශේෂ 45ක් 2012-2021 කාලපරිච්ඡේදයට අදාළව අයනොවී පවතින හිඟ ශේෂ විය. තවද ජයවඩනගම නිවාසවල 2012-2021 කාලපරිච්ඡේදය තුළ පදිංචිව සිටි 18 දෙනෙකුගෙන් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟකුලී එකතුව රු.8,897,555ක් අයකර ගෙන නොතිබුණි.

iii. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත වෙන්කර දී තිබූ බංගලා නිවාසයකින් 2012 වර්ෂයේ සිට අයවිය යුතු රු.36,042,000ක ශේෂයක් හා නිදන්ගත වකුගඩු රෝග වැළැක්වීමේ පර්යේෂණ ලේකම් කාර්යාලයට ලබා දී තිබූ නිවාසයකින් 2015-2020 කාලපරිච්ඡේදයට අදාළව අයවිය යුතු රු.14,798,387ක ශේෂයක් නිරවුල් කිරීමකින් තොරව දිගින් දිගටම පැවැතුණි.

Scanned with CamScanner

2.2 වියදම් කළමනාකරණය

(අ) E - ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය සඳහා සලසාගෙන තිබුණු රු.750,000,000ක ප්‍රතිපාදනවලින් රු.3,320,382ක් පමණක් වැයකර තිබීම හේතුවෙන් සියයට 99.6ක් හෙවත් රු.746,679,618ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. සැපයුම්කරු සමග ගිවිසුම්ගත වීමෙන් පසුව ප්‍රසම්පාදනය අත්හිටුවීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්, අමාත්‍ය මණ්ඩල සංදේශයන් යොමු කිරීම ප්‍රමාද වීම වැනි විවිධ අඩුපාඩු, 2017 වර්ෂයේ සිට සැලැසුම් කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීමට හේතු ලෙස ඉදිරිපත් කර තිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 05ක් සඳහා වෙනත් වැය විෂයන්ගෙන් මාරුකර තිබූ රු.45,237,900ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ද තවත් පුනරාවර්තන වැය විෂයන් 04ක් සඳහා මාරුකර තිබූ ප්‍රතිපාදනවලින් රු.7,045,846ක් හා මූලධන වැය විෂයයන් 03ක් සඳහා මාරුකර තිබූ එකතුව රු.181,723,000ක ප්‍රතිපාදනවලින් එකතුව රු.156,737,488ක් උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

2.3 බැරකම්වලට එළඹීම

(අ) මූල්‍ය ප්‍රකාශනවල සටහන් iiiට අනුව 2022 දෙසැම්බර් 31 දිනට බැරකම් ශේෂය රු.2,720,644,374ක් වුවද භාණ්ඩාගාර පරිගනක මුද්‍රිත අනුව එදිනට බැරකම් ශේෂය රු.2,713,281,897ක්ව පැවතීමෙන් රු.7,362,877ක වෙනසක් විය.

(ආ) පසුගිය වර්ෂයේ (2021) දෙසැම්බර් 31 දිනට බැරකම් යටතේ ගිණුම්ගත කර නොතිබුණු පිබිදෙමු පොළොන්නරුව වැඩසටහනෙහි පෙර වර්ෂවලට අදාළ වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.680,000,000ක් ගෙවා තිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

(අ) 2022 දෙසැම්බර් 31 දින ස්ථාන මාරුවී ගිය අමාත්‍යාංශ ලේකම් විසින් අමාත්‍යාංශයට අයත් Toyota Land Cruiser V8 දරන රථය රැගෙන ගොස් තිබුණද එම රථය විධිමත්ව ප්‍රවාහන අමාත්‍යාංශ වෙත පවරා දීමට හෝ ආපසු ලබා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ආ) කතරගම නිවාඩු නිකේතනයේ බිම් මහලේ වායු සමීකරණය නොකරන ලද කාමර 17ක් හා පොළොන්නරුව නිවාඩු නිකේතනයේ කාමර 03ක් විවිධ අඩුපාඩු හේතුවෙන් භාවිතා කළ නොහැකි තත්ත්වයට පත්ව තිබුණි.

(ඇ) කැප්පෙටිපොල මාවතේ සමුළු නිවාස කඩා ඉවත් කර නව නිවාස සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේදී රු. මිලියන 322ක් ලබාදී තිබුණද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර

Scanned with CamScanner

නොතිබුණි. තවද, 2008 වර්ෂයේ සිට මේ දක්වාම කඩා ඉවත්කිරීමට යෝජිත ලෙස නම් කර මේ වන විට වසර 15කට අධික කාලයක් ගතවී තිබුණු කැප්පෙටිපොල මාවතේ සමුළු නිවාස 11ක් 2009 වර්ෂයේ සිට මේ දක්වාම තාවකාලික පදනම මත ජනාධිපති ආරක්ෂක අංශ නිලධාරීන්ට ලබාදී තිබුණු අතර මෙම නිවාසවල පරිපාලනය අමාත්‍යාංශයේ පාලනයෙන් බැහැරව පැවතුණි.

(ඇ) නිලමැදුර ගොඩනැගිල්ල ඉදි කර ඇති ඉඩමේ තක්සේරු වටිනාකම රු.458,900,000ක් වශයෙන් ගිණුම්ගත කර තිබුණ නමුත්, ඉඩම අමාත්‍යාංශය වෙත පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

(ඉ) ස්වදේශ කටයුතු අංශය යටතේ පවතින සංචාරක බංගලා 35ක් හා ඊට අයත් ඉඩම් පවරා ගැනීම හා ඒවා තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

(ඊ) ස්වදේශ කටයුතු අංශය සතු වාහන 08ක් වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වෙත ලබාදී තිබුණද එකී වාහන අදාළ ආයතන වෙත විධිමත් ලෙස පවරා දීමට හෝ නැවත ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණු අතර වාහන 04ක් මේ වන විට භාවිතයේ නොතිබුණි.

2.5 අනාර්ථික ගනුදෙනු

2018 වර්ෂයට පෙර මිලදී ගෙන තිබුණු Epson L 800 වර්ගයේ ටෝනර් 63ක් කල් ඉකුත් වී භාවිතයට ගත නොහැකිව 2023 අප්‍රේල් 23 දින වන විටත් ස්වදේශ කටයුතු අංශයේ ප්‍රධාන ගබඩාවේ ගොඩගසා තිබුණි.

2.6 කළමනාකරණ දුර්වලතා

(අ) 2014 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව මාස 03ක් ඇතුළත ණය ශේෂය නිරවුල් කළයුතු වුවත්, ස්ථාන මාරු වී ගිය ස්වදේශ කටයුතු අංශයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 07ක වර්ෂයකට වඩා වැඩි කාලයක සිට අයනොවී පවතින රු.1,781,752ක් ශේෂ 09ක් විය.

(ආ) 2023 මැයි 25 දින වන විට අමාත්‍යාංශයේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අංශයේ මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.1,070,790ක් වූ ණය ශේෂ 08ක් තුළ වර්ෂ 05කට වඩා වැඩි කාලයක සිට නිරවුල් නොවී පවතින ශේෂය රු.224,187ක් විය. තවද, අමාත්‍යාංශයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අංශවල සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.2,921,830ක් වූ ණය ශේෂ 22ක් තුළ වර්ෂ

Scanned with CamScanner

05කට වැඩි කාලයක සිට අයනොවී පවතින එකතුව රු.1,051,518ක් වූ ණය ශේෂ 08ක් විය. එසේම, පළාත් සභා සහ පළාත් පාලන අංශයේ වැඩ තහනම් කළ නිලධාරියෙකුගෙන් වර්ෂ 05කට වඩා වැඩි කාලයක සිට අයනොවී පවතින රු.143,200ක් ණය ශේෂයක්ද විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 විදේශ ආධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය

(අ) යාපනයේ Incubator සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීමට මෘදුකාංග පද්ධතියක් සඳහා මූලධන වැය විෂයයක් යටතේ විදේශ ප්‍රදාන මගින් රු.200,000,000ක් ද, විදේශ මූල්‍යකරණ ආශ්‍රිත පිරිවැය යටතේ ලංකා රජය මගින් රු.40,000,000ක් ද වශයෙන් එකතුව රු.240,000,000ක් වූ ප්‍රතිපාදන සලසාගෙන තිබුණද එම කාර්යය ඉටුකර නොනිමීමෙන් සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) මහ කොළඹ ජලය සහ අපජලය කළමනාකරණ වැඩිදියුණු කිරීමේ වැඩසටහන අදියර 03 ක්‍රියාත්මක කිරීම සඳහා මූලධන වැය විෂයයක් යටතේ යුරෝපීය ආයෝජන බැංකු (යු.ආ.බැ.) ණය මගින් රු.600,000,000ක හා විදේශ මූල්‍යකරණ පිරිවැය යටතේ ලංකා රජය මගින් රු.50,000,000ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, කොන්ත්‍රාත් ප්‍රදානය කර නොනිමීම හේතුවෙන් සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබූ අතර යු.ආ.බැ. ණය යටතේ සලසාගත් ප්‍රතිපාදනයෙන් රු.477,700,000ක් වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි.

(ඇ) මහ කොළඹ ජලය සහ අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා වූ ආයෝජන වැඩසටහනෙහි 03 වන කොටස ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකු (ආ.ස.බැ.) ණය යටතේ සලසාගෙන තිබුණු රු.200,000,000ක ප්‍රතිපාදනවලින් සියයට 55ක් වූ රු.110,151,712ක් ද, මෙම වැඩසටහන තුළ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආ.ස.බැ. ණය යටතේ සලසාගෙන තිබුණු රු.1,000,000,000ක ප්‍රතිපාදනවලින් සියයට 58ක් වූ රු.576,429,501 ක් ද, විදේශ මූල්‍යකරණ ආශ්‍රිත පිරිවැය යටතේ ශ්‍රී ලංකා රජය මගින් සලසාගෙන තිබූ තවත් රු.200,000,000ක ප්‍රතිපාදනවලින් සියයට 07ක් වූ රු.157,358,855ක් ද, අරමුණුගත කාර්යය සඳහා උපයෝජනය නොකර එයින් රු.8,302,600ක් වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි. වැඩ කෙරෙමින් පැවැති කොන්ත්‍රාත්තුවල වැඩ අත්හිටුවීම හා ණය අරමුදලේ කාලය 2022 ඔක්තෝබර් මස අවසාන වීම හේතුවෙන් අදාල ඉදිකිරීම් නවතා දැමීම, ප්‍රතිපාදන ඉතිරිවීම්වලට කරුණු ලෙස දක්වා තිබුණි.

Scanned with CamScanner

(ඇ) ප්‍රාදේශීය සංවර්ධන සහාය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලෝක බැංකු ණය යටතේ රු.1,900,000,000ක් ද, ප්‍රදාන යටතේ රු.1,400,000,000ක් ද, විදේශ මූල්‍යකරණ ආශ්‍රිත පිරිවැය යටතේ ලංකා රජයෙන් රු.50,000,000ක් ද වශයෙන් ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, ලෝක බැංකු ප්‍රදාන යටතේ සලසාගෙන තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 56ක් හෙවත් රු.777,562,462ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විවිධ හේතු මත සුදුසු ලංසුකරුවකු ඉදිරිපත් නොවීම ඉතිරියට හේතු ලෙස දක්වා තිබුණි.

(ඉ) ග්‍රාමීය පාලම් ව්‍යාපෘතියෙහි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා නෙදර්ලන්ත රජයේ ණය යටතේ සලසාගෙන තිබුණු රු.300,000,000ක ප්‍රතිපාදනවලින් සියයට 69ක් වැයකර තිබුණද, විදේශ මූල්‍යකරණ ආශ්‍රිත පිරිවැය යටතේ ලංකා රජයෙන් සලසාගෙන තිබුණු රු.12,000,000ක ප්‍රතිපාදනවලින් සියයට 64ක්වූ රු.7,628,461ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. පාරිසරික හා සමාජීය අධ්‍යයන සඳහා හා සැලැසුම් නිර්මාණය කිරීම වෙනුවෙන් සහ ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයේ කටයුතු වෙනුවෙන් වියදම් දරා තිබුණද, පාලම් ආනයනය කිරීමට නොහැකි වීමෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණු බවට කරුණු දක්වා තිබුණි.

(ඊ) උතුරු පළාතේ කිරි කර්මාන්තය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ජයිකා ආයතනයේ ප්‍රදාන යටතේ රු.10,000,000ක හා පළාත් පාලනය ඉහළ නැංවීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන යටතේ රු.50,000,000ක ප්‍රතිපාදන සලසා තිබුණද, සමාලෝචිත වර්ෂයේදී එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

(උ) අපද්‍රව්‍යවලට වටිනාකමක් එකතු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජර්මානු රජයේ ප්‍රදාන යටතේ රු.270,000,000ක්ද, විදේශ මූල්‍යකරණ ආශ්‍රිත පිරිවැය යටතේ ලංකා රජයෙන් රු.5,000,000ක්ද වශයෙන් ප්‍රතිපාදන සලසාගෙන තිබුණද ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබීමෙන් සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

කේ.ආර්.ටී. මැණිකේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත: අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව.

Scanned with CamScanner

1. Priority to National Security.

2. Friendly, Non-aligned, Foreign Policy.

3. An Administration Free from Corruption.

4. New Constitu tion that Fulfills the People's Wishes.

5. Productive Citizenryand a Vibrant HumanResource.

6. People Centric Economic Development.

7. Technology Based Society.

8. Development of Physical Resources.

9. Sustainable Environmental Management.

10. Disciplined, Low Abiding and Values Based Society.





PREPARED BY : PLANNING DIVISION